# බුද්ධ ධර්මය

## 7 ශ්‍රේණිය



## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

ආගම් දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

**(2008 වර්ෂයේ සිට ක්‍රියාත්මකයි)**

**7 වන ශ්‍රේණිය**

ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

බුද්ධ ධර්මය - 7 වන ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

ප්‍රථම මුද්‍රණය : 2007

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ISBN 978 - 955 - 654 - 181 - 6**

"ආසියානු සංවර්ධන බැංකුවේ
ද්විතීය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
මගින් මුද්‍රණය කරන ලදී."

ආගම් දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
පානළුව, පාදුක්ක.

# පෙරවදන

නව සහශ්‍රයේ දී සිදුකළ පළමු විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ පවතින යම් යම් ගැටලු නිරාකරණය කර ගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකිය.මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ දුර්වලතා,සමාජයීය හා පුද්ගල දුර්වලතා මගහරවාලීමේ අභිලාෂයෙනි.

ආසියාවේ අධ්‍යාපන තත්වය සලකා බැලීමේ දී මෙයට වසර කීපයකට පෙර ශ්‍රී ලංකාව බොහෝ ඉදිරියෙන් සිටියේය.නමුදු ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටියි.මෙම පසුබෑමට හේතුව නව දැක්මකින් තොරව පවතින දෙය මත පමණක් ම තීරණ ගනිමින් ඒ දේ පමණක් ම නැවත නැවත ඉදිරිපත් කිරීමයි.

මෙහිදී මෙම තත්ත්වය මගහරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතු ව විෂයමාලාව සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂය මාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර දැනට දන්නා දේත් නව අදහස් හා ගවේෂණත් මගින් අනාගතය ගොඩනගා ගැනීම පිණිස නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවන ආකාරයෙනි.මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ගුරුවරයාගේ කාර්යභාරයෙහි පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි.දැනට පවතින ගුරු කේන්ද්‍රීය ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභියෝගවලට මුහුණදීමට සූදානම් විය යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුනට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත් සේ උපකාරී වනු ඇතැයි විශ්වාස කෙරේ. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි, දී ඇති මගපෙන්වීමට අනුගත වීම මගින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත.එය ඔබට ඉගැන්වීමේ දී මෙන් ම ශිෂ්‍යයින් ඇගයීමේ දී ත් උපකාරී වනු ඇත.ගවේෂණය හා ගුණාත්මක යෙදවුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශනය ශිෂ්‍යයාට උපකාරී වන ආකාරයෙන් ඉදිරිපත් කොට තිබේ. එය විදුහල්පතිවරුනට ද කාල සටහන් පිළියෙල කිරීමේ දී ත් සීමිත සම්පත් වෙන්කර දීමේ දී ත් අභ්‍යන්තර අධීක්ෂණයේ දී ත් මහත් ලෙස උපකාරී වනු නො අනුමානය.

කෙසේ නමුදු අපගේ බලාපොරොත්තුව වන්නේ මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින් ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීමය.මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසා ද, ප්‍රාදේශික ව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා බැවින් ද ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකි වනු ඇත.

අධ්‍යාපනඥයන්ට, ගුරු උපදේශකවරුන් මෙන්ම බාහිර අධීක්ෂණයෙහි හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරී වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගී වූ සියලූ දෙනාට ම මගේ කෘතඥතාව පිළිගන්වමි.

**මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ,**
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## සංඥාපනය

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත් කාලීන විය යුතුය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ මෙම විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයකට අදාළ විෂය මාතෘකා රාශියක්ද ඒ ඒ විෂය මාතෘකා වලට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි.විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයාගෙන් සිදු විය.මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහි විය.

නව විෂය මාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කරගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය ඇසුරින් බොහෝ විෂය කරුණු දන්නා බවින් ඔබ්බට ගිය , ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු, නිපුණතා පිරි සිසු පිරිසක් බිහි වීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශය භාවිත කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

මෙහි හමුවන ක්‍රියාකාරකම් සන්තතිය නම් කොටසේ දී නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්තිකාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාලය භාවිතය හා පොත්පත් කියවීම, පරිසරය නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ තම යහළු යෙහෙළියන්ට තමා දන්නා දේ කියාදීම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස්කර ගැනීම ආදී ගවේෂණාත්මක ව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතු ය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති පෙළපොත ද සම්පත් පොතක් ලෙස භාවිත කළ යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරදි කොට සංවිධානාත්මක ව හා අංග සම්පූර්ණ ව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් වූවක් විය යුතු ය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කැරෙන තත්ත්වයක් විය යුතු ය. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය සිසුන්ට බෙහෙවින් ආකාර්ෂණය වනු ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ පාඩම් තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මහ පෙන්වීමක් බව සිතන්න. මේ ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයෙකු ලෙස නව පාඩම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

නව පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විටම සිසුහු ක්‍රියාකාරීයහ. එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තවද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිට ම එම දුෂ්කරතා ඉවත්කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන් ව උදවු කිරීමට යොමු කරවන්න. මෙසේ පාඩමත් සමඟ කැරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් හොඳ ඉගෙනුමකට හේතු වේ.

තවද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම් දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස දරුවා උගත් දේ තව දුරටත් ශක්තිමත් කිරීමට සමත්වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එය සිසුන් ඇගයීමට ලක් කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කරවීම ගැන ද සැලකිලිමත් වන්න.

මෙමගින් නව ලොවට උචිත නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම, එයට ම ගැළපෙන ගුරු භූමිකාවක් හා පන්තිකාමරයේ නව ඉගෙනුම් සංස්කෘතියක් බිහිවීම අපේක්ෂා කරමි.

**විමල් සියඹලාගොඩ**

**සහකාර අධ්‍යක්ෂ ජනරාල්,**
**(භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ලේඛක මණ්ඩලය

| | | |
|---|---|---|
| මෙහෙයවීම | : | මහාචාර්ය ජේ.ඩබ්ලිව් වික්‍රමසිංහ මයා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| උපදේශනය හා<br>මග පෙන්වීම | : | විමල් සියඹලාගොඩ මයා<br>සහකාර අධ්‍යක්ෂ ජනරාල්<br>(භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| අධ්‍යක්ෂණය | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>අධ්‍යක්ෂ (ආගම්)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| ලේඛක මණ්ඩලය | : | • ශාස්ත්‍රපති පූජ්‍ය ගන්තුනේ අස්සජි හිමි.<br>(ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)<br><br>• අධ්‍යාපනපති උදය රුවන් මල්ලිකාරච්චි මයා<br>(ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක)<br><br>• ශාස්ත්‍රපති කේ.එම්. විජය ශ්‍රී ලක්නාත් මයා<br>(බිබිල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක)<br><br>• ශාස්ත්‍රවේදී (විශේෂ) ජිනදාස වීරසිංහ මයා<br>(බුත්තල අධ්‍යාපන කොට්ඨාසයේ ගුරු උපදේශක)<br><br>• ශාස්ත්‍රපති මනෝජ් අකලංක ගම්ලත් මයා<br>(බප/කො/ විජයබා මහා විද්‍යාලයේ ආචාර්ය) |
| සංස්කාරක | : | • ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>(අධ්‍යක්ෂ ආගම් - ජාතික අධ්‍යාපන ආයතනය) |

# පටුන

**පිටු අංකය**

7.1 විස්තරාත්මක විෂය නිර්දේශය

7.1.1 විෂය හැඳින්වීම 02

7.1.2 විෂයයේ අරමුණු 03

7.1.3 නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය, කාලය 04 - 05

7.2 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

7.2.1 හැඳින්වීම 07 - 09

7.2.2 පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් 10

7.2.3 ක්‍රියාකාරකම් සන්තතිය 11 - 81

7.3 තක්සේරුව හා ඇගයීම

7.3.1 හැඳින්වීම 83 - 84

7.3.2 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ 85 - 86

# 7. 1 . විෂය නිර්දේශය

## 7.1.1 විෂය හැඳින්වීම

ශ්‍රී සම්බුද්ධ ධර්මය සෘජුවම ජීවිතයට ප්‍රායෝගිකව එක් වූ විෂයයකි. ප්‍රායෝගිකත්වයෙන් තොර බුදුදහමක් කිසිසේත් ප්‍රයෝජනයක් නොමැති බව බුදුරදුන් දැඩි ලෙස අවධාරණය කර ඇත. ධර්මය ඇසීම, දැනුම ලබා ගැනීම සඳහා වූ සරල ම අවස්ථාව වේ. එතෙකින් නොනැවතී ධර්මය අනුව චින්තනය මෙහෙයවමින් ධර්මය ප්‍රත්‍යක්ෂයක් බවට පත්කර ගැනීම අත්‍යවශ්‍යය.

ආගම් විෂයයනට පාසල් කාල සටහනෙහි වෙන්ව ඇත්තේ සතියකට කාලච්ඡේද දෙකක් පමණි. ඒ කාලය තුළ බුදු දහම දරුවන් තුළ ප්‍රායෝගිකරණය කිරීම භාරදූර කාර්යයක් වී ඇත. බොහෝ පාසල්හි බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම සඳහා බුද්ධ ධර්ම විෂයය පුහුණු ගුරු භවතුන් නොමැත. ඉතා අපහසුවෙන් වෙනත් විෂය පුහුණු ගුරු භවතෙකුට විටෙක පැවරෙන බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම පූර්ණ දැනුමක් අත් කර ගැනීමට තරම්වත් සමත් වී නැත.

එබැවින් නව සහශ්‍රකයේ විෂයමාලා ප්‍රතිසංස්කරණය, ඉගෙනුම් # ඉගැන්වීම් ක්‍රමවේදයන්හි පර්යේෂණාත්මක වෙනස, ආගම් විෂයය විද්‍යාර්ථීන් තුළට ජීවිත ප්‍රත්‍යක්ෂයක් ' වීම සඳහා වූ ප්‍රායෝගික ක්‍රියාකාරකමක් බවට පත් කිරීමට ඉඩ ලැබීම වැදගත් පියවරක් ලෙස සඳහන් කරමි. විශාල දැනුම් සම්භාරයක් හිමිකර දිය යුතුය යන ආකල්පයෙන් මෙතෙක් මේ විෂයය දෙස අවධානය යොමු කළ භවතුනට මේ නව ක්‍රමවේදය පිළිබඳ මතුපිට පරීක්ෂාවක දී ස්වකීය අදහස සනාථ නොවන බවක් දැක්මෙන් යම් විවාදාත්මක බවක් මතු විය හැකිය.එහෙත් ගුරු පුහුණුව තුළ අදාළ ගුරු භවතුන්ට නොඅඩු විෂය දැනුමක් සහිතව සිසුන් මෙහෙයවිය යුතු ආකාරය පැහැදිළි කෙරේ.

ඒ අනුව බුද්ධ ධර්ම විෂයය ගවේෂණාත්මක ක්‍රියාකාරකමක් ලෙස පන්ති කාමරයට ප්‍රවේශවනු ඇත. සොයා යෑමේ සක්‍රීය ඉගෙනුමක් තුළ පෙරට වඩා ප්‍රත්‍යක්ෂකරණයක පෙරළියක් දරුවන් තුළ ගොඩ නැගී දහම අනුව දැහැමි වනු ඇතැයි අපේක්ෂිතය. සිසුන් තුළ සමබර පෞරුෂයක් ඇති කිරීමට බුද්ධ ධර්ම විෂය මෙහෙයවමින් එදිනෙදා ජීවිත අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි සිසු පරපුරක් බිහිකිරීමට ගවේෂණාත්මක ශක්තියක් ලබාදීම නව ක්‍රමවේදයෙහි සමාරම්භක අවස්ථාව වේ. ස්ව අධ්‍යාත්මික සංවර්ධන ඇතිකරමින් මෙන්ම සාමූහිකව කටයුතු කිරීමට හුරු කරමින් අධ්‍යාපනයෙහි සියලු අරමුණු සාක්ෂාත් කර ගැනීමට බුද්ධ චරිතය, බුද්ධ ධර්මය, ශාසන ඉතිහාසය, ආදී ක්ෂේත්‍ර තුළින් මතුකර ගත් නිපුණතා සංඛ්‍යාත්මක වශයෙන් ප්‍රමාණකර ඒ ඒ ශ්‍රේණීන් වෙත යොමු කර ඇත.සවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා එකම නිපුණතාවක් සාධනය කර ගැනීමට ඒ ඒ ශ්‍රේණිවලදී අදාළ නිපුණතාවයෙහි නිපුණතා මට්ටම් හඳුන්වා දී ඇත. නිපුණතා මට්ටම සාධනය කර ගැනීම සඳහා වූ ක්‍රියාකාරකමක් සාමූහිකව ගවේෂණය කිරීමට යොමුවන ගුරු ශිෂ්‍ය දෙපිරිසම පන්ති කාමරයේ දී සක්‍රීයව සහභාගිවෙමින් ධර්ම ප්‍රත්‍යක්ෂකරණයෙහි යම් සුභදායක නව ප්‍රවේශයක් ලබා ගනු ඇතැයි බුද්ධ ධර්ම විෂය තුළින් අපේක්ෂා කර සිටී.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

### 7.1.2 විෂයයේ අරමුණු.

- බුදු දහමෙහි මූලික ඉගැන්වීම් අධ්‍යයනය කොට ලෝකය සහ ජීවිතය හඳුනා ගනිමින් අභියෝග ජයග්‍රහණය කිරීමට හැකි දරු පරපුරක් බිහි කර ගැනීම.

- බෝසත් චරිතය,බුද්ධ චරිතය සහ ආදර්ශවත් චරිත කථා ඇසුරු කිරීම තුළින් බෞද්ධ පෞරුෂය ගොඩනගා ගැනීමට හුරු කර ගැනීම.

- ශාසන ඉතිහාසය සහ ශ්‍රී ලාංකික උරුමය හැඳින එමගින් නූතන වගකීම් ඉටුකිරීමට හැකි අභිමාන පූර්වක ශ්‍රී ලාංකික බාල පරපුරක් ගොඩනගා ගැනීම.

- බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂී අංග අධ්‍යයනය කරමින් බෞද්ධ අනන්‍යතාව සහ සහජීවනයෙන් ක්‍රියා කිරීමේ අනවරත හුරුවක් චරිතායනය කර ගැනීම.

## 7.1.3 නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය සහ කාලය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | නිපුණතාවට අදාළ කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 01. බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ක්‍රියා කරයි. | 1.1 ජීවිතය හා සම්බන්ධ සියල්ලම සිදුවන්නේ පූර්ව කර්මයෙන් නොවන බව පිළිගෙන ක්‍රියා කරයි. | - නියාම ධර්ම | |
| | 1.2 චතුරාර්ය සත්‍යය යනු කුමක්දැයි හඳුනා ගනිමින් ධර්මය කෙරෙහි පැහැදීමෙන් කටයුතු කරයි. | - චතුරාර්ය සත්‍යය පිළිබඳ මූලික හැඳින්වීම. | හතරයි |
| 02. තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි. | 2.1 බුදු සිරිතේ ආරම්භක වකවානුවේ ප්‍රධාන සිද්ධි අධ්‍යයනය කර ආදර්ශ ලබා ගනියි. | - ප්‍රථම ධර්ම දේශනාවේ සිට කිඹුල්වත්පුර ගමනතෙක් බුදු සිරිත | |
| | 2.2 බුදුරදුන් අසරණයන්ට හා ගිලනුන්ට පිහිට වූ ආකාරය අගය කරමින් චරිතායනය කරයි. | - අසරණයන්ට පිහිටවීම ගිලනුන්ට උපස්ථාන කිරීම | |
| | 2.3 ධර්ම රත්නයේ ගුණ හැඳිනගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි. | - ස්වාක්ඛාතො පාඨයෙහි ඇතුළත් දහම් ගුණ (සරල හැඳින්වීමක්) | හයයි |
| 03. ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි. | 3.1 බෞද්ධ සිරිත් විරිත් අර්ථවත්ව අනුගමනය කරයි. | - බෞද්ධ සිරිත් විරිත් පිළිබඳ හැඳින්වීමක් | |
| | 3.2 භාවනාවේ ප්‍රායෝගික වටිනාකම හැඳිනගෙන දෛනිකව භාවනා කරයි. | - මෛත්‍රී භාවනාව (කරණීයමෙත්ත සූත්‍රය ඇසුරෙන්) | |
| | 3.3 තම චරිතය හැඩගසා ගැනීමට ශ්‍රාවිකා චරිත ආදර්ශයට ගනියි. | - විශාඛා මහෝපාසිකාව | |
| | 3.4 ධම්මපද ගාථා ඇසුරෙන් තම ජීවන දර්ශනය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි. | - “උට්ඨානවතෝ සතිමතෝ” ගාථාව | අටයි |
| 04. බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 4.1 සදාචාර සමාජයක් සඳහා පංචශීල ප්‍රතිපත්තිය උපයෝග වන බව පිළිගෙන ඒ අනුව ක්‍රියා කරයි. | - පංචශීල ප්‍රතිපත්තියෙහි සාමාජික අගය | |
| | 4.2 පන්සිල් පාදක කොටගෙන තම ආධ්‍යාත්මික සංවර්ධනය ඇතිකර ගනියි. | - පන්සිල්<br>• විරමන ලක්ෂණය<br>• සමාදාන ලක්ෂණය | |
| | 4.3 බෞද්ධ සමාජ ධර්ම වලට අනුගත වෙමින් ගුරු සිසු සබඳතා ගොඩනගා ගනියි. | - සිගාලෝවාද සූත්‍රයේ එන ගුරු ශිෂ්‍ය අන්‍යෝන්‍ය යුතුකම් | හයයි |
| 05. ජීවී අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි. | 5.1 තමා උපමාවට ගනිමින් ජීව හිතවාදී ආකල්ප ගොඩනගා ගනියි. | - අත්තූපනායික ධර්ම පරියාය (වේළුද්වාර සූත්‍රය නිදාන කථාව සහිතව) | |
| | 5.2 මානව සබඳතා පවත්වා ගැනීමට ස්ථානෝචිතව හා අවස්ථාවෝචිතව ක්‍රියා කරයි. | - කතාබහ සහ හැසිරීම<br>• පාසල් පරිශ්‍රය<br>• පන්සල | |
| | 5.3 පරිසර අලංකරණයෙහි යෙදෙමින් ස්වභාව සෞන්දර්යය ආශ්වාදනය කරයි. | - මල් වැවීම හා මල් ගස්වලට සාත්තු කිරීම | හයයි |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| 06. බෞද්ධ ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික උරුමය හැඳිනගෙන එය රැක ගැනීමට ක්‍රියා කරයි. | 6.1 ශාසනය සුරක්ෂිත කිරීම සඳහා පළමු සංගායනාවෙන් ගැණුනු පියවර අධ්‍යයනය කර අගය කරයි. | - පළමු ධර්ම සංගායනාව | |
| | 6.2 මහින්දාගමනයේ ශ්‍රී ලාංකික දායාද හැඳිනගෙන ඒවා ශාසනික හා සංස්කෘතික වශයෙන් ඇගයීමට ලක් කරමින් සංරක්ෂණයෙහි යෙදෙයි. | - මහින්දාගමනයේ ශ්‍රී ලාංකික දායාද<br>• බුදු දහම<br>• භික්ෂු භික්ෂුණී පැවිද්ද<br>• කලා ශිල්ප<br>• සහිත්‍යය (මේවා පිළිබඳ සරල හැඳින්වීමක්) | හතරයි |
| 07. ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාවය සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි. | 7.1 බුදු දහම ඇසුරින් පෝෂණය වූ ශ්‍රී ලාංකික සමාජ ධර්ම රැක ගැනීමට ක්‍රියා කරයි. | - බුදු දහම ඇසුරින් පෝෂණය වූ ශ්‍රී ලාංකික ජන සංස්කෘතියේ සුවිශේෂ ලක්ෂණ<br>• කෘත ගුණ දැක්වීම.<br>• ආගන්තුක සත්කාරය<br>• වැඩිහිටියන්ට සැලකීම<br>• අග්‍ර ශෂ්‍ය දානය | |
| | 7.2 බෞද්ධ ඉගැන්වීම් ශ්‍රී ලාංකික ජන සමාජයේ සහජීවනයට පදනම් වූ බවට කරුණු දක්වයි. | - ශ්‍රී ලාංකික ජන සමාජයේ සහජීවනයට පදනම් වූ බෞද්ධ ඉගැන්වීම්<br>• සහජීවන සංකල්පය<br>• අවිහිංසාව<br>• සමානාත්මතාව<br>• අන්‍යමත ඉවසීම | හතරයි |
| 08. බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 8.1 ධන පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරයි. | - පරිහරණය සහ නඩත්තුව<br>• සමජීවිකතාව<br>• දිරාගිය දේ අලුත්වැඩියාව<br>• පූජාවක් ලෙස ලැබෙන චීවරයෙන් උපරිම ප්‍රයෝජන ගන්නා අයුරු<br>• පොදු දේපළ පරිහරණය (සාංඝික දේපොළ පරිහරණ රටාව) | |
| | 8.2 සම්පත් විනාශයට හේතු හැඳිනගෙන ඒවායින් වැලකීමට ක්‍රියා කරයි. | - සම්පත් විනාශයට හේතු (සිගාලෝවාද, ව්‍යග්ඝපජ්ජ සූත්‍ර ඇසුරෙන්) | හතරයි |
| 09. සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩ නඟා ගනියි. | 9.1 නායකයකුගේ වගකීම තේරුම්ගෙන ඒ අනුව තම පෞරුෂය ගොඩනඟා ගනියි. | - වගකීම (නලපාන ජාතකය) | |
| | 9.2 ඉවසා දරා ගැනීමේ ශක්තියෙන් යුතුව ලෝක ස්වභාවයට මුහුණ දෙයි. | - ඉවසීම<br>• ශීත උෂ්ණ දිනුම් පැරදුම් ඇනුම් බැණුම් අපහාස ඉවසීම.<br>• දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දීම (ඛන්ති පරමං තපෝ සංකල්පය) | හතරයි |
| 10. නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | 10.1 නිවැරදි දැක්මකින් හා මනා හැඟීමකින් යුතුව පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙයි. | - පුණ්‍ය ක්‍රියා (කාව්‍යශේඛරය) | දෙකයි |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 7.2 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## 7.2.1 හැඳින්වීම

බුදු දහමෙහි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද, ශාස්තෘ වූ බුදුරදුන් ජීවමානව වැඩ සිටියදීම විවිධාකාරයෙන් භාවිත කොට නිශ්චිත ප්‍රතිඵල විධිමත්ව ලබාගත් අයුරු පැහැදිළිව දක්නට ඇත. මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දි ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසකින් යුත් කැපවීමක් අපේක්ෂා කෙරේ.එමෙන්ම ඉගෙනුම්ලාභීන් ද ප්‍රබෝධාත්මකව සක්‍රීයවන අතර අධිකාරී මෙහෙයවීමකින් තොරව ශිෂ්‍ය කේන්ද්‍රීයත්වයට නිසැකවම පත්වනු ඇත.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව හා පසු කාලීන ව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත් එය සිදු විය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරුභූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජීක සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමග ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු-සිසු අන්තර් ක්‍රියා ද පසු ව ඇති වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයෙකුගේ තත්ත්වයට ගුරුවරයා පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්තිකාමරයෙන් බැහැරට ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මඟින් හඳුන්වා දෙනු ලබන විස්තරාත්මක විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමු වන පියවර මඟින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර හෙවත් ප්‍රවේශය වශයෙන් හඳුන්වමු. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමඟ දෙබසකට මුල පුරයි. පසු ව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත් . ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතු ව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම / පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් වැනි උත්තේජක යොදා ගැනීම / ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය / දෙබස්, භූමිකා රංගන, කවි, ගීත,ගාථා ආදර්ශන සෘජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීමට ප්‍රවේශයක් ලබාගැනීම සඳහා පළමු පියවර ක්‍රියාත්මක විය යුතුය.

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම.

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය සඳහා සිසුනට අවස්ථාව ලබා දීමටය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කර ගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පන්ති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදවු වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුනට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී කණ්ඩායම් ප්‍රමාණය ගුරුවරයා විසින් තීරණය කළද එම ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිරිනැමීම පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුනු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකමේ තුන්වන පියවරේ දී සෑම කුඩා කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දි ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම් සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායකය. සිසු අනාවරණ පැහැදිලි කිරීම හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්තිකාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයාගැනීම් වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට සෙසු කණ්ඩායම්වල සිසුන් ද යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනයෙහි වගකීම ගුරුවරයාටය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වනසේත් සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුකරණය හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම්ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ දෙවන පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම් හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් ගුරුවරයාට ඉඩ තිබේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් වන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

බුද්ධ ධර්මය විෂයය තුළ දහම අධ්‍යාත්මීකරණය කොට දැහැමි ක්‍රියාකාරකම් සන්තතියක් සමස්ත ජීවිත උරුමයක් සේ උත්පාදනය කිරීම සඳහා මෙම නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය වඩාත් ඉවහල්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බුදුරදුන් විසින් රාහුල හිමියන්, චුල්ලපන්ථක හිමියන් හා, කිසාගෝතමිය වෙත සදහම් ප්‍රත්‍යක්ෂය සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙයින් වසර දෙදහස් පන්සිය පනහකට පෙර ද භාවිතා කර ඇති අතර අරමුණ සාධනය සඳහා දේශන ආදී ක්‍රමවේදයන් ද උචිත අයුරින් යොදාගෙන ඇති බවද අමතක කළ නොහැක.මෙහි දැක්වෙන ඉගනුම් ඉගැන්වීම් ක්‍රමවේදය තුළ සියල්ල අන්තර්ගතව තිබේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.2.2 පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්

බුද්ධ ධර්ම විෂයය පාසලෙහි ඉගැන්වීමේ දී බුදු දහමේ සමස්ත අර්ථ ක්‍රියාකාරිත්වය අමතක නොකොට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. පුද්ගල චරිත සංවර්ධනයත්, සමාජ සුසංයමයත් ගොඩ නැගෙන පරමාදර්ශී ඒකකය ලෙස බුද්ධ ධර්ම විෂය භාර ගරු භවතුන් ක්‍රියා කළ යුතු වන අතර පාසල තුළ දැහැමි බව අගයන නිරන්තර පැවැත්මක් සනාථ විය යුතුය. බෞද්ධ සංකේතයක් ලෙස බුදු මැදුරක් හෝ බුද්ධ ප්‍රතිමාවක් හෝ තිබීම මැනවැයි යෝජනා කරන අතරම බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම සඳහා විෂය පන්ති කාමරයක් වෙන්ව තිබීම තුළින් වඩාත් ඉහළ ආයෝජනයක් කරගත හැකිය.පන්ති කාමරයෙන් බැහැරව විෂය සමගාමී වූ බෞද්ධාගමික ක්‍රියාකාරකම් සැබෑ හැගීමකින් ඉටු කැරෙන නායකත්ව ආදර්ශයක් පාසල තුළ නිර්මාණය විය යුතුය. උදාහරණයක් ලෙස බෞද්ධ ආගමික වතාවත් කරන අවස්ථාවක එහි ප්‍රධානියා ලෙස සැදැහැවත් අයෙකු පෙනී සිට නිවැරදි ඉරියව් පවත්වමින් සැමට ආදර්ශයක් සැපයිය යුතුය.

පාසලෙහි දෛනික ආරම්භය විවේකයෙන් පසු කාලච්ඡේදයේ ආරම්භය සහ දෛනික කටයුතු අවසන් අවස්ථාවන්ට ආගමික ක්‍රියාකාරකම් යොදා ගැනීමත්. මාසිකව, වාර්ෂිකව විශේෂ බෞද්ධ ආගමික ක්‍රියාකාරකම් ළමුන්ට මූලිකත්වය දෙමින් සැලසුම් කිරීමත් අවශ්‍ය ය.

- අධ්‍යාපන චාරිකා
- පර්යේෂණ ව්‍යාපෘති
- දැනුම මිනුම, චිත්‍ර ප්‍රදර්ශන
- බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන
- ධර්ම දේශනා, භාවනා වැඩමුලු, පිරිත් පිංකම් , දාන පිරිනැමීම් ආදිය උදාහරණ ලෙස දැක්විය හැකිය.

මේ සියලු ක්‍රියාකාරකම් තුළින් මානව වර්ගයා වෙත පමණක් නොව සමස්ත විශ්වය වෙතම සිද්ධකරනු ලබන අර්ථයක්, යහපතක් සහිත ඉගෙනුම්ලාභීන් පිරිසක් බිහි කිරීම අපේක්ෂා කෙරේ. ඒ අනුව සැලසුම් සකස් කිරීම විශිෂ්ට ලෙස බුද්ධ ධර්ම විෂය පාසල තුළ ආයෝජනය කිරීමක් වනු ඇත.

# ආදර්ශ ක්‍රියාකාරකම් සන්තතිය

**නිපුණතාව 01** : බුදුදහමට අනුව ජීවිතය සහ ලෝකය හැඳිනගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ජීවිතය හා සම්බන්ධ සියල්ලම සිදුවන්නේ පූර්ව කර්මයෙන් නොවන බව පිළිගෙන ක්‍රියා කරයි.

**ක්‍රියාකාරකම 1.1** : සියල්ලම පෙර කර්මයට භාර නොදෙමු.

**කාලය** : මිනිත්තු 80 යි

**ගුණාත්මක යෙදවුම්** :

- මහගමසේකරයන්ගේ " සිනිඳු සුදුමුදු තලාවේ "…. යන ගීතය ලියූ පුවරුවක් (ඇමුණුම 1.1.2)
- නියාම ධර්ම විස්තර කැරෙන ලේඛනයක ඡායා පිටපත් දෙකක්
- බුද්ධ ධර්මය 7 ශ්‍රේණිය පාඨ ග්‍රන්ථය
- ඩිමයි කඩදාසි සහ මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 1.1.1:**

- ඇමුණුම 1.1.2 වශයෙන් ඇති ගීතය ලියූ පුවරුව පන්තියට ඉදිරිපත් කරන්න.
- එම ගීතය සිසුන් ලවා ගායනා කරවන්න.
- ගීතයෙන් කියැවෙන කාරණය ගැන සිසුන් විමසන්න
- පහත සඳහන් කරුණුද ඇතුළත් වනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - මෙම ගීත බණ්ඩයෙන් මුහුදේ පියකරු සහ බියකරු අවස්ථා දැක්වෙන බව.
> - එබඳු අවස්ථා අපට ද අත්දැකිය හැකි බව.
> - ඒවා ස්වභාව ධර්මය තුළ සිදුවන බව.
> - එබඳු දේ සහ අපගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ බුදු දහමේ ඉගැන්වෙන නියාම ධර්ම සංකල්පය ගැන අවධානය යොමු කිරීම සුදුසු බව.

**පියවර 1.1.2** :

- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදා ඒ දෙකට සීල සහ පඤ්ඤා යන නම් තබන්න.
- ගවේෂණ උපදෙස් පත්‍රිකාව සමඟ ඩිමයි කඩදාසි සහ මාකර් පෑන් සිසුන්ට ලබා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**පියවර 1.1.3** :

- කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය කිරීමේ පළමු අවස්ථාව එම කණ්ඩායමටම ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා ඇත්දැයි විමසන්න.
- පහත එන කරුණු ද අන්තර්ගත වන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - ජීවිතය හා සම්බන්ධ සියල්ල ම පූර්ව කර්ම විපාක ලෙස බුදු දහමේ සඳහන් නොවන බව.
> - උතුනියාම, බීජ නියාම, කම්ම නියාම, ධම්ම නියාම, චිත්ත නියාම නමින් නියාම ධර්ම පහක් ඇති බව.
> - උතු නියාමය නම් ඒ ඒ ඍතුන්හි ඇතිවන කාලගුණ වෙනස්වීම වන අතර ඒවා නිසා සිදුවන විපත් ආදිය කර්ම විපාක ලෙස සැලකිය නොහැකි බව.
> - බීජ වර්ගය අනුව එම වර්ගයේ ම පැළයක් හටගැනීම බීජ නියාමය වන අතර මව්පිය හැඩහුරුව ද බීජ නියාමය අනුව දරුවකුට ලැබිය හැකි බව.
> - කර්මයට අනුරූප විපාක දීම බාහිර පුද්ගලයකුගේ මෙහෙයවීමකින් තොරව සිදුවීමාදිය කර්ම නියාමය ලෙස සැලකෙන බව.
> - පුද්ගලයන්ගේ වයස්ගතවීම, ඇහ රැලි වැටීම ආදිය ධම්ම නියාමයට අනුව සිදුවන බව.
> - එක් ක්ෂණයක සිත් දෙකක් ඇති නොවීම, ලෝභාදිය මිශ්‍ර වූ විට ඊට අනුරූපවත්, අලෝභාදිය මිශ්‍ර වූ විට ඊට අනුරූපවත් ක්‍රියා කිරීම ඉන්ද්‍රිය, අරමුණු ,ප්‍රතිබද්ධව සිතුවිලි පහළ වීම ආදිය චිත්ත නියාමය බව.

## තක්සේරු සහ ඇගයීම් නිර්ණායක

- නියාම ධර්ම පහ වෙන වෙනම හඳුන්වයි.
- සියල්ල ම සිදුවන්නේ පූර්ව කර්මානුරූපව නොවන බව පිළිගනියි.
- පුද්ගල ජීවිතය කෙරෙහි කර්මය ද බලපාන බවට නිදසුන් දක්වයි.
- ලෝකයේ සිදුවීම් දෙස විමර්ශනශීලීව බලයි.
- ජීවන ගැටලු වලට අධිෂ්ඨානයෙන් යුක්තව මුහුණ දෙයි.

ඇමුණුම 1.1.1

## කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- පාඨ ග්‍රන්ථයේ අදාළ පාඩම කණ්ඩායමේ සියලු දෙනා එක්ව අවධානයෙන් යුතුව කියවන්න.
- ඔබේ කණ්ඩායමට ලැබෙන මාතෘකාවට අදාළ කරුණු ඇතුළත් කොටස් එම පාඩමෙන් තෝරා ගන්න.
- එම කොටස් නැවත නැවත කියවමින් අදාළ කරුණු සටහන් කර ගන්න.
- සටහන් කරගත් කරුණු සහ ගැටලු ඇතොත් ඒවාද ඇතුළත් වනසේ කණ්ඩායම් වාර්තාවක් පිළියෙල කරන්න.

**සීල කණ්ඩායම**

උතුනියාමය සහ බීජ නියාමය නිදසුන් සහිතව වෙන වෙනම හඳුන්වා දෙන්න.

**පඤ්ඤා කණ්ඩායම**

කම්ම නියාම, ධම්ම නියාම, චිත්ත නියාම පිළිබඳ වෙන වෙනම හැඳින්වීම් ලියන්න.

ඇමුණුම 1.1.2

### සිනිඳු සුදුමුදු තලාවේ

සිනිඳු සුදු මුදු තලාවේ
පිපෙන පෙණපිඬු සිනාසේ
සැලෙන රළමත ගිලී ඉපිලී
ගලන සිතිවිලි මුලාවේ

ගැඹුරු සත් සමුදුර පතුළ බිඳ
ඇඹරී ඇඹරී වියරු දළ රළ
තුමුළ මහමෙර දෙදරවයි
බුර බුරා නැගි කුරිරු ජලකඳ
දෙරණ සම්පත ගිල ගනියි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 01** : බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 1.2** : චතුරාර්ය සත්‍යය යනු කුමක්දැයි හඳුනා ගනිමින් ධර්මය කෙරෙහි පැහැදීමෙන් කටයුතු කරයි.

**ක්‍රියාකාරකම 1.2** : සිව්සස් හැඳින දිවිමග ගෙවමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 1.2.1ට ඇතුළත් බුදුගුණාලංකාර කෘතියෙහි " සිව්සස් සිය නැණින් " යන පද්‍යය ලියූ පුවරුවක්
- ඇමුණුම 1.2.2ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්
- ඇමුණුම 1.2.3 ට ඇතුළත් උද්ධෘත ලේඛනයෙහි පිටපත් දෙකක්
- ඩිමයි කඩදාසි සහ මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 1.2.1** :

- බුදුගුණාලංකාර පද්‍යය ලියූ පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම පද්‍යය සිසුන් ලවා ගායනා කරවන්න.
- එම පද්‍යයේ සිවුසස් යන්නට සිසුන්ගේ විශේෂ අවධානය යොමුකරවන්න
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - සත්‍ය සතරක් පිළිබඳ බුදු දහමෙහි ඉගැන්වෙන බව.
> - එම සත්‍ය සතර ආර්ය සත්‍ය නමින් හැඳින්වෙන බව.
> - ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ සහ සච්ච විභංග සූත්‍රයේ එම සත්‍ය සතර පිළිබඳ විස්තර කැරෙන බව.

**පියවර 1.2.2** :

- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ගවේෂණ උපදෙස් පත්‍රිකා, ඩිමයි කඩදාසි සහ මාකර් පෑන් කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 1.2.3** :

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව දෙන්න.
- අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- දුක්ඛාර්ය සත්‍යය, දුක්ඛ සමුදයාර්ය සත්‍යය, දුක්ඛ නිරෝධාර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාර්ය සත්‍යය යනුවෙන් චතුරාර්ය සත්‍යය නම් කැරෙන බව.

- චතුරාර්ය සත්‍යය නම් කැරෙන නිවැරදි ම ක්‍රමය ඉහත සඳහන් පරිදි බව.
- කෙටියෙන් දක්වන විට දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යනුවෙනුත් දුක්ඛ සත්‍යය සමුදය සත්‍යය නිරෝධ සත්‍යය මාර්ග සත්‍යය යනුවෙනුත් හැඳින්වෙන බව.

- ඒවා සරලව දුක, දුකට හේතුව, දුක නැතිවීම, දුක නැතිවීමේ මාර්ගය යනුවෙනුත් හැඳින්වෙන බව.
- ආර්ය වූ බුදුරජාණන් වහන්සේ සොයාගත් සත්‍ය නිසාත් උතුම් වූ සත්‍ය නිසාත් මේවා ආර්ය සත්‍ය නමින් හැඳින්වෙන බව.
- හේතුඵල ක්‍රමයට සත්‍ය සතර දක්වා ඇති බැවින් පවතින තත්ත්වය, එයට හේතුව, පවතින තත්ත්වයෙන් මිදීම, ඒ සඳහා අනුගමනය කළයුතු පිළිවෙත පැහැදිලි කැරෙන බව.
- චතුරාර්ය සත්‍යය ඉදිරිපත් කිරීමට යොදාගත් මෙම හේතුඵල න්‍යාය ද ගැටලු විසඳා ගැනීම පිණිස එදිනෙදා ජීවිතයේදී භාවිත කළ හැකි බව.

**තක්සේරු සහ ඇගයීම් නිර්ණායක**

- බුදුරදුන් දෙසූ සත්‍ය සතර ආර්ය සත්‍ය නාමයෙන් හැඳින්වීමට හේතු පැහැදිලි කරයි.
- චතුරාර්ය සත්‍ය පිළිබඳ හැදෑරීම එදිනෙදා ජීවිතය ද ඵලදායක කර ගැනීමට උපකාරී වන බව පිළිගනියි.
- චතුරාර්ය සත්‍ය නිවැරදිවත් අනුපිළිවෙළිනුත් ලියා දක්වයි.
- ගැටලුවක් මතු වූ විට ඊට පදනම් වූ හේතු සොයා බැලීම පුරුද්දක් කර ගනියි.
- ඉවසීමෙන් යුතුව ඵලඹෙන තත්ත්වයන්ට මුහුණ දෙයි.

ඇමුණුම 1.2.1

සිව්සස් සිය නැණින්
දැන දැන්වීය කුළුණින්
දුරලයි අනුවණින්
එබුදු නම් වීය ගුණ පමණින්

(බුදුගුණාලංකාරය)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 1.2.2

## කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්.

ඔබට ලැබෙන උද්ධෘත ලේඛනය අවධානයෙන් කියවන්න.
පහත සඳහන් ප්‍රශ්න වලින් ඔබට ලබාදෙන ප්‍රශ්න වලට පිළිතුරු ගවේෂණය කරන්න.

1. චතුරාර්ය සත්‍යය නම් කැරෙන නිවැරදි ම ක්‍රමය කුමක්ද?
2. චතුරාර්ය සත්‍යය ආර්ය සත්‍ය නමින් හැඳින්වීමට හේතු මොනවාදැයි සොයා බලන්න.
3. චතුරාර්ය සත්‍යය ඉදිරිපත් කර ඇති පිළිවෙළේ දක්නට ලැබෙන හේතුඵල රටාව කුමක්ද ?
4. චතුරාර්ය සත්‍යයේ එන හේතුඵල රටාව ගැටලු නිරාකරණයට යොදාගත හැකිදැයි සොයා බලන්න.

ඔබේ අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.2.3

## චතුරාර්ය සත්‍යය

චතුරාර්ය සත්‍යය බුදු දහමේ මූලික ඉගැන්වීම් වලින් එකකි. එය ඇතැම් තැනක හඳුන්වනු ලැබ ඇත්තේ " සාමුක්කංසික දේශනා " යන නමිනි. මෙම ඉගැන්වීම කොතරම් වැදගත් ද කිවහොත් එය බුදු දහමේ හදවත ලෙස ඇතැම් උගතුන් විසින් හඳුන්වනු ලැබ ඇත. සත්වයා දිගින් දිගට ඉපදෙමින් මැරෙමින් සසර සැරිසරන්නේ මෙම ධර්මය අවබෝධ නොවීම නිසාය. වරක් බුදුරජාණන් වහන්සේ " මහණෙනි ! චතුරාර්ය සත්‍යය අවබෝධ නොවීම නිසා ඔබටත් මටත් දිගු කලක් සසර සැරිසැරීමට සිදුවිය". යනුවෙන් භික්ෂූන් වහන්සේට දේශනා කර ඇත. මෙම ධර්මය අවබෝධ වී රහත් වීමෙන් ආර්ය භාවයට පත්වූ පසු ව සසර ගමන නවතී. මරණින් පසු නැවත ඉපදීමක් නොවේ. මෙහි අවබෝධය යන්නෙන් අදහස් වන්නේ කියවීම, ඇසීම ආදියෙන් චතුරාර්ය සත්‍යය පිළිබඳ දැනුම පමණක් ලබා ගැනීම නොවන බව තේරුම් ගත යුතුය.

චතුරාර්ය සත්‍යය යන්නෙහි තේරුම උතුම් ඇත්ත හතර යන්නයි. චතුර් යනු හතර යි. ආර්ය යන්නෙන් ශ්‍රේෂ්ඨ , උතුම් යන අර්ථය ගැනේ. සත්‍යය නම් ඇත්තයි. ඒ අනුව චතුරාර්ය සත්‍යය යන්නෙහි තේරුම ශ්‍රේෂ්ඨ වූ උතුම් වූ ඇත්ත හතර යන්නයි. එම ඇත්ත හතර පාලි ධර්ම ග්‍රන්ථයන්හි සඳහන් වන්නේ මෙසේ යි.

- දුක්ඛං අරිය සච්චං
- දුක්ඛ සමුදයං අරිය සච්චං
- දුක්ඛ නිරෝධං අරිය සච්චං
- දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා අරිය සච්චං

මෙම යෙදීම අනුව දැනට පවතින හත්වැනි ශ්‍රේණියේ දහම් පාසල් පොතෙහි චතුරාර්ය සත්‍යය

- දුක්ඛ අරිය සච්ච
- දුක්ඛ සමුදය අරිය සච්ච
- දුක්ඛ නිරෝධ අරිය සච්ච
- දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා අරිය සච්ච

යනුවෙන් සඳහන් කර ඇත. වර්තමානයේ ලියැවෙන සිංහල ධර්ම ග්‍රන්ථයන්හි විවිධ ස්වරූපයෙන් මෙම සත්‍ය සතර දැක්වෙන අයුරු පහත සඳහන් සටහනින් දැකගත හැකිය.

| | | | |
|---|---|---|---|
| දුක්ඛ සත්‍යය | දුක්ඛාර්ය සත්‍යය | දුක්ඛ | දුක |
| සමුදය සත්‍යය | සමුදයාර්ය සත්‍යය | සමුදය | දුකට හේතුව |
| නිරෝධ සත්‍යය | නිරෝධාර්ය සත්‍යය | නිරෝධ | දුක නැති කිරීම |
| මාර්ග සත්‍යය | මාර්ගාර්ය සත්‍යය | මග්ග | දුක නැති කිරීමේ මාර්ගය |

සාමාන්‍යයෙන් මෙසේ සඳහන් කැරෙන නමුත් මේ කොටු සතරින් එකකවත් අංග සම්පූර්ණ ලෙස චතුරාර්ය සත්‍යය සටහන් වී නැත. වඩාත් නිවැරැදි ලෙස දැක්විය යුත්තේ මෙසේ ය.

- දුක්ඛාර්ය සත්‍යය
- දුක්ඛ සමුදයාර්ය සත්‍යය
- දුක්ඛ නිරෝධාර්ය සත්‍යය
- දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යය

මේ අනුව සත්‍ය සතරේ දී ම දුක්ඛ යන වචනයත් ආර්ය යන වචනයත් සත්‍යය යන වචනයත් යෙදිය යුතුම ය. එබැවින් ආර්ය යන වචනයෙන් තොරව දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය ආදී වශයෙන් හෝ දුක්ඛ යන වචනයෙන් හා ආර්ය යන වචනයෙන් තොරව සමුදය සත්‍යය නිරෝධ සත්‍යය ආදී වශයෙන් හෝ යෙදීම සුදුසු නැත.

මෙම සත්‍ය හතර ආර්ය සත්‍ය හෙවත් උතුම් සත්‍ය ලෙස හැඳින්වෙන්නේ කුමක් හෙයින් ද? ඊට හේතු කීපයක් ඇත.

- ආර්ය නාමයෙන් බුදුරජාණන් වහන්සේ හැඳින්වෙති. ඒ ආර්ය වූ බුදුරජාණන් වහන්සේ විසින් සොයා ගනු ලැබූ සත්‍ය යන තේරුමින් ආර්ය සත්‍යය යි කියනු ලැබේ.
  මේ සත්‍ය සතර ලොවැ හැම කල්හි ම පවතී. එහෙත් ඇතැම් කාලවල ඒවා සත්‍ය බව අවබෝධ කර ගන්නා අය නැත. යළිත් එම සත්‍ය මැනවින් වටහා ගෙන ලොවට හෙළි කැරෙන්නේ ආර්ය වූ බුදුරජාණන් වහන්සේ විසිනි.
- මෙම සත්‍ය සතර අවබෝධ වීමෙන් ආර්ය භාවයට පත් වන බැවින් ද ආර්ය සත්‍යය යි කියනු ලැබේ. බුදු පසේ බුදු මහරහත් උතුමන්ට ආර්යයෝ යැයි කියනු ලැබෙති. උන්වහන්සේ ආර්ය භාවයට පත්වන්නේ මෙම සත්‍ය සතර අවබෝධ කර ගැනීම නිසා ය.

- කිසි දිනෙක වෙනස් නොවන බොරු නොවන උතුම් සත්‍යය යන තේරුමින් ද ආර්ය සත්‍යය යි කියනු ලැබේ. මේවායේ සත්‍ය භාවය කිසි කලෙක වෙනස් නොවේ. කිසිවකුට වෙනස් කළ හැකි ද නොවේ.

මෙම ආර්ය සත්‍ය සතරෙහි මුල් ම සත්‍යයෙන් එ නම් දුක්ඛාර්ය සත්‍යයෙන් කැරෙන්නේ දුක නම් කුමක්දැයි නිවැරදි ම ලෙස විග්‍රහ කිරීමයි. ඒ දුක ඇතිවීමේ සැබෑ හේතුව කුමක් දැයි දුක්ඛ සමුදයාර්ය සත්‍යයෙන් විග්‍රහ වන අතර දුක නැතිවීම නම් කුමක්දැයි දුක්ඛ නිරෝධාර්ය සත්‍යයෙන් පැහැදිලි කැරේ. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාර්ය සත්‍යයෙන් කැරෙන්නේ දුක නැතිවීමට අනුගමනය කළ යුතු නියම පිළිවෙත පැහැදිලි කිරීමයි.

මෙම ඉගැන්වීම දෙස මැනවින් බැලූ විට පැහැදිලි වන්නේ එමගින් සත්වයාගේ පැවැත්ම හා නැවැත්ම හේතුඵල සම්බන්ධය පදනම් කර ගෙන දැක්වෙන බවයි. පළමු ආර්ය සත්‍යයෙන් පවත්නා ස්වභාවය පැහැදිලි කැරෙන අතර, දෙවැනි ආර්ය සත්‍යයෙන් එම පැවැත්මට හේතුව පැහැදිලි කැරේ. තෙවැනි ආර්ය සත්‍යයෙන් එම ස්වභාවයේ නැවැත්මත් සිව්වැන්නෙන් නැවැත්ම සඳහා ක්‍රියාත්මක විය යුතු පිළිවෙතත් පැහැදිලි කෙරේ.

පොදුවේ ගත්විට පුද්ගල ජීවිතය පිළිබඳ මූලික ගැටලුවත් එම ගැටලුවට හේතුවත්, ගැටලුව නිරාකරණය කර ගැනීමත් ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයත් නිවැරදි ලෙස පැහැදිලි කැරෙන්නේ චතුරාර්ය සත්‍යයෙනි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 02** : තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : බුදු සිරිතේ ආරම්භක වකවානුවේ ප්‍රධාන සිද්ධි අධ්‍යයනය කර ආදර්ශ ලබා ගනියි.

**ක්‍රියාකාරකම 2.1** : බුදු සිරිතෙන් ආදර්ශ ගනිමු.

**කාලය** : මිනිත්තු 80 යි

**ගුණාත්මක යෙදවුම්** :

- බුද්ධ ධර්මය 7 ශ්‍රේණිය පාඨ ග්‍රන්ථය
- ඕමයි කඩදාසි සහ මාකර් පෑන්.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 2.1.1** :

- බුද්ධ චරිතය පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම විමසීමට පහත සඳහන් ආකාරයේ ප්‍රශ්න කීපයක් අසමින් පාඩමට පිවිසෙන්න.
- බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසු සති කීයක් බෝමැඩ අවට ගත කළේද?
- බුදුරජාණන් වහන්සේ මුලින්ම ආලරකාලාම, උද්දකරාමපුත්ත වැනි තාපස වරුන්ට දහම් දෙසීමට සිතුවේ ඇයි?
- බුදුරජාණන් වහනසේ පස්වග තවුසන් අමතා කළ මුල්ම ධර්ම දේශනාව හැඳින්වෙන නම කුමක්ද?
- සිසුන්ගෙන් ලැබෙන පිළිතුරු අගයමින් සහ ඌන පූරණය කරමින් පහත සඳහන් කරුණු ඇතුළත් වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| - බුදුරජාණන් වහන්සේ මුල්ම සති හත බෝමැඩ අවට ගත කළ බව.<br>- ආලාරකාලාම, උද්දකරාමපුත්ත වැනි තාපසවරුන් , කෙලෙස් අඩු අය නිසා මුලින් ම දහම් දෙසීමට බුදුරජාණන් වහන්සේ සිතූ බව.<br>- එම තාපසවරුන් ජීවත්ව නොසිටි නිසා තමන් වහන්සේට බෝසත් අවදියේ උපකාර කළ පස්වග තවුසන්ට මුල්ම දේශනාව කිරීමට තීරණය කළ බව.<br>- බුදුරදුන්ගේ මංගල ධර්ම දේශනාව ධම්මචක්කප්පවත්තන සූත්‍රය නමින් හැඳින්වෙන බව සහ එහි චතුරාර්ය සත්‍යය අන්තර්ගත වන බව. |

**පියවර 2.1.2** :

- පන්තිය කණ්ඩායම් හතරකට බෙදා මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනුවෙන් නම් කරන්න.
- ගවේෂණ උපදෙස් ඕමයි කඩදාසි සහ මාකර් පෑන් එම කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 2.1.3** :

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- පස්වග භික්ෂූන්ගෙන් පසුව යස කුල පුත්‍රයා සහ ඔහුගේ යහළුවන්ගේ පැවිද්දත් සමග රහත් වූ බුද්ධ ශ්‍රාවක පිරිස හැට නමක් වූ අතර පළමු ධර්ම දූත කණ්ඩායම එම සැට නමගෙන් සමන්විත වූ බව.
- භද්දවග්ගිය කුමාරවරුන්ගේ පැවිද්දෙන් තරුණයන්ට ආකර්ශනීය දහමක් බුදුරදුන් විසින් දේශනා කරන ලදැයි ප්‍රකට වන බව.
- බුද්ධත්වයෙන් අට වන මස එනම් දුරුතු පෝදා බුදුරදුන් ලක්දිව මහියංගනයට වැඩම කළ බව.
- ජටිල දමනයෙන් පසුව එම භික්ෂූන් දහස ද සමග රජගහනුවරට වැඩමකර බිම්සර රජුට දහම් දෙසූ අතර ශාසනයේ ප්‍රථම ආරාම පූජාව එහිදී සිදුවුන බව.
- මළවුන්ට පින්දීමේ වර්තමාන පිළිවෙත එදා බිම්බිසාර රජුගෙන් ආරම්භ වූ බව.
- බුදුරදුන් රජගහනුවර වැඩසිටි සමයේ සැරියුත් මුගලන් රහතන් වහන්සේලාගේ පැවිදි වීමත් උන්වහන්සේලාට අග්‍ර ශ්‍රාවක තනතුරු ප්‍රදානය කරනු ලැබීමත් සිදුවුනු බව.
- බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුරයට වැඩමවා ගැනීම පිණිස සුද්ධෝදන රජු විසින් යවනු ලැබූ දහසක් දෙනා පැවිදි වූ අතර ඒ පිරිසට අයත් වූ කාලුදායි තෙරණුවන්ගේ ආරාධනාවෙන් බුදුරදුන් කිඹුල්වතට වැඩම කළ බව.
- ශාක්‍යයන්ගේ මානය බිඳීමට යමාමහ පෙළහර පෑ බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමය පිළිගත් බව.
- බුදුරදුන් කිඹුල්වතට වැඩම කළ නිසා උන් වහන්සේගේ ගිහිකල ඥාතීන් ඇතුළු විශාල පිරිසකට සෙත සැලසුණු බව.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## තක්සේරු  සහ ඇගයීම් නිර්ණායක

- ප්‍රථම ධර්ම දේශනාවේ සිට කිඹුල්වත්පුර ගමන තෙක් බුදු සිරිතේ ප්‍රධාන සිද්ධි විස්තර කරයි.
- කිඹුල්වත්පුර ගමනේ සිද්ධි පදනම් කරගෙන බුදුරජාණන් වහන්සේ ගැන පැහැදීමෙන් කථා කරයි.
- බුදුරජාණන් වහන්සේගේ කිඹුල්වත්පුර වැඩමවීම තෙක් ඒ ඒ අවස්ථාවන්හි පැවිදි වූ සංඛ්‍යා වෙන වෙන ම ලියා දක්වයි.
- සුදුසුකම් පදනම් කරගෙන අන්‍යයන්ට තනතුරු ලැබීම ගැන සතුටු වෙයි.
- අනුන්ට සේවය කිරීමට ලැබෙන අවස්ථාවන්ගෙන් උපරිමව  සේවාවන් ඉටුකරයි.

ඇමුණුම 2.1.1

## කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- පාඨ ග්‍රන්ථයේ අදාළ පාඩම සියලු දෙනාම වෙන වෙන ම කියවන්න.
- ඔබේ කණ්ඩායමට වෙන් කර ඇති ප්‍රශ්න වලට පිළිතුරු සාකච්ඡා කර සටහන් කරන්න.
- එම සටහන් කණ්ඩායම් වාර්තාවක් ලෙස ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**මෙත්තා**

1. යස කුල පුත්‍රයා සහ ඔහුගේ යහළුවනුත් භද්දවග්ගිය කුමාරවරුනුත් පැවිද්දට යොමු වූ ආකාරය පැහැදිලි කරන්න.
2. බුදුරජාණන් වහන්සේ පළමුවරට ලක්දිවට වැඩම කරවීම පිළිබඳ ඓතිහාසික සිදුවීම සංක්ෂිප්තව සටහන් කරන්න.

**කරුණා**

1. මියගිය ඥාතීන්ට පින්දීමේ සිරිත බුදුරජාණන් වහන්සේ විසින් ම හඳුන්වාදෙනු ලැබූ බවට  දැක්විය හැකි නිදසුන් මොනවාද?

2. තම ශ්‍රාවකයන් ධර්මදූත කාර්යයෙහි යෙදවීමෙන් බුදුරජාණන් වහන්සේ බලාපොරොත්තු වූයේ කුමක්ද?

**මුදිතා**

1. බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වැඩසිටි සමයේ සංඝ සමාජයට එකතු වූ විශිෂ්ට ම සාමාජිකයන් කවුරුන්ද?
2. බුදුරජාණන් වහන්සේට කිඹුල්වත් නුවරට වැඩමවීමට පසුබිම සකස් වූ ආකාරය පැහැදිලි කරන්න.

**උපේක්ඛා**

1. තුන්බෑ ජටිලයන් බුද්ධ ශ්‍රාවකයන් බවට පත්වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
2. බුදුරජාණන් වහන්සේ කිඹුල්වතට වැඩම කිරීමෙන් ගිහි ඥාතීන්ට සිදුවුනු යහපත කුමක්ද?

**නිපුණතාව 02** : තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** : බුදු රදුන් අසරණයන්ට සහ ගිලනුන්ට පිහිට වූ ආකාරය අගය කරමින් චරිතායනය කරයි.

**ක්‍රියාකාරකම 2.2** : දුකට පත් අය දුකින් මුදවමු.

**කාලය** : මිනිත්තු 80 යි

**ගුණාත්මක යෙදවුම්** :

- බුදුරදුන් සෝපාකට පිහිට වූ ආකාරය දැක්වෙන චිත්‍රයක්.
- පූතිගත්තතිස්ස තෙරුන්ට බුදුරදුන් උපස්ථාන කළ ආකාරය නිරූපණය කැරෙන චිත්‍රයක්
- බුද්ධ ධර්මය 7 ශ්‍රේණිය පාඨ ග්‍රන්ථය.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 2.2.1** :

- කලින් පිළියෙල කරගත් චිත්‍ර දෙක සිසුන්ට නිරීක්ෂණය කිරීමට සලසන්න.
- එම චිත්‍රවලින් නිරූපිත අවස්ථා පිළිබඳ සිසු දැනුම විමසන්න.
- පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- එක් චිත්‍රයකින් බුදුරදුන් අසරණයන්ට පිහිට වූ අයුරුත් අනෙක් චිත්‍රයෙන් බුදුරදුන් ගිලනුන්ට උපස්ථාන කළ අයුරුත් නිරූපණය වන බව.
- අසරණයන්ට සරණ වීමෙන් හා ගිලනුන්ට උපස්ථාන කිරීමෙන් බුදුරජාණන් වහන්සේගේ මහා කාරුණිකත්වය මෙන් ම යථාවාදී තථාකාරීත්වය ද ප්‍රකට වන බව.

**පියවර 2.2.2** :

- පන්තිය කණ්ඩායම් තුනකට බෙදා ඒවා රම්‍ය, සුරම්‍ය, සුභ යනුවෙන් නම් කරන්න.
- ගවේෂණ උපදෙස් පත්‍රිකාව, ඩිමයි කඩදාසි සහ මාකර් පෑන් එම කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 2.2.3** :

- කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න.
- පහත සඳහන් කරුණු ද ඇතුළත් වන ලෙස සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- බුදුරදුන් අසරණයන්ට පිහිටවීමෙන් ජාති ආගම් භේද, කුල මල භේද ගිහි පැවිදි භේද , ස්ත්‍රී පුරුෂ භේද ආදී කිසිවක් නොබලා අසරණත්වය පමණක් සැලකිල්ලට ගත් බව.
- ඇතැම් අයට පිහිටවීම සඳහා සැලසුම් සහගතව දින ගණන් කැප කරමින් ක්‍රියාකළ ආකාරය කෙත පාලුවූ ගොවියාගේ පුවතින් හෙළිවන බව.
- ඇතැම් අයට පිහිටවීම සඳහා සැලසුම් සහගතව දින ගණන් කැප කරමින් ක්‍රියාකළ ආකාරය කෙත පාලුවූ ගොවියාගේ පුවතින් හෙළිවන බව.
- දරුවන් විසින් පිටමං කරනු ලැබූ බමුණාට පිහිට වීමට ගත් පියවරින් ඔහුට පමණක් නොව ආධ්‍යාත්මිකව අසරණ ව සිටි ඔහුගේ දරුවන්ට ද පිහිට වූ බව.
- ළමයින් කෙරෙහි බුදුරදුන් දැක් වූ කරුණාව සෝපාක කතා පුවතින් හෙළිවන බව.
- බුදුරදුන්ගේ අසරණ සරණ ගුණය නිසා ඇතැම් අසරණයන්ට ලොව්තුරු සුවය පවා ලැබුණු අයුරු පටාචාරා, කිසාගෝතමී කතා පුවත් වලින් ප්‍රකට වන බව.
- කැතකුණු නොබලා පිළිකුල නොසලකා තමාගේම අතින් ගිලනුන්ට උපස්ථාන කිරීමට තරම් බුදුරදුන් මහා කාරුණික වූ ආකාරය පූතිගත්තතිස්ස තෙරණුවන්ගේත් සහ උදර රෝගයෙන් වැළඳුණු භික්ෂූන් වහන්සේගේත් කතා පුවත් වලින් හෙළිවන බව.
- අසරණ අයට ගිලනුන්ට දයානුකම්පාවෙන් පිහිට වීම සත්පුරුෂ ලක්ෂණයක් මෙන්ම පින්කමක් ද වන බව.

## තක්සේරු සහ ඇගයීම් නිර්ණායක

- බුදුරදුන් අසරණයන්ට සරණ වූ ආකාරය සහ ගිලනුන්ට උපස්ථාන කළ ආකාරය ප්‍රකට කැරෙන කතා පුවත් ගෙන හැර දක්වයි.
- තමන්ට ක්‍රියාකාරීව පිහිටක් විය නොහැකි අවස්ථාවක පවා අසරණ වූවන් සහ ගිලනුන් දෙස දයානුකම්පාවෙන් බලයි.
- අසරණයන්ට ගිලනුන්ට පිහිට විය යුත්තේ ඇයි යන්න පැහැදිලි කරයි.
- රෝහල් ගත වූ සිය ඥාතියකු හෝ හිතවතකු හෝ බැලීමට ගිය විට ඒ අසල සිටින අනෙක් රෝගීන්ගේද සුවදුක් විමසයි.
- සිටගෙන ගමන්කළ නොහැකි අයකු බසයක දුටුවිට ස්වේච්ඡාවෙන්ම සිය අසුන පරිත්‍යාග කරයි.

ඇමුණුම 2.2.1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්.

- බුද්ධ ධර්මය 7 වන ශ්‍රේණියේ අදාළ පාඩම සියලු දෙනා එක්ව මනා අවධානයකින් යුතුව කියවන්න.
- ඔබේ කණ්ඩායමට පැවරෙන පහත සඳහන් කාර්යය ඉටු කරන්න.

**රම්‍ය**

අසරණ බ්‍රාහ්මණයන්ට බුදුරදුන් පිහිට වූ බවට දැක්විය හැකි සාධක මෙම පාඩමෙන් සොයා බලන්න.

**සුරම්‍ය**

බුදු රදුන් ගිලනුන්ට උපස්ථාන කළ බවට මෙම පාඩමෙන් ඉදිරිපත් කැරෙන නිදසුන් මොනවා දැ යි සටහන් කරන්න.

**සුභ**

අසරණ ළමුන් සහ අසරණ කාන්තාවන් බුදු පිහිට ලැබූ අවස්ථා මෙම පාඩම ඇසුරෙන් ඉදිරිපත් කරන්න.

- සියලුම කණ්ඩායම් තම කාර්යයට අදාළ වාර්තා වෙන වෙන ම පිළියෙල කරන්න.

**නිපුණතාව 02** : තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 2.3** : ධර්ම රත්නයේ ගුණ හැඳිනගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.

**ක්‍රියාකාරකම 2.3** : දහම් ගුණ හැඳින ශ්‍රද්ධාවෙහි පිහිටමු. දහමෙහි යෙදෙමු.

**කාලය** : මිනිත්තු 80 යි

**ගුණාත්මක යෙදවුම්** :

- "ස්වාක්ඛාතෝ".... යන පාඨය සම්පූර්ණයෙන් නිවැරදිව ලියූ පුවරුවක්
- ඇමුණුම : 2.3.1 ට අදාළ ඉහත පාඨයට ඇතුළත් දහම් ගුණ සය අඩංගු පදා පන්තිය ලියූ පිටපත් දෙකක්.
- ඇමුණුම 2.3.2 ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකා දෙකක් 1සිට 6 තෙක් ඉලක්කම් වෙන වෙනම ලියූ කාඩ්පත් හයක්.
- ඩිමයි කඩදාසි සහ මාකර් පෑන්.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 2.3.1** :

- "ස්වාක්ඛාතෝ".... යන පාඨය ලියූ පුවරුව පන්තියට ඉදිරිපත් කරන්න.
- එම පාඨය වන්දනා අවස්ථාවක භාවිත කැරෙන ආකාරයට සජ් ඣායනා කිරීමට සලස්වන්න.
- එම පාඨයෙහි ඇතුළත් දහම් ගුණ සංඛ්‍යාව පිළිබඳව විමසන්න.
- පහත සඳහන් කරුණු අන්තර්ගත වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - වන්දනාවේ දී හා භාවනාවේ දී දහම් ගුණ සිහි කිරීමට "ස්වාක්ඛාතෝ".. පාඨය භාවිත කැරෙන බව.
> - එම පාඨය ධජග්ග සූත්‍රයෙහි ඇතුළත් බව.
> - දහම් ගුණ මෙනෙහි කරන විට ධර්මයෙහි අගය පිළිබඳ ව පමණක් නොව එම දහම දෙසූ බුදුරජාණන් වහන්සේ පිළිබඳව ද පැහැදීමක් ඇතිවන බව.

**පියවර 2.3.2** :

- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ගවේෂණ උපදෙස් පත්‍රිකා ඩිමයි කඩදාසි සහ මාකර් පෑන් එම කණ්ඩායම්වලට බෙදා දෙන්න
- අංක 1 - 6 දක්වා ලියූ කාඩ් අහඹු ලෙස තෝරා එක් කණ්ඩායමට තුන බැගින් දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 2.3.3** :

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා, ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව දෙන්න.
- අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- "ස්වාක්ඛාතෝ". .... පාඨයෙහි ඇතුළත් වන්නේ ස්වාක්ඛාත, සන්දිට්ඨික, අකාලික, ඒහිපස්සික, ඕපනයික, පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි යන දහම් ගුණ සය බව.
- ආදි කල්‍යාණ, මජ්ඣේ කල්‍යාණ, පරියෝසාන කල්‍යාණ ලෙස එනම් මුල මැද අග යන ස්ථාන තුනම මනාකොට දේශනා කර ඇති බැවින් "ස්වාක්ඛාත" නම් වන බව.
- තමා විසින් ම මේ ජීවිතයේ දී ම අත්දැකිය යුතුය යන අර්ථය "සන්දිට්ඨික" යන්නෙහි ඇති බව.
- ආර්ය මාර්ගය අනුගමනය කිරීමෙන් කල් නොයවා ම අතරක් නැතිව ම ප්‍රතිඵල ලැබෙන හෙයින් ද කිසියම් කාලයකට සීමා නොවන හෙයින් ද "අකාලික" නම් වන බව.
- විශ්වාසයෙන් පිළිගන්නැයි නොකියා පැමිණ බලන්නැයි ආරාධනා කැරෙන ස්වරූපයක් දහමෙහි ඇති බැවින් "ඒහිපස්සික" නම් වන බව.
- දහම තම සිත් සතන් තුළට පමුණුවා ගත යුතු බැවින් "ඕපනයික" නම් වන බව.
- නුවණැතියන් විසින් වෙන වෙන ම දත යුතු දහමක් බැවින් "පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි" නම් වන බව.
- මෙවන් උතුම් ගුණ පවතින දහමෙහි ප්‍රායෝගිකව යෙදිය යුතු බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

- "ස්වාක්ඛාතෝ"පාඨයෙහි ඇතුළත් දහම් ගුණ හඳුන්වයි.
- දහම් ගුණ ඇසුරින් දහමෙහි ශ්‍රේෂ්ඨත්වය පිළිගනියි.
- දහම් ගුණ සය වෙන්වන සේ ද නිවැරදි උච්චාරණයෙන් යුතුව ද "ස්වාක්ඛාතෝ" පාඨය කියයි
- විචාරාත්මකව අධ්‍යයනයෙහි යෙදෙයි.
- සෑම ක්‍රියාවක්ම ආරම්භයේ සිට අවසානය තෙක් පිළිවෙළකට කරයි.

ඇමුණුම 2.3.1

### දහම් ගුණ දැක්වෙන පද්‍ය

1 මුල මැද හා අගද
යහපත් ලෙසට මුනිසඳ
දෙසුයෙන් දහම් කඳ
ස්වාක්ඛාතය කියා නම් ලද

2 මෙම අත්බවේදි ම
පිළිපදීනම් සදහම
ලැබෙනුයෙන් පල හැම
යෙදේ සන්දිට්ඨිකය යන නම

3 කාලයක් නැතිව ම
මගපල ලැබෙයි හැමදම
එම අරුත ඇතිවම
අකාලික නම දරයි සදහම

4 ඇවිදින් බලනු මැන
අඳ බැතියකින් නොම ගෙන
ඇරයුම් ඇති බැවින
ඒහිපස්සික කියා පැවසින

| | | |
|---|---|---|
| 5 | තම සිත් සතන් | තුළ |
| | උපදවා ගත යුතු | බල |
| | ඇති බැවින් හැම | කල |
| | ඕපනයිකය දහම | නිකසල |

| | | |
|---|---|---|
| 6 | තම තම නැණ | මගින් |
| | දහම දත යුතු | මැනවින් |
| | පච්චත්ත | වශයෙන් |
| | වේදිතබ්බය කියති | එබැවින් |

ඇමුණුම 2.3.2

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට ලැබෙන අංකවලට අයත් පද්‍ය තුන වෙන් කර හැඳින ගන්න.
- අර්ථ මෙනෙහි කරමින් එම පද්‍ය තුන තනි තනිව කියවා ගන්න.
- සාකච්ඡා කරමින් එම පද්‍ය තුනෙන් විස්තරවන දහම් ගුණයන්හි ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ සරල හැඳින්වීමක් ලියන්න.
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 03** : ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කරගනියි.

**නිපුණතා මට්ටම 3.1** : බෞද්ධ සිරිත් විරිත් අර්ථවත් ව අනුගමනය කරයි.

**ක්‍රියාකාරකම 3.1** : නිති සුරකිමු සිරිත් විරිත්

**කාලය** : මිනිත්තු 80 යි

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 3.1.1 ට අදාළ කවි පන්තිය ලියන ලද පුවරුවක්.
- ඇමුණුම : 3.1.2ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා පිටපත් දෙකක්.
- ඩිමයි කඩදාසි, මාකර් පෑන්.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 3.1.1** :

- ඇමුණුමු 3.1.1 ට අදාළ “සිරිමත් මගෙ සකි ” යන කවි පන්තිය ලියන ලද පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම කවි පන්තිය එක් වරක් සිසුන්ලවා තාලයට ගායනා කරවන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • පද්‍ය පන්තියේ සඳහන් සිරිමත්, සිරිත් විරිත් අනුව කටයුතු කරන යහපත් ළමයකු බව.<br>• සිරිත් යනු කළ යුතු දේ කිරීම බව.<br>• විරිත් යනු නොකළ යුතු දේ නොකිරීම බව. |

**පියවර 3.1.2** :

- පන්තිය කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 3.1.2 ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා, ඩිමයි කඩදාසි, මාකර් පෑන් සිසුන් අතර බෙදා හරින්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 3.1.3** :

- කුඩා කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට ම පළමු අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ආහාර අනුභවයේ දී අනුගමනය කළ යුතු බෞද්ධ සිරිත් විරිත් රැසක් ඇති බව.
- ඒවා පහත සඳහන් පරිදි බව.
  - අනුභවයේ දී විවිධ ශබ්ද නොනැගීම, කතා බස් නොකිරීම, අත ලෙව නොකෑම, ඇඟිලි පුරුක්වල ආහාර තවරා නොගැනීම, අපිළිවෙළට භාජනයේ තැනින් තැනින් අනුභව නොකිරීම, අනුභවයට පෙර අත සෝදා ගැනීම යනාදියයි.
- ඇඳුම් පැළඳුම් පරිහරණයේදී අනුගමනය කරන සිරිත් විරිත් රාශියක් පහත සඳහන් පරිදි ඇති බව.
  - පිරිසිදු ඇඳුම් ඇඳීම, සංවර ඇඳුම් ඇඳීම, අඟ පසඟ අනවශ්‍ය ලෙස පෙනෙන පරිදි ඇඳුම් ඇඳීමෙන් වැළකීම.
- වැසිකිළි, කැසිකිළි භාවිතයේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් පහත සඳහන් පරිදි වන බව.
  - වැසිකිළියට ඇතුළුවීමට පෙර කිසියම් සංඥාවක් කිරීම. පාවිච්චියෙන් පසු වතුර ගසා පිරිසිදු කිරීම, බිත්ති සහ බිම අපවිත්‍ර නොකිරීම, වැසිකිළි කැසිකිළි උපකරණවලට හානි නොකිරීම.
- පංති කාමර පරිහරණයේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් රැසක් ඇති බව.
  - එම සිරිත් විරිත් පහත සඳහන් පරිදි බව.
    උපකරණ අපවිත්‍ර නොකිරීම හා පිරිසිදු කිරීම ,විනාශ නොකිරීම, අනවශ්‍ය ලෙස ඝෝෂා නොකිරීම, සියලු සිසුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම, පන්තියට පැමිණෙන, පන්තිය ආරම්භයේදී සහ අවසානයේදී ගුරුතුමාට/ගුරුතුමියට ආචාර කිරීම.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- බෞද්ධ සිරිත් විරිත් පැහැදිළි කරයි.
- බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කිරීමේ වැදගත්කම පිළිගනියි.
- බෞද්ධ සිරිත් විරිත්වල වැදගත්කම මතුවන ආකාරයේ කථාවක් ඉදිරිපත් කරයි.
- ආචාරශීලීව හැසිරෙයි.
- නිරර්ථක පිළිවෙත් බැහැර කරයි.

ඇමුණුම 3.1.2

## කණ්ඩායම් ගවේෂණ උපදෙස

- සිරිත් විරිත් සම්බන්ධයෙන් ඔබේ කණ්ඩායමට පැවරෙන අවස්ථාව කෙරෙහි අවධානය යොමු කරන්න.

- එම අවස්ථාවේ දී අනුගමනය කැරෙන බෞද්ධ සිරිත් විරිත් ලැයිස්තුගත කරන්න.
  - ආහාර අනුභව කිරීම.
  - ඇඳුම් පැළඳුම් පරිහරණය
  - වැසිකිළි, කැසිකිළි භාවිතය
  - පංති කාමර පරිහරණය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 3.1.1

## සිරිමත්

සිරිමත් මගෙ සකි
යහපත් ළමයෙකි
නුවණත් ඇත්තෙකි
වැඩටත් සමතෙකි

උදයම පිබිදී
මුහුණට දිය දී
කුල දෙවි නම දී
ගේ දොර අමදී

පාඩම් කරන ට
පතපොත ගෙන සිට
සිත වෙන අතකට
නොහරී කිසි විට

හරිදේ සිතුමත්
සිතු දේ කීමත්
කී දේ කෙරුමත්
නොහරී සිරිමත්

**නිපුණතාව 03** : ජීවනරටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 3.2** : භාවනාවේ ප්‍රායෝගික වටිනාකම හැඳිනගෙන දෛනිකව භාවනා කරයි.

**ක්‍රියාකාරකම 3.2** : මෙත් වඩමු , සෙත් සදමු

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 3.2.1ට ඇතුළත් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් තුනක්
- ඇමුණුම 3.2.2ට ඇතුළත් කරණීයමෙත්ත සූත්‍රය හා එහි අදහස ඇතුළත් පත්‍රිකාවේ පිටපත් තුනක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 3.2.1** :

- කරණීයමෙත්ත සූත්‍රය පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම විමසන්න.
- එම සූත්‍රය හෝ කොටසක් හෝ කටපාඩමින් ඉදිරිපත් කළ හැකි සිසුවෙක් වේ නම් ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - බුද්ධ කාලයෙහි භික්ෂූන් වහන්සේලා මුහුණ දුන් ගැටලුවක් විසඳාගැනීම සඳහා මෙම සූත්‍රය දේශනා කළ බව.
> - මෙය මෙත්ත සූත්‍රය නමින් ද හැඳින්වෙන බව.
> - කරණීයමෙත්ත සූත්‍රයේ මෙත් වැඩීම පිළිබඳව කරුණු අඩංගු බව

**පියවර 3.2.2** : පන්තිය කුඩා කණ්ඩායම් තුනකට බෙදන්න.

- ඇමුණුම 3.2.1ට අදාළ ගවේෂණ පත්‍රිකාත් ඇමුණුම 3.2.2ට අදාළ කරණීයමෙත්ත සූත්‍රය හා එහි අදහස් දැක්වෙන පත්‍රිකාත් කණ්ඩායම්වලට ලබාදෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 3.2.3** :

- කුඩා කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා, ඉදිරිපත් කළ කණ්ඩායමටම පළමු අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - කරණීයමෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රී භාවනාව වැඩීමට පෙර ඇති - කරගත යුතු ගුණාංග පහළොවක් ඇති බව.
> - සියලු ආකාරයේ ප්‍රාණීන් වෙත සමානව මෛත්‍රිය විහිද විය යුතු බව.
> - සිසු දිවියේ දියුණුව සඳහා මෛත්‍රී භාවනාවෙන් ප්‍රයෝජන රැසක් සැලසෙන බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- කරණීයමෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රී භාවනාවේ පියවර පැහැදිලි කරයි.
- මෛත්‍රී භාවනාවෙහි විපුල ඵල රැසෙක් ඇති බව පිළිගනියි.
- කරණීයමෙත්ත සූත්‍රය පදනම් කරගෙන භාවනා කරයි.
- අන් අය සමඟ සුහදශීලීව කටයුතු කරයි.
- පැවැරෙන යහපත් කාර්යයන්ට ඍජුව ඉදිරිපත් වෙයි.

ඇමුණුම 3.2.1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

ඇමුණුම 3.2.2 පත්‍රිකාව ඇසුරෙන් පහත සඳහන් කරුණු අතරින් ඔබේ කණ්ඩායමට ලැබෙන කරුණ ගැන අවධානය යොමු කරන්න.

- කරණීයමෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රී භාවනාව වැඩීමට පෙර පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංග මොනවාදැයි සොයන්න.
- මෛත්‍රිය විහිදවිය යුතු වන්නේ කෙසේදැයි එම සූත්‍රයට අනුව සටහන් කරන්න.
- මෛත්‍රී භාවනාව සිසු දිවියක දියුණුව ඇති කර ගැනීම සඳහා යොදාගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

ඇමුණුම 3.2.2

කරණීය මෙත්ත සූත්‍රය

**නිදාන කතාව :**

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් උන් වහන්සේගෙන් කමටහන් උගෙන, භාවනා කරනු පිණිස හිමාලය අසල වන පෙදෙසකට වැඩියහ. එම භික්ෂූන් වහන්සේලා අසල ගමකින් පිඩුසිඟා ගෙනවුත් වළඳා භාවනාවෙන් කල් ගෙවීමට පටන් ගත්හ. එහෙත් උන් වහන්සේලා ගෙන් එක නමකටවත් නිසි සේ භාවනා කිරීමට නොහැකි විය. හැම දෙනා වහන්සේ ම, ටික කලෙක දී සුදු මැලි වී, වැහැරී යන්නට වූහ. එහෙත් තමන්ට කරදරයක් ඇති බව කිසිවෙක් ඔවුනොවුන්ට නොදැන්වූහ. පසුව සැමදෙනා ම එක සේ සුදුමැලි වි වැහැරි යනු දුටු භික්ෂූන් වහන්සේලා ඔවුනොවුන්ගෙන් ඊට හේතු විචාළහ. මෙහි දී තම තමන්ට මුහුණ පෑමට සිදු වු නොයෙක් ගැහැට පිළිබඳ තොරතුරු හෙළිවිණ. ඇතැම් භික්ෂූන් වහන්සේලා, තමන් වහන්සේලාට භයානක රූප පෙනෙන්නට වු බව සඳහන් කළහ. තව පිරිසක් තමන් වහන්සේලාට භයානක ශබ්ද ඇසෙන්නට වු බව දැන්වූහ. සමහර දෙනා වහන්සේලාට ඉවසිය නොහැකි දුගඳක් දැනෙන්නට වූ බවත් දන්වා සිටියහ.

මේ සිල්වත් භික්ෂූන් වහන්සේලා එහි වාසය කිරීම නිසා තමන්ගේ තේජස් නැති වී ගිය රුක් දෙවිවරු උන් වහන්සේලා පලවා හැරීමට මෙවැනි උපක්‍රම යෙදූහ. අන්තිමේ දී භික්ෂූන් වහන්සේලා ආපසු බුදුරජාණන් වහන්සේ කරා වැඩම කොට තමන් වහන්සේලාට මුහුණපෑමට සිදු වූ එම කරදර හිරිහැර ගැන උන්වහන්සේට සැළකර සිටියහ. එවිට බුදුරජාණන් වහන්සේ " මහණෙනි, තොපට භාවනාවට සුදුසු තැන නම් එම වන පෙදෙසමය. එහෙයින් මවිසින් කියා දෙන මෙම සූත්‍රය ඉගෙන ගෙන ගොස් එහිදී සජ් ධ්‍යානය කරමින් භාවනාවෙහි යෙදෙන්නැ " යි පවසා මෛත්‍රී භාවනාව හා එය වඩන්නකු තුළ තිබිය යුතු ගුණ දහම් ඇතුළත් මෙම **කරණීය මෙත්ත සූත්‍රය** උගන්වා වදාළ සේක.

භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගෙන් මෙම සූත්‍රය ඉගෙන ගෙන ආපසු වනාන්තරයට ගොස් එය නිරතුරුවම සජ් ධ්‍යානය කළහ. එතැන් පටන්, පළමු ව භික්ෂූන් වහන්සේලාට නොයෙක් හිරිහැර කළ රුක් දෙවිවරු උන් වහන්සේලා වෙත මෛත්‍රිය දැක්වූහ. මේ නිසා එම වන පියස භික්ෂූන් වහන්සේලාට භාවනානුයෝගීව කල් ගෙවීමට සුදුසු ස්ථානයක් බවට පත් විය.එහෙයින් උන් වහන්සේලා එතැන් සිට එකඟ වූ සිතින් යුතු ව භාවනා වඩා නොබෝ කලකින් ම රහත් වූහ.

මෙයයි එම කරණීය මෙත්ත සූත්‍රය :

1. කරණීයමත්ථ කුසලේන
   යංතං සන්තං පදං අභිසමෙච්ච
   සක්කෝ උජූච සුජූ ච
   සුවචෝ චස්ස මුදු අනතිමානී

2. සන්තුස්සකෝ ච සුභරෝච
   අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති
   සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච
   අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

3. න ච ඛුද්දංසමාචරේ
   කිඤ්චි යේන විඤ්ඤූපරේ උපවදෙය්‍යුං
   සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු
   සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

4. යේ කේචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තා වා
මජ්ඣිමා රස්සකා අණුකථූලා

5. දිට්ඨා වා යේ ච අද්දිට්ඨා
යේ ච දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසී වා
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

6. න පරෝ පරං නිකුබ්බේථ
නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

7. මාතා යථා නියං පුත්තං
ආයුසා ඒකපුත්තමනුරක්ඛේ
ඒවම්පි සබ්බ භූතේසු
මානසං භාවයේ අපරිමාණං

8. මෙත්තඤ්ච සබ්බ ලෝකස්මිං
මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියංච
අසම්බාධං අවේරං අසපත්තං

9. තිට්ඨං චරං නිසින්නෝ වා
සයානෝ වා යාව තස්ස විගතමිද්ධො
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

10 දිට්ඨිං ච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතී ති.

තේරුම :

1. ශාන්ත වූ නිර්වාණය අවබෝධ කර ගැනීමට කැමති, තමාගේ දියුණුව සලසා ගැනීමෙහි සමත් තැනැත්තා විසින් එයට සුදුසු දේ කළ යුතුය.  හෙතෙම සියලු කටයුත්තෙහි දක්ෂයෙක් ද, අවංක වූවෙක් ද, නිරතුරුව ම අවංක වූවෙක් ද, සුවච වූවෙක් ද, මෘදු (මොලොක්) වූවෙක් ද, අනතිමානී වූවෙක් ද වන්නේය.

2. (හෙතෙම) ලද දෙයින් සතුටු වන, පහසුවෙන් පෝෂණය කළ හැකි. කටයුතු බහුල නොවූ, සැහැල්ලු පැවතුම් ඇත්තෙක් වන්නේය. (හෙතෙම) සන්සුන් ඉඳුරන් ඇති නුවණ ඇති තැන්පත් ගති පැවතුම් ඇත්තා වු හා කුලයන් කෙරෙහි ඇලුම් නොකරන්නා වූද කෙනෙක් වන්නේ ය.

3 (හෙතෙම) නුවණැත්තන්ගේ දෝෂාරෝපණයට ලක් වන කිසිදු වරදක් නොකරන්නේ ය. සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා, භයින් තොර වෙත්වා, සැපවත් සිත් ඇත්තෝ වෙත්වා. (යනුවෙන් මෛත්‍රිය වඩන්නේය.)

4. තැති ගන්නා සුලු කෙලෙස් ඇති සත්ත්වයෝය, සෙලවිය නොහැකි ස්ථිර සාර ගුණ ඇති රහතන් වහන්සේලාය, දිග සිරුරු ඇති සත්ත්වයෝය, මහත් සිරුරු ඇති සත්ත්වයෝය, මධ්‍යම ප්‍රමාණයේ සත්ත්වයෝය, කුඩා සත්ත්වයෝය, මිටි සත්තුය, තරබාරු සත්තුය (යන මොවුන් ද)

5. ඇසට පෙනෙන හෝ නොපෙනෙන සත්ත්වයෝ ද, දුර වසන හෝ ළඟ වසන සත්ත්වයෝ ද, උපන්නා වු හෝ ඉපදීමට සිටින්නා වු සත්ත්වයෝ ද, යන මේ සියලු ම සත්ත්වයෝ සුව පත් වෙත්වා ! (යනුවෙන් හෙතෙම මෛත්‍රිය වඩන්නේ ය.)

6. කිසි කෙනෙක් කිසිම කෙනකු නොරවටත්වා ! කිසිම තැනක දී කිසිවකුට අවමන් නොකරත්වා ! ක්‍රෝධ සහගත ක්‍රියාවලින් හෝ වචනවලින් හෝ සිතුවිලිවලින් හෝ ඔවුනොවුන්ට දුකක් ඇති වනු නොකැමති වෙත්වා! යනුවෙන් හෙතෙම මෛත්‍රිය වඩන්නේ ය.

7. මවක් යම් සේ තම එකම පුත්‍රයා සිය පණමෙන් ආරක්ෂා කරයි ද එසේම (හෙතෙම) සියලු සත්ත්වයන් කෙරෙහි අපමණ වු මෙත් සිත වඩන්නේ ය.

8. (හෙතෙම) සියලු ලෝකයෙහි උඩ, යට, හරහ යන සෑම තැන ම බාධාවක් නැතිව, වෛරයක් නැතිව.සතුරන් නැතිව, හැමදෙනා කෙරෙහි අපමණ වූ මෙත් සිත වඩන්නේය.

9. (හෙතෙම) සිටින විට හෝ ඇවිදින විට හෝ හිඳින විට හෝ සයනය කරන විට හෝ (යන මේ සතර ඉරියව්වේ දීම) අවදිව සිටින තාක් මෛත්‍රී සිත වඩන්නේය. මේ මෙත් වැඩීම, බඹ විහරණ (උසස් ම පැවැත්ම) යයි බුද්ධා දී උත්තමයෝ වදාළහ.

10. (මෙසේ මෛත්‍රී සිත වඩන තැනැත්තා) මිථ්‍යා දෘෂ්ටියකට නොපැමිණ, සිල්වත්ව, සෝවාන්ව ඉක්බිති සකෘදාගාමි, අනාගාමී මගඵලවලින් කාම සැපෙහි ගිජුකම දුරු කරන්නේ ය. අන්තිමේ දි (හෙතෙම) අර්හත් ඵලය ලබා නැවත කිසි කලෙකත් මවු කුසක නූපදනේ ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 03** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 3.3** : තම චරිතය හැඩගසා ගැනීමට ශ්‍රාවිකා චරිත ආදර්ශයට ගනියි.

**ක්‍රියාකාරකම 3.3** : බුදු සසුනෙහි විශාඛාව ලෙස ගුණ ගරුක වෙමු.

**කාලය** : මිනිත්තු 80 යි

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම : 3.3.1 ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්.
- හත්වනශ්‍රේණියට අදාළ පෙළපොත
- ඩිමයි කඩදාසි සහ මාකර් පෑන්.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 3.3.1 :**

- විශාඛාව පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම විමසන්න.
- පහත සඳහන් කරුණු අන්තර්ගත වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| - විශාඛාව බුදු සසුනේ අග්‍ර දායිකාව බව<br>- අංග ජනපදයේ භද්දිය නුවර ධනංජය සිටුතුමාගේ හා සුමනා සිටු දේවියගේ දියණිය විශාඛාව බව.<br>- ඇය බුදු සසුනේ චිරස්ථිතියට මහත් මෙහෙයක් කළ බව.<br>- විශාඛාව ආදර්ශවත් කාන්තාවක් බව. |

**පියවර 3.3.2** :

- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 3.3.1ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා ,ඩිමයි කඩදාසි සහ මාකර් පෑන් කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 3.3.3** :

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව දෙන්න.
- අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- විශාඛාව ළමා කළ සිටම ඉතා ශීලාචාරව ගත කළ බව.
- තම දෙමාපියන්ට කීකරුව කටයුතු කළ බව.
- තම සේවක සේවිකාවන්ට පමණක් නොව සතුන්ට පවා සැලකූ බව.
- කුඩා කල සිට උපායශීලී ව හා බුද්ධිමත්ව කටයුතු කළ බව.
- විවාහය නිසාවත් තම දහම වෙනස් නොකරන පිළිවෙතක සිටි බව.
- විවාහයෙන් පසුව ස්වාමි පාර්ශවයේ ඥාතීන් බුදු දහමට නැඹුරු කළ බව.
- බුදු සසුන වෙනුවෙන් මහත් මෙහෙවරක් ඉටු කළ බව.
- මිගාර මාතා යනු ඇයගේ ගුණයට පටබැඳුණු ගෞරව නාමයක් බව.
- විශාඛාව පිනට දහමට ලැදිව කටයුතු කළ බව.
- රෝගී භික්ෂූන් වහන්සේලාට කාරුණිකව උවටැන් කළ බව.
- " මේල පළඳනාව " විකුණා " පූර්වාරාමය " ඉදි කොට බුදු සසුනට පූජා කළ බව
- " මේල පළඳනාව " නම් හිසේ සිට පහතට වැටෙන සේ පළඳින කාන්තා ආභරණයක් බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- විශාඛාවගේ චරිතය විස්තර කරයි.
- විශාඛාවගේ චරිතයෙන් ලැබිය හැකි උතුම් ආදර්ශ රැසක් ඇති බව පිළිගනියි.
- විශාඛාවගේ චරිතයට ආරෝපනය වෙමින් කථා කරයි.
- ආදර්ශවත් චරිතාපදාන අධ්‍යයනය කරයි.
- ආදර්ශවත් ව හැසිරෙයි

ඇමුණුම 3.3.1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- පාඨ ග්‍රන්ථයේ අදාළ පාඩම කියවන්න.
- ගවේෂණ පත්‍රිකාවේ ඔබේ කණ්ඩායමට ලැබෙන පහත සඳහන් ක්‍රියාකාරකම කෙරෙහි අවධානය යොමු කරන්න.
- විශාඛාවගේ චරිතයේ වැදගත් සිදුවීම් පෙළගස්වන්න.
- විශාඛාවගේ චරිතය ඉගෙන ගැනීමෙන් ඔබේ ජීවිතය සකස් කර ගැනීම සඳහා ලබා ගත හැකි ආදර්ශ ලැයිස්තුවක් සකස් කරන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 03** : ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කරගනියි.

**නිපුණතා මට්ටම 3.4** : ධම්මපද ගාථා ඇසුරෙන් තම ජීවන දර්ශනය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි.

**ක්‍රියාකාරකම 3.4** : අනලස්ව වැඩ කරමු, ජීවිතය ජය ගනිමු.

**කාලය** : මිනිත්තු 80 යි

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 3.4. 1 ට අදාළ "උට්ඨානවතෝ සතිමතෝ " යන ධම්මපද ගාථාව ලියන ලද පුවරුවක්.
- ඇමුණුම : 3.4.2 ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් තුනක්.
- ඩිමයි කඩදාසි, මාකර් පෑන්.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 3.4 .1 :**

- ඇමුණුම 3.4.1 ට අදාළ ධම්මපද ගාථාව ලියූ පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
  එම ගාථාව සිසුන් සමග තාලයට නිවැරදිව සජ්ඣායනා කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - අදාළ ගාථාව ධම්මපදයේ අප්පමාද වග්ගයට අයත් බව.
> - කුම්භඝෝෂක නම් තැනැත්තකු අරබයා මෙම ගාථාව දේශනා කරන ලද බව.
> - මෙම ගාථාවේ පුද්ගල දියුණුවට හේතු වන කරුණු හතක් අඩංගු බව.

**පියවර 3.4. 2 :**

- පන්තිය කුඩා කණ්ඩායම් තුනකට බෙදන්න.
- ඇමුණුම 3.4.2 ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකා, ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 3.4. 3 :**

- කුඩා කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- අදාළ ධම්මපද ගාථාවෙහි, පුද්ගල ජීවිතයේ දියුණුවට මහෝපකාරී වන දහම් කරුණු හත පහත සඳහන් පරිදි බව.

    - උත්සාහය
    - මනා සිහිය
    - තම ක්‍රියාවන්ගේ පිරිසිදු (නිවැරදි ) බව.
    - විමසා බලා කටයුතු කිරීම
    - සංයමය
    - ධාර්මික ජීවනෝපායක යෙදීම
    - අප්‍රමාද බව

- කුම්භඝෝෂක නම් තරුණයා තම ජීවිත සාර්ථකත්වය අත්පත් කර ගැනීමට මෙම ගාථාවෙන් විස්තර කැරෙන කරුණු උපයෝගී කරගෙන ඇති බව.
- අපගේ ජීවිත දියුණුවටද මෙම කරුණු නිසැකවම උපකාර වන බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක:

- කුම්භඝෝෂක චරිතය විස්තර කර පුද්ගල දියුණුවට අදාළ වන ගුණාංග ගෙනහැර දක්වයි.
- ගාථාවට අදාළ දහම් කරුණු අනුගමනය කිරීමෙන් දියුණුව ළඟා කරගත හැකි බව පිළිගනියි.
- " උට්ඨානවතෝ සතිමතෝ " යන ධම්මපද ගාථාව නිවැරදිව ගායනා කරයි.
- ජීවිත සාර්ථකත්වයට ඉවහල්වන වෙනත් කරුණු පිළිබඳ විමසිලිමත් වෙයි.
- ජීවිත අභියෝග ජය ගනියි.

ඇමුණුම 3.4.2

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- පහත සඳහන් දහම් කරුණුවලින් එක් කණ්ඩායමකට කරුණු තුනක් සහ අනෙක් කණ්ඩායම් දෙකට කරුණු දෙක බැගින් ලැබෙන සේ අහඹු ලෙස තෝරා ගන්න.
    - උත්සාහය
    - මනාසිහිය
    - පිරිසිදු ක්‍රියා
    - විමසා බලා කටයුතු කිරීම
    - සංයමය ,
    - ධාර්මික බව
    - අප්‍රමාදී බව



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- තම කණ්ඩායමට ලැබෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- එම දහම් කරුණු ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් කරගත හැකි ආකාරය සොයා බලන්න.

- ඔබ කණ්ඩායමට ලැබුණු දහම් කරුණු මගින් කුම්භඝෝෂක තම ජීවිත සාර්ථකත්වය සඳහා උපයෝගී කරගත් ආකාරය විමසා බලන්න.
- ඔබේ කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 3.4.1

උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්සච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති

**නිපුණතාව 04** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 4.1** : සදාචාර සමාජයක් සඳහා පංචසීල ප්‍රතිපත්තිය උපයෝග වන බව පිළිගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**ක්‍රියාකාරකම 4.1** : දැහැමි සමාජයකට පන්සිල් සුරකිමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 4.1.1ට අදාළ කවිය ලියූ පුවරුවක්
- ඇමුණුම 4.1.2ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකා පහක්
- එක් එක් ශික්ෂා පදය හා අර්ථය ලියූ තීරු පත්‍රිකා පහක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

**පියවර 4.1.1** :
- ඇමුණුම 4.1.1 ට අදාළ කවිය ඇතුළත් පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම කවිය සාමූහිකව මිහිරි ලෙස එක් වරක් ගායනා කරන්න.
- කවියෙහි අරුත පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - ඉහත පද්‍යය වීදාගම මහා මෛත්‍රය හිමියන් රචනා කළ ලෝවැඩ සඟරාව කෘතියේ ඇතුළත් වන බව.
> - ප්‍රාණඝාතය කළ විට ලැබෙන දරුණු විපාක මෙම පද්‍යයෙන් විස්තර කැරෙන බව.
> - ප්‍රාණඝාතය නිසා සත්ත්වයකුට ජීවත්වීම සඳහා ඇති අයිතිය අහිමි කරන බව.
> - "පන්සිල් "නමින් ප්‍රාණඝාතයෙන් වැළකී සිටීම ඇතුලු ශික්ෂා පද පහක් ඇති බව.

**පියවර 4.1.2** : පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් පහකට බෙදන්න.

- ඇමුණුම 4.1.2 ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකා කණ්ඩායම්වලට ලබාදෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 4.1.3** :
- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ප්‍රාණඝාතයෙන් වැළකීම, සොරකමෙන් වැළකීම, කාම මිථ්‍යාචාරයෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම හා සුරාපානයෙන් වැළකීම පන්සිල් වන බව.
- පංචසීලය ගිහියාගේ නිත්‍ය සීලය ලෙස උගන්වා ඇති බව.
- පන්සිල් සුරකින සමාජයක ජීවිත ආරක්ෂාව, ධනය සුරැකීම. පවුල් ජීවිතවල මනා පැවැත්ම, බොරුවකට රැවටීමකට ගොදුරු නොවීම, සිහිනොමුලාව කටයුතු කිරීම, සභ්‍ය භාවය, නිරෝගිකම යන මූලික සාරධර්ම සුරැකෙන බව.
- පන්සිල් සුරැකීම සමාජ අභිවෘද්ධිය අපේක්ෂා කරන ඕනෑම කෙනකුට ඉතාමත් ඵලදායක වන බව.
- ඒ අනුව පංචශීල ප්‍රතිපදාව විශ්ව සාධාරණ ධර්මයක් බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- පන්සිල් සුරැකීමෙන් සමාජ පාරිශුද්ධිය සිදුවන අයුරු පැහැදිලි කරයි.
- පන්සිල් නොරැකීමෙන් සමාජ විනාශය සිදුවන බව පිළිගනියි.
- පන්සිල් පද නිවැරැදිව උච්චාරණය කර ඒවායේ සිංහල අරුත ප්‍රකාශ කරයි.
- සදාචාරවත්වීම සඳහා අදාළ වන වෙනත් ඉගැන්වීම් සෙවීමට උනන්දු වේ.
- නීතිගරුකව හැසිරෙයි.

ඇමුණුම 4.1.1

පෙර අඟනක් එක් එළුදෙනක හිස සිඳා
සිය ළඟ වැළඳි ගිනිදැල් නිරයෙ දුක් විඳා
ඇය ඇඟ ලෝම ගණනේ ඉස් කැපුම් ලදා
මෙම රහවේය කාටත් අකුසලේ ලෙදා

ලෝවැඩ සඟරාව

ඇමුණුම 4.1.2

### කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- පන්සිල්හි ඇතුළත් එක් එක් සිල්පදය සහ එහි අර්ථය ලියූ තීරු පත්‍රිකා එක බැගින් කණ්ඩායම්වලට ලබා ගන්න.
- කණ්ඩායමට ලැබුණු ශික්ෂාපදය රැකීමෙන් සමාජයට ලැබෙන ප්‍රයෝජන සහ එම ශික්ෂා පදය කැඩීමෙන් සමාජයට සිදුවන හානිය සාකච්ඡා කරන්න.
- එම තොරතුරු වෙන වෙන ම සටහන් කරන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

**නිපුණතාව 04** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 4.2** : පන්සිල් පාදක කොටගෙන තම ආධ්‍යාත්මික සංවර්ධනය ඇතිකර ගනියි.

**ක්‍රියාකාරකම 4.2** : පස්පව් නොකරමු. පන්සිල් සුරකිමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 4.2.1ට අදාළ කවිය ලියූ පුවරුව
- ඇමුණුම 4.2.2ට අදාළ කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්
- ඇමුණුම 4.2.2.1 සහ ඇමුණුම 4.2.2.2ට අදාළ පත්‍රිකා පිටපත් දෙකක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

**පියවර 4.2.1** :

- ඇමුණුම 4.2.1ට අදාළ කවිය ලියූ පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එය සිසුන් සමඟ මිහිරි ලෙස එක්වරක්ගායනා කරන්න.
- එහි අර්ථය සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - මෙම පද්‍යය වීදාගම මහා මෛත්‍රය හිමියන් විසින් රචිත ලෝවැඩ සඟරාව කෘතියේ ඇතුළත් වන බව.
> - පාපකාරී ක්‍රියාවන් මීපැණි ලෙස රස විඳිමින් සිදුකළත් දරුණු ගින්දරක් සේ එහි දුක් විපාක විඳීමට සිදුවන බව මෙම පද්‍යයෙන් විස්තර කැරෙන බව.
> - එවැනි නරක ක්‍රියාවන්ගෙන් මිදීමට බුදු දහම උපදෙස් දෙන බව.
> - පංචසීල ප්‍රතිපදාව එබඳු සුචරිතවත් ජීවිතයකට පදනම බව.

**පියවර 4.2.2** :

- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 4.2.2.1ට සහ ඇමුණුම 4.2.2.2ට අදාළ පත්‍රිකා, ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**පියවර 4.2.3** :

- කුඩා කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.
- උගත පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා හා අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- පන්සිල් නමින් හැඳින්වෙන ශික්ෂාපද පහ පහත සඳහන් බව.
  - පාණාතිපාතා වේරමණී සික්ඛාපදං
  - අදින්නාදානා වේරමණී සික්ඛාපදං
  - කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං
  - මුසාවාදා වේරමණී සික්ඛාපදං
  - සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං
- සීලයේ විරමණය හා සමාදානය යනුවෙන් අංශ දෙකක් ඇති බව.
- විරමණය යන්නෙහි සරල අදහස වැරදි කිරීමෙන් වෙන්වීම බව.
- සමාදානය යන්නෙහි සරල අදහස නිවැරදි දේ කිරීම බව.
- සිල් රැකීමෙන් චරිත සංවර්ධනය සිදුවන බව.
- ශීල ප්‍රතිපදාවෙහි ත්‍රිකෝටික පාරිශුද්ධි වශයෙන් අංශ තුනක් දක්වා ඇති බව.
- ධම්මික සූත්‍රයෙහි එය සඳහන් වන්නේ තමා වැරදි නොකිරීම, අන්‍යයන් ලවා වැරදි නොකරවීම, වැරදි කිරීමට අනුබල නොදීම යනුවෙන් බව.
- වේළුද්වාර සූත්‍රයේ දී එම කරුණු තුන තමා වැරදි නොකිරීමත්, අන්‍යයන් වැරදි වලින් වැළැක්වීමත්, වැරදි නොකිරීමෙන් ලැබෙන ආනිශංස කියාදීමත් යනුවෙන් සඳහන් වන බව.
- පන්සිල් රැකීමෙන් චරිතවත් වන පුද්ගලයාට විශාල මානසික සහනයක් මෙන්ම පූජනීය, ගෞරවනීය තත්ත්වයක් ලැබෙන බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ශීලයෙහි විරමණය හා සමාදානය යනු කුමක්දැයි පැහැදිලි කරයි.
- අන්‍යයන් වැරදිවලින් මුදවා ගැනීමට ක්‍රියාකිරීම අවශ්‍ය බව පිළිගනියි.
- සීල සමාදානයෙන් ලත් සහන පැහැදිලි කරයි.
- ජීවිතයේ ශික්ෂණය සඳහා වූ ක්‍රියා මාර්ග සොයයි.
- සුභ සාධන ක්‍රියාවල නිරත වෙයි.

ඇමුණුම 4.2.1

කරන කලට පව් මීරිය මීසේ
විඳින කලට දුක් දැඩිවෙයි ගිනිසේ
ඇඳින එපව් දුර ලන උපදේසේ
නුදුන මැනවි තුන්දොර අවකාසේ

ඇමුණුම 4.2.2

## කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්

- එක් කණ්ඩායමකට ඇමුණුම 4.2.2.1ට අදාළ පත්‍රිකාවේ පිටපතක් ද අනෙක් කණ්ඩායමට ඇමුණුම 4.2.2.2.ට අදාළ පත්‍රිකාවේ පිටපතක් ද ලබාගන්න.

- ඒවායෙහි පැහැදිලි කිරීමට උත්සාහ ගනු ලබන ශික්ෂා පද මොනවාදැයි හඳුනා ගන්න
- එම ශික්ෂාපද රැකීමෙන් ජීවිතයක් සුචරිතවත් වන අයුරු විමසන්න.

- ඔබට නියමිත පෙළ පොතින් සිල් රැකීම පිළිබඳ සඳහන් වන වෙනත් විශේෂ කරුණු සොයා සටහන් කරන්න.

- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

ඇමුණුම 4.2.2.1

තුනුරුවන් සරණ ගිය බෞද්ධයා උපාසක නමින් හැඳින්වෙන බව තෙරුවන් ගුණ පාඩමෙහි දැක්විණි. බෞද්ධ ගිහි සමාජයේ පුරුෂ පක්ෂය උපාසක නමින් ද ස්ත්‍රී පක්ෂය උපාසිකා නමින් ද හැඳින්වෙන බව අපි දනිමු. මෙම බෞද්ධ ගිහි සමාජය විසින් තම තමන් පිළිපැදිය යුතු මූලික ආචාර ධර්ම පද්ධතියක් ඇත. එනම් පන්සිල් නමින් හැඳින්වෙන ශික්ෂා පද පහයි.

1. ප්‍රාණ ඝාතයෙන් වෙන් වීම (පාණාතිපාතා වේරමණී)
2. නුදුන් දේ ගැනීමෙන් වෙන්වීම (අදින්නාදානා වේරමණී)
3. කාම මිථ්‍යාචාරයෙන් වෙන් වීම (කාමේසුමිච්ඡාචාරා වේරමණී)
4. බොරු කීමෙන් වෙන් වීම (මුසාවාදා වේරමණී)
5. රහ මෙර පානයෙන් වෙන් වීම (සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී)

පුද්ගලයාත් . සමාජයත් දූෂිත තත්ත්වයට පත් කෙරෙන දුසිරිත් පහකින් වෙන් වීම පඤ්ච සීලයෙන් අපේක්ෂා කෙරේ.

බුදු දහමෙහි ඉගැන්වෙන හැම ආචාර ධර්මයක් ම වාගේ කරුණාව හා මෛත්‍රිය පදනම් කොට ගෙන ඇත. කරුණාව නම් සමාජයේ දුකින් පෙළෙන්නවුන් සුඛිත කිරීමේ අදහසයි. මෛත්‍රිය නම් මුළු සමාජය ම මිත්‍රත්වයෙන් සැලකීම යි. මෙම කරුණා, මෛත්‍රී ගුණ දෙක මනුෂ්‍ය සමාජයට පමණක් නොව සියලු සත්ත්ව වර්ගයා වෙතට ද විහිදුවා ලිය යුත්තකි. ප්‍රථමයෙන්ම එය තමා වෙතට යොමු කර ගත යුතු ය. පන්සිල්වල මූලික අපේක්ෂාව වනුයේ පුද්ගලයා තමා කෙරෙහිත්, සියලු සත්ත්ව වර්ගයා කෙරෙහිත්, කරුණාවෙන් මෛත්‍රියෙන් ක්‍රියා කරන්නකු බවට පත් කිරීම යි.

පන්සිල් නොරක්නා පුද්ගලයා සුළං වදිමින් තෙමෙමින් ඉවත දමා තිබෙන යකඩ කැබැල්ලක් බඳු ය. එම යකඩයෙහි හට ගන්නා මලකඩ නිසා ම කාලයාගේ ඇවෑමෙන් එය විනාශයට පත් වෙයි. පන්සිල් නොරක්නා පුද්ගලයා ද තමා අතින් සිදු කර ගන්නා දුසිරිත් හේතු කොට ගෙන ප්‍රථමයෙන් තමා ම විපතට භාජනය කරයි. කුඩා කුඩා සතුන් මැරීමට පුරුදු වන පුද්ගලයා මනුෂ්‍ය ඝාතනය වැනි බරපතල අපරාධයක් කිරීමට ද යොමු වෙයි. සුළු සුළු සොරකමට පුරුදු වන පුද්ගලයා ගෙවල් බිඳීම , මං පැහැරීම වැනි සාහසික අපරාධයක් කිරීමට ද පෙළඹෙයි. වැරදි ලෙස කාමයෙහි ගිජු වීමෙන් පරපුරුෂ, පරස්ත්‍රී සේවනයටද පටන් ගනී. සිනා මුසු බසින් සුළු සුළු බොරු කියා අනුන් රැවටීමට හුරු වන පුද්ගලයා අධිකරණය ඉදිරියෙහි දී පවා බොරු සාක්ෂි දෙයි. සුළුවෙන් මත් ද්‍රව්‍ය පරිහරණයට ඇබ්බැහි වන පුද්ගලයා උපයා ගන්නා මුළු ධනය ම මත් පැනට කැප කොට අසරණ අසාධ්‍ය රෝගියෙකු බවට පත්වෙයි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පන්සිල් නොරකින පුද්ගලයා මෙසේ වරදට පෙළඹී යසසෙන් පිරිහෙයි, ධනයෙන් පිරිහෙයි, කායික මානසික සෞඛ්‍යයෙන් පිරිහෙයි, මෙලොවින් පිරිහෙයි, පරලොවින් පිරිහෙයි. තමා කෙරෙහි කරුණාව මෛත්‍රිය දක්වන කිනම් පුද්ගලයෙක් මෙ බඳු විපතක් තමාට සිදු කර ගනී ද?

පන්සිල් රකින පුද්ගලයා යසසින්, ධනයෙන්, සෞඛ්‍යයෙන් , මෙලොවින්, පරලොවින් දියුණුවට පත් වෙයි. එ නිසා පන්සිල් රැකීමෙන් පුද්ගලයා අතින් මූලික වශයෙන් සිදු වනුයේ තමාට හිත වැඩ සලසා ගැනීමක්, තමා වෙතට කරුණාව, මෛත්‍රිය පතුරුවා ගැනීමකි.

පන්සිල් රකින පුද්ගලයා මිනිස් සමාජය වෙතට, අනෙක් සියලු සත්ත්ව වර්ගයා දෙසට කරුණාව, මෛත්‍රිය විහිදු වන්නේ කෙසේ ද? ප්‍රාණඝාත යනු පර පණ නැසීම යි. මෙ ලොව වෙසෙන සෑම සත්ත්වයා ම ස්වකීය ජීවිතයට ඇලුම් කරයි. ජීවත් වීමට කැමති වෙයි. එසේ ජීවිතයට ප්‍රිය කරන , ජීවත් වීමට කැමති සත්ත්වයකු ගේ ජීවිතයට හානි පැමිණවීම බලවත් ද්‍රෝහි ක්‍රියාවකි. නුවණැති පුද්ගලයා තමාගේ ජීවිතය තමාට ප්‍රිය වන්නා සේ අනිකාගේ ජීවිතය ද අනිකාට ප්‍රිය බව සිතා බලා අනුන්ගේ ජීවිතයට හානි නොපමුණුවයි. අනුන් ලවා එ බන්දක් නොකරවයි. එයින් වෙන් වීමේ ගුණ වර්ණනා කරයි. මෙසේ හෙතෙම පන්සිල්වල එන ප්‍රථම ශික්ෂා පදය රකිමින් , සමාජයේ ජීවත් වන අනිකකුට ස්වකීය ජීවිතය ගැන කිසිදු බියක් නැතිව ජීවත් වීමට මග පාදයි.

තමා දහඩිය හෙළා උපයා ගන්නා ධනය, අනෙකකු සොරා ගැනීම හෝ පැහැර ගැනීම ගැන තමා අකමැති වන්නා සේ , අනෙකා ද ස්වකීය ධනය තවකෙකු පැහැර ගැනීම නො ඉවසයි. මෙසේ සිතා බලා අදත්තාදානයෙන් තෙමේ ද වැළකී, අනුන් ද එයින් වළක්වන, එසේ වැළකී සිටීමේ ගුණ කියන්නා පන්සිල්වල දෙවන ශික්ෂා පදය රක්නේ වෙයි. සමාජයේ වෙසෙන කිසිවකු ගේ ධනය රැක ගැනීම පිළිබඳ බියක් ඔහුගෙන් ඇති නොවේ.

ඇමුණුම 4.2.2.2

පුද්ගලයෙකුට නීත්‍යානුකූල අවාහ - විවාහ සබඳතා මගින් පවුල් ජීවිතයට පිවිස කම් සැප විඳිමින් කල් ගෙවීමට බුදු දහමෙන් බාධාවක් නැත. එබඳු නීත්‍යානුකූල පවුල් ජීවිත කඩාකප්පල් වී යන අයුරින් අන්‍යයන්ගේ අඹුවන් නොවෙතත් කාන්තාවන් හෝ ඇසුරු කරන පුද්ගලයෝ ද, අන්‍ය පුරුෂයන් ඇසුරු කරන කාන්තාවෝ ද තමාට නීත්‍යානුකූල ව හිමි නොවූ කම් සැප සොයන්නෝ ද, කාමමිච්ඡාචාරයෙහි (වැරදි මගින් කම් සැප සෙවුමෙහි) යෙදෙන්නෝ වෙති. බුද්ධිමත් පුද්ගලයා නොමගින් කම්සැප සෙවුම බලවත් සමාජ විරෝධී ක්‍රියාවක් බව මැනවින් වටහා ගනී. තමා සතු කම් සැපතක් අනුන් පරිහරණය කිරීම ගැන තමා අකැමැති වන්නා සේ , අනුන් ද එබඳු දේට අකැමැති බව සිතා බලා අනුන්ගේ කාම වස්තු පරිහරණයෙන් ඈත් වෙයි. එබන්දක් කිරීමට අනුන්ට ද ඉඩ නො දෙයි. එයින් වැළකී සිටීමේ අනුසස් කියා දෙයි. මෙසේ පන්සිල්වල එන තුන් වන ශික්ෂා පදය රකින පුද්ගලයා ගෙන් අන්‍යයන්ගේ පවුල් ජීවිතවලට, කුල කාන්තාවන්ට බියක්, තැති ගැන්මක් ඇති නොවේ.

සත්‍ය වචන කථා කරන්නා කිසි විටෙකත් අනුන් නො රවටයි. ඔහු කියනදේ විශ්වසනීය වෙයි. හෙතෙම කිසිවෙකු කිසි විටෙකත් නොමඟ නොයවයි. යම් කිසිවකු බොරුවෙන් රවටනවාට තමා අකැමැත්තා සේ අනුන් ද එ බන්දකට අකැමැති බව සිතන හේ සත්‍ය වචනම කථා කරයි. සත්‍ය වචන කථා කිරීමට අනුන් ද පොළඹවයි. සත්‍ය වචන කථා කිරීමේ අගය කියා දෙයි. මෙසේ පන්සිල්වල හතර වන ශික්ෂා පදය රකින පුද්ගලයා ගෙන් සමාජය රැවටීම පිළිබඳ බියක් ද ඇති නොවේ. බොරු නොකියන තැනැත්තාට ආරක්ෂාව සැළසේ.

මත් ද්‍රව්‍ය පරිහරණය නොකරන්නවුන් වෙසෙන නිවෙස්, ගම් කෙතරම් සාමකාමී ද? මත් ද්‍රව්‍යයන්ගෙන් සිහි විකල කර ගන්නවුන් ගේ උමතු කථා , උමතු හැසිරීම, අරගල, අඩදබර නැති සමාජය කෙතරම් සාමකාමී ද? පන්සිල්වල පස් වන ශික්ෂා පදය රැකීමෙන් සමාජයට සාමය, සැනසිල්ල උදා කර ගත හැකි බව ඒ අනුව තේරුම් ගත හැකි ය.

ලුහුඬින් දක්වතොත් පන්සිල් රකින්නාට ජීවිතාරක්ෂාව, ධනය රැක ගැනීම, පවුල් ජීවිතවල මනා පැවැත්ම, රැවටිල්ලට ගොදුරු නොවීම, හා අවංක භාවය, සාමකාමීව කල් ගෙවීම යන මූලික සමාජ අවශ්‍යතා නිතැතින්ම ඉටු වේ. එ බඳු පුද්ගලයන් ජීවත් වන සමාජයක පැවැත්මට අපරාධ අධිකරණ , දණ්ඩ නීතිය, දණ්ඩනය යන අංශ අත්‍යවශ්‍ය නොවේ. රටක මෙම අධිකරණමය අංශ ක්‍රියාත්මක වනුයේ අපරාධකරුවන් ගෙන් පැමිණිය හැකි උවදුරුවලින් සාමකාමී පුරවැසියන් රැකගැනීමට ය. පොදු ජනතාව බියෙන් මුදවා ගැනීමට ය. අතීතයෙහි අප රටේ මැනවින් හැඳ පැළඳගත් කාන්තාවකට හුදෙකලාව රටේ එක් කොනක සිට අනෙක් කොනට තනි වම නො බිය ව ගමන් කළ හැකි වූයේ එදා පන්සිල් රකින සමාජයක් පැවති හෙයිනි. මෙයින් හෙළි වනුයේ පන්සිල් රකින්නා සමාජයට අභයදායකයකු වන බවයි.

බෞද්ධ උපාසකයකු ගේ නිත්‍ය ශීලය, පංච ශීල යයි. හෙතෙම තුනුරුවන් සරණ ගොස්, තුනුරුවන් ඉදිරියේ තබා ගෙන, පන්සිල් සමාදන් වෙයි. තුනුරුවන් ගුණ අදහන, එම ගුණයට ගරු කරන පුද්ගලයා විසින් තුනුරුවන් පිදිය යුත්තේ ප්‍රතිපත්ති පූජාවෙනි. පන්සිල් රැකීම තුනුරුවන් සඳහා කෙරෙන මූලික ප්‍රතිපත්ති පූජාවයි. පන්සිල් කඩ කරන තැනැත්තා කෙතරම් පාළි ගාථා, පාළි පාඨ කියමින් තුනුරුවන් වැන්දත් එය එතරම් ඵල දායී නොවේ. එනිසා බෞද්ධයන් වශයෙන් නිති පතා පන්සිල් සමාදන් වෙමින් තමා සමාදන් වී සිටින ශීලය සිහි පත් කළ යුතු අතර, දිවි දෙ වන කොට එය රැකීමට වෙහෙසිය යුතු ය.

මිනිසා ශාරීරික අවයවයන් රැක ගැනීමට ධනය වැය කරයි. ජීවිතය රැක ගැනීමේ අවශ්‍යතාව ඇති වූ විට එම ශාරීරික අවයව ද ඉවත් කිරීමට ඉඩ දෙයි. මැනවින් ගුණ දහම් රකින්නා ස්වකීය ගුණ දහම් රැක ගැනීමට ධනය, ශාරීරික අවයව, ජීවිතය යන සියල්ල කැප කරයි.

නිවන් ලබා ගැනීමට බලාපොරොත්තු වන පුද්ගලයා මූලික වශයෙන් කායික, වාචසික සංවරයක් ඇති කර ගත යුතු ය. සීලයෙන් එය ඉටු වේ. පංච ශීලය, එම සංවරයේ ආරම්භක අවස්ථාවයි. එහි එන 1,2.3,5 ශික්ෂා පද වලින් කායික සංවරයට මඟ පෑදේ. හතර වන ශික්ෂා පදයෙන් වාචසික සංවරයට අවශ්‍ය මූලික පදනම වැටේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 04** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 4.3** : බෞද්ධ සමාජ ධර්ම වලට අනුගතවෙමින් ගුරු සිසු සබඳතා ගොඩනගා ගනියි.

**ක්‍රියාකාරකම 4.3** : ගුරු සිත නොරිදවා
අකුරු උගනිමු සොඳවා

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 4.3.1ට අදාළ පද්‍යය ලියූ පුවරුව
- ඇමුණුම 4.3.2ට අදාළ කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්
- ඇමුණුම 4.3.2.1 සහ ඇමුණුම 4.3.2.2ට අදාළ පත්‍රිකාවන්හි පිටපත් එක බැගින්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

**පියවර 4.3.1** :

- ඇමුණුම 4.3.1ට අදාළ පද්‍යය ලියූ පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම පද්‍යය සාමූහිකව මිහිරි ලෙස එක් වරක් ගායනා කරන්න.
- එහි අර්ථය සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| - මෙම පද්‍යය තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත කාව්‍යශේඛරය කෘතියේ ඇතුළත් වන බව.<br>- මෙයින් පැහැදිලි වන්නේ ශිෂ්‍යයකු ගුරුවරයා කෙරෙහි භක්ත්‍යාදරය උපදවා ගෙන නියමිත වේලාවට පැමිණ ගුරුතුමාගේ සිත නොරිදවා මැනවින් ඉගෙන ගත යුතුය යන්න බව.<br>- එසේ කටයුතු කරමින් ඉගෙන ගැනීම ශිෂ්‍යයාගෙන් ගුරුතුමාට ඉටුවිය යුතු යුතුකමක් බව.<br>- මෙවැනි යුතුකම් සිගාලෝවාද සූත්‍රයෙහිද ඇතුළත් වන බව. |

**පියවර 4.3.2** :

- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 4.3.2.ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා දෙක , ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

ජියවර 4.3.3 :

) කුඩා කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.

) උගන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.

) අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා හා අදහස් විමසන්න.

) පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

) යුතුකම් යනු පැහැර හැරීමට නොහැකි ක්‍රියා බව.
) යුතුකම් ඉටු කිරීම පිළිබඳ බුදුරදුන් දැඩි අවධානය යොමුකර ඇති බව.
) සිගාලෝවාද සූත්‍රයේ සදිසා සමාජ ක්‍රමයෙන් ඒවා පැහැදිලි කරන බව.
) එහිදී දකුණු දිසාව වශයෙන් ගුරුවරුන් හඳුන්වා ඇති බව.
) සිසුන් කෙරෙහි අනුකම්පාවෙන් ගුරුතුමා තම යුතුකම් ඉටුකරන බව. ඒවා :
    ) ශිෂ්‍යයා මැනවින් හික්මවීම.
    ) ශිෂ්‍යයාට මැනවින් ඉගැන්වීම.
    ) ගුරු මුෂ්ටි තබා නොගෙන ශිෂ්‍යයාට අවශ්‍ය සියලුම ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම.
    ) ශිෂ්‍යයා තම මිතුරන්ට හඳුන්වා දීම.
    ) ශිෂ්‍යයා උවදුරුවලින් රැකගැනීම.
    යනුවෙන් නම් කර ඇති බව .
) තමා කෙරෙහි අනුකම්පාවෙන් යුතුකම් ඉටුකරන ගුරුවරයාට ශිෂ්‍යයාගෙන්ද යුතුකම් ඉටුවිය යුතු බව.
) එම යුතුකම්
    ) ගුරුවරයා දුටුවිට හුනස්නෙන් නැගිටීම.
    ) ගුරුවරයාට උපස්ථාන කිරීම.
    ) ගුරු බසට ඇහුම්කන් දීම.
    ) ගුරුවරයාට අවශ්‍ය කටයුතු ඉටුකර දීම.
    ) මැනවින් ශිල්ප උගෙනීම .
    යනුවෙන් නම්කර ඇති බව
    ) ගුරුතුමා හා ශිෂ්‍යයා අතර පිය පුතු සම්බන්ධයක් පවතින බව.
    ) ගුරුතුමාට "ගුරු පියාණෝ " යනුවෙන් ද ගුරුතුමියට "ගුරු මෑණියෝ " යනුවෙන් ද ඇමතීමට ශිෂ්‍යයකු පුරුදු විය යුතු බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

) සිගාලෝවාද සූත්‍රයේ එන ගුරු ශිෂ්‍ය අන්‍යෝන්‍ය යුතුකම් විස්තර කරයි.
) ගුරු පියවරුන් ගුරු මෑණිවරුන් අබියස ආචාරශීලීව හැසිරිය යුතු බව පිළිගෙන ජීවිත කාලය පුරා එය පවත්වාගෙන යෑමට පෙළඹේ.
) යුතුකම් ඉටුකිරීමේ වැදගත්කම ගවේෂණය කරයි.
) හැඟීමෙන් යුතුව කළගුණ සලකයි.
) මනා සමාජ සම්බන්ධතාවක් ගොඩ නගයි.

| | | | |
|---|---|---|---|
| ගුරු සිත | නොරිද | වා | ඇමුණුම 4.3.1 |
| වේලාව | නොවරද | වා | |
| බැති පෙම් | උපද | වා | |
| අකුරු උගනි කුමරු සොඳ | | වා | |



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 4.3.2

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- එක් කණ්ඩායමකට ඇමුණුම 4.3.2.1ට අදාළ ශිෂ්‍යයකු විසින් ගුරුවරයාට ඉටුකළ යුතු යුතුකම් දැක්වෙන පත්‍රිකාවේ පිටපතක් ද
 අනෙක් කණ්ඩායමට ඇමුණුම 4.3.2.2.ට අදාළ ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටුකළ යුතු යුතුකම් දැක්වෙන පත්‍රිකාවේ පිටපතක් ද ලබා ගන්න.

- ශිෂ්‍යයකු ගුරුතුමා අබියස ක්‍රියා කළයුතු අයුරු හා ශිෂ්‍යයකු ගුරුවරයාට ඉටු කළ යුතු යුතුකම් මොනාවාදැයි එම පත්‍රිකා ඇසුරෙන් සටහන් කරන්න.

- ගුරුවරයකු ශිෂ්‍යයාට ඉටුකළ යුතු යුතුකම් හා ගුරුතුමා ශිෂ්‍යයකුට ශිල්ප ලබා දීමට කටයුතු කරන අයුරු සටහන් කරන්න.

- ඔබේ අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 4.3.2.2

ගුරුවරුන් , යහපත් ශිෂ්‍යයාට කරුණු පහකින් සංග්‍රහ කරන බව බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයෙහි දී දෙසූ සේක. එනම්:

1. ශිෂ්‍යයා මැනවින් හික්මවීම.
2. ශිෂ්‍යයාට මැනවින් ඉගැන්වීම.
3. ගුරුමුෂ්ටි තබා නොගෙන ශිෂ්‍යයාට අවශ්‍ය සියලුම ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම.
4. ශිෂ්‍යයා මිතුරන්ට හඳුන්වා දීම
5. ශිෂ්‍යයා උවදුරුවලින් රැක ගැනීම යනුයි.

- රෝස කැකුළක් මෝරන විට එය පැහැයෙන් ද, සුවඳින් ද, වැඩි වෙයි. එමෙන් ම ශිෂ්‍යයකු වශයෙන් මෝරන තැනැත්තා ගුණ නුවණ දෙකින් ද මේරිය යුතුය. ගුණ නම් යහපත් පැවැත්වීමයි. නුවණ නම් හොඳ නරක වටහා ගැනීමේ ශක්තියයි. මේ දෙක එක් වූ විට හික්මීම ඇති වේ. ශිෂ්‍යයාගේ ගුණ නුවණ දියුණු කොට හික්මීම ලබා දෙන්නෝ ගුරුවරුය. ශිෂ්‍යයාට . එමගින් සමාජයට හිතවත්, සමාජය ප්‍රිය කරන පුද්ගලයකු වීමට පිළිවන.

- ඖෂධවල ගුණ දන්නා දක්ෂ වෛද්‍යවරයා නොයෙක් මුල්වර්ග ආදිය එක් කොට ගෙන අගනා ඖෂධයක් තනයි. එසේ ම ගුරුතුමා ද ශිෂ්‍යයා තුළ ඇති නොයෙක් කුසලතා නිසි සේ මෙහෙයවා යහපත් පුරවැසියකු බවට පත් කරයි. ශිෂ්‍යයාගේ දුබලතා තේරුම් ගෙන. ඒවා මඟ හරවා ගැනීමට උපදෙස් දෙයි. මේ අයුරින් ගුරුතුමා යහපත් ශිෂ්‍යයාට උගැන්වීම සඳහා බොහෝ වෙහෙසයි.

- අතීතයෙහි අද මෙන් පොත පත සුලභ නො වීය. එනිසා ශිෂ්‍යයෝ සියලු ම කරුණු ගුරුතුමාගෙන් අසා ගෙන ම උගත්හ. බොහෝ ගුරුවරු ශිල්ප ශාස්ත්‍ර පිළිබඳ ඇතැම් වැදගත් කරුණු රහස් වශයෙන් තබා ගත්හ. එය ගුරු මුෂ්ටි නම් වේ. එයින් ඇඟවෙන්නේ ශිෂ්‍යයාට ගුරුවරුන් දන්නා ශිල්ප ශාස්ත්‍රවල හැම වැදගත් අංශයක් ම උගෙනීමට නොලැබෙන බවයි. “ගුරුදෙව් වරු” ගුරු මුෂ්ටි තබා නොගනිති.

- තමාගේ ශිෂ්‍යයා දියුණු වනු දැකීම තරම් ප්‍රීති දායකවූ තවත් දෙයක් ගුරුතුමාට නැත. එසේ දියුණු වූ ශිෂ්‍යයා ගැන බොහෝ විට සඳහන් කරමින් ඒ මගේ ගෝලයෙක් යනුවෙන් ගුරුවරුන් කියනු ඔබ ද නොයෙක් වර අසා ඇත. ගුරුතුමා එබඳු ශිෂ්‍යයා හිතමිතුරන්ට හඳුන්වා දෙයි. එය ශිෂ්‍යයාට සමාජ සම්බන්ධතා ඇති කර ගනිමින් , කීර්තිමත් පුද්ගලයකු වශයෙන් ජීවත් වීමට ඉවහල් වේ.

5. ශිෂ්‍යයා වයසින් මෝරන විට සම වයස් කණ්ඩායම්වලට සම්බන්ධ වී කටයුතු කිරීමට පෙළඹෙයි. ඇතැම් පුද්ගලයන් ඇසුරු කිරීමෙන් ඔහුගේ දියුණුව සැලසෙන අතර සමහර පුද්ගලයන් ඇසුරු කිරීමෙන් ශිෂ්‍යයා ඈත් විය යුතු ය. ඒ සඳහා මග පෙන්වන්නෝ ද ගුරුවරුය. තම ශිෂ්‍යයා සියලු උවදුරුවලින් මුදවාගෙන කටයුතු කරති.

මෙසේ ගුරුතුමා ශිෂ්‍යයාගේ දියුණුවට අපමණ උදවු වන නිසා, එතුමාට ගුරු පියාණෝ යනුවෙන් අතීතයෙහි දී ඇමතූහ. ඔබ ද ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට උදවු වන ගුරුතුමා ගුරු පියාණෝ වශයෙන් ද ගුරුතුමිය ගුරු මෑණියන් වශයෙන් ද සැලකීමට පුරුදු වෙන්න.

ඇමුණුම 4.3.2.1

දෙමාපියන්ගේ අගය කලින් පාඩමෙහි දී ඔබට උගෙනීමට ලැබිණි. ඔබේ ජීවිතය හැඩ ගසා ගැනීමට උදවු වන තවත් එබඳු ම පිරිසක් ඇත. එනම්, ගුරුවරුයි. ගුරුවරු ඔබ වෙනුවෙන් කෙතරම් වෙහෙසෙත් දැයි සිතා බලන්න. ඔවුහු අපමණ වෙහෙස වී තමන් ලබා ගත් දැනුම කිසිදු අඩුවක් නැති ව ඔබට බෙදා දෙති. ඔබේ දැනුම දියුණු කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම ද කරති. ඔබ වටිනා පුරවැසියකු බවට පත් කිරීමට නිතර සැලකිල්ලක් ලැබීමට ඔවුහු සුදුසු වෙති. ශිෂ්‍යයාගේ දක්ෂිණාවන් (පුද පඬුරු ආදිය) ලැබීමට ගුරුවරුන් සුදුසු වන හෙයින්, ඔවුහු දක්ඛිණ දිසා නමින් හැඳින්වෙති.

ශිෂ්‍යයකු පස් ආකාරයකින් ගුරුවරයාට සැලකිය යුතු බව සිඟාලෝවාද සූත්‍රයෙහි දී බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

- ගුරුවරයා දුටු විට හුනස්සෙන් නැගිටීම (උට්ඨාන)
- ගුරුවරයාට උපස්ථාන කිරීම (උපට්ඨාන)
- ගුරු බසට ඇහුම්කන් දීමේ කැමැත්ත (සුස්සුසා)
- ගුරුවරයාට අවශ්‍ය කටයුතු ඉටු කර දීම (පාරිචරියා)
- මැනවින් ශිල්ප උගෙනීම (සක්කච්ච සිප්ප පටිග්ගහන) යනු එම පස් ආකාරයයි.

ඈත අතීතයේ ශිෂ්‍යයෝ බොහෝ විට ගෙදරම නතර වී අධ්‍යාපනය ලැබූහ. ඔවුහු මෙම පස් ආකාරයෙන් ම ගුරුවරයාට සැලකූහ. ඔබ අද අධ්‍යාපනය ලබනුයේ පාසලෙනි. එදා ශිෂ්‍යයා මුළු දවසම ගුරුවරයා ඇසුරු කරමින් සැලකිලි දැක්වීය. අද එය පැය පහක්, හයක් පමණ වූ සුළු කාලයකට සීමා වී ඇත.

ගුරුවරුන්ට සුදුසු ආචාර සමාචාර පැවැත්වීම ශිෂ්‍යයා විසින් කුඩා කල සිට ජීවිතාන්තය දක්වා පිළිපැදිය යුතු වැදගත් චාරිත්‍රයකි. ගුරුවරුන් දුටු විට හුනස්නෙන් නැඟිටීම. ආචාරශීලීව ගුරුවරුන් සමඟ කතා බහ කිරීම ආදියෙන් ගරු බුහුමන් දැක්වීම ශිෂ්‍යයාට පහසුවෙන් කළ හැකිය.

ගුරුතුමා වෙතට එළඹ සැප දුක් විචාරා සැප පහසුකම් සලසා දීමට හැකි නම්, එය ඉතා අගනේ ය. පැරණි ශිෂ්‍යයා අතින් ඒ යුතුකම ද ඉටු විය. ගුරුතුමාගේ වචනයට ඇහුම්කන් දීම, ශිෂ්‍යයාගේ දියුණුවට අත්‍යවශ්‍ය වූවකි. ගුරුතුමා දෙන අවවාද අනුශාසනා නොකඩවා පිළිපැදීම එයින් අදහස් කෙරේ. එසේ කළ විට ශිෂ්‍යයාට පහසුවෙන් දියුණු විය හැකිය. ගුරු සිත දිනාගෙන උගෙනීමේ කටයුතු කර ගෙන යෑමට ද පිළිවන් වනු ඇත. ගුරුතුමාට උදව් උපකාර ආදියක් කළ හැකි නම් , එය ආදර සිතින් ම ඉටු කර දීමට උත්සාහ ගැනීම යහපත් ශිෂ්‍යයකුගේ ලක්ෂණයකි. ශිෂ්‍යයා මෙම කරුණු ඉටු කරන ගමන් ම , උගෙනීමේ කටයුතු ගැන ද ඉතා සැලකිලිමත් විය යුතු ය. ගුරුතුමා උගන්වන ශිල්ප ශාස්ත්‍ර මැනවින් උගත යුතු ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 05** : ජීවී අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 5.1** : තමා උපමාවට ගනිමින් ජීව හිතවාදී ආකල්ප ගොඩ නගා ගනියි.

**ක්‍රියාකාරකම 5.1** : තමා මෙන් ලෝ සත සුරකිමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 5.1.1ට අදාළ ධම්මපදයේ ගාථාව ලියූ පුවරුව
- ඇමුණුම 5.1.2ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 5.1.1** :
- ඇමුණුම 5.1.1ට අදාළ ධම්මපදයේ ගාථාව ලියූ පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් සමග එම ගාථාව වරක් සජ් ධ්‍යායනා කරන්න.
- එයින් විස්තර කෙරෙන්නේ කුමක්දැයි සිසුන්ගෙන් පෙරදැනුම විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - මෙම ගාථාව බෞද්ධයාගේ අත්පොත වන ධම්මපදයේ දණ්ඩ වග්ගයේ සඳහන් වන්නක් බව.
> - සියලු සත්ත්වයන් දඬුවමට බියවන අතර ජීවිතයට ප්‍රිය කරන බැවින් තමා උපමා කොටගෙන හිංසා නොකරන්න පරපණ නොනසන්න යනු එහි අරුත බව.
> - මෙසේ තමා උපමාවට ගනිමින් සියලු ජීවීන් කෙරෙහි හිතවාදීව කටයුතු කිරීම අත්තූපනායික ධර්මයක් බව.
> - අත්තූපනායික ධර්ම පර්යාය පිළිබඳව වේලුද්වාර සූත්‍රයේද පැහැදිලි කැරෙන බව.

**පියවර 5.1.2** :

- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 5.1.2ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා , ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

ජියවර 5.1.3 :

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමටම පළමු අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා හා අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - බුදුරජාණන් වහන්සේ කොසොල් රට. වේලුද්වාර ගමෙහි වැසියන් උදෙසා ඔවුන්ගේ ආරාධනාව පරිදි මෙම සූත්‍රය දෙසූ බව.
> - මෙම සූත්‍රයෙන් ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාචා. පරුෂා වාචා, සම්පප්ප්‍රලාප (හිස් වචන) යන අකුසලයන්ගෙන් තමා උපමා කොටගෙන වැළකිය හැකි අයුරු පැහැදිලි කැරෙන බව.
> - එය අත්තූපනායික ධර්මපර්යාය නමින් හැඳින්වෙන බව.
> - ඒ අනුව කාය සංවරයෙන් හා වාක් සංවරයෙන් යුක්ත වන අයුරු පැහැදිලි කැරෙන බව.
> - මේ තුළින් ජීව හිතවාදි ආකල්පයක් ඇති කරගත යුතු බව.
> - තමා හිංසන, පීඩන, ඝාතන, වංචා ආදිය නොකළ යුත්තේ තමාද හිංසාවට, පීඩාවට, ඝාතනයට නොකැමැති නිසා බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- අත්තූපනායික ධර්ම පර්යාය යනු කුමක්දැයි විස්තර කරයි.
- තමා උපමාවට ගනිමින් වැරදි නොකර සිටීමට පෙළඹේ.
- වේලුද්වාර සූත්‍රයේ නිදාන කථාව ලියා දක්වයි.
- හිංසනයෙන් වළකී.
- තමාට හා අන් අයට පොදු වූ ප්‍රාර්ථනා හා අපේක්ෂා සසඳා බලයි.

ඇමුණුම 5.1.1

සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා
න හනෙය්‍යා න ඝාතයේ

ඇමුණුම 5.1.2

## කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- ඔබේ පෙළපොතේ අදාළ පාඩමට අවධානය යොමු කරන්න.
- එහි දැක්වෙන පරිදි වේලුද්වාර සූත්‍රයෙන් තමා උපමාවට ගනිමින් අකුසල් කිරීමෙන් වැළකෙන අයුරු පැහැදිලි කර ඇත්තේ කෙසේදැයි සොයා බලන්න.
- ඔබේ පිළිතුරු කණ්ඩායම සමග සාකච්ඡා කර සටහන් කරන්න.
- එම පිළිතුරු සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 05** : ජීවී අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 5.2** : මානව සබඳතා පවත්වා ගැනීමට ස්ථානෝචිතව හා අවස්ථාවෝචිතව ක්‍රියා කරයි.

**ක්‍රියාකාරකම 5.2** : නිසි තැන නිසි ලෙස හැසිරෙමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 5.2.1ට අදාළ වගුව ලියන ලද කාඩ්පත
- ඇමුණුම 5.2.2ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

**පියවර 5.2.1** :

- ඇමුණුම 5.2.1ට අදාළ වගුව ලියන ලද කාඩ්පත පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම වගුව පිටපත් කරගෙන සම්පූර්ණ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඔවුන් සම්පූර්ණ කළ වගුව නිරීක්ෂණය කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - ශීලය, ගුණය හා නුවණ, වයස, තනතුර ආදියෙන් උසස් අයට ගෞරවය රැකෙන පරිදි ඇමතිය යුතු බව.
> - භික්ෂූන් වහන්සේට ඇමතීම සඳහා විශේෂ ශාසනික වචන ඇති බව.
> - ස්ථානයට ගැලපෙන සේ කථා බහ කළ යුතු බව.
> - අන්‍යෝන්‍ය සුහදතාව හා ගෞරවය රැකෙන පරිදි කථා බහ සහ හැසිරීම සිදුවිය යුතු බව.

**පියවර 5.2.2** :

- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 5.2.2ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා , ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 5.2.3 :**

) කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
) ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමටම පළමු අවස්ථාව ලබා දෙන්න.
) අනෙක් කණ්ඩායමෙහි සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
) පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| | |
|---|---|
| ) විහාරස්ථානය ආශ්‍රිත විශේෂ වූ යෙදුම් ඇති බව. | |
| යනවා | - වඩිනවා |
| කනවා | - වළඳනවා |
| නානවා | - පැන්පහසුවනවා |
| ඇතුගානවා | - අමදිනවා |
| මල් කඩනවා | - මල් නෙලනවා |
| ඔබ | - ඔබ වහන්සේ |
| මිදුල | - මලුව |
| බෝධිය | - බෝධීන් වහන්සේ |
| වෙහෙර | - වෙහෙර වහන්සේ |
| විහාරය | - විහාර මන්දිරය |
| පුටුව | - ආසනය |
| ඔව් | - එහෙමයි , එහෙයි ,ආදී වශයෙන්) |

) විහාරස්ථානයේ දි ශබ්ද නගා අනවශ්‍ය ලෙස කෑ ගැසීම සුදුසු නැති බව.
) උඹ, වරෙන් , පලයන් වැනි වචන භාවිත නොකළ යුතු බව.
) සිත, කය, වචන යන තිදොර සංවර කර ගනිමින් කථා බහ කළ යුතු බව.
) පාසල් පරිශ්‍රය තුළ දී මෙන්ම බාහිර පරිසරයේදී ද ගුරු මෑණිවරු,ගුරු පියවරු,ඔබතුමා, ඔබතුමිය වැනි පියකරු වදන් භාවිත කළ යුතු බව.
) පාසල් දරු දැරියන් අතර ද මිහිරි වදන් හුවමාරු කරගත යුතු බව.
) පාසල් පරිසරයට නොගැලපෙන වචන භාවිත නොකළ යුතු බව.
) ගෞරවනීයත්වයක් හා ප්‍රසන්න බවක් ඇතිවෙන අයුරින් වදන් හැසිරවිය යුතු බව.
) පන්සලට හා පාසලට සුදුසු ඇඳුමකින් සැරසී යා යුතු බව.
) තෙරුවන් පිළිබඳ ඇති ගෞරවයත් තමාගේ හෝ අන් අයගේ ගෞරවයත් රැකෙන පරිදි හැසිරිය යුතු බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

) ස්ථානෝචිතව වදන් භාවිත කිරීමේ අගය පැහැදිලි කරයි.
) අන්‍යෝන්‍ය ගෞරවය සුරැකෙන පරිදි හැසිරිය යුතු බව පිළිගනියි.
) ස්ථානයට හා පුද්ගලයාට ගැලපෙන සේ කථා බහ කරයි.
) තම ගෞරවය රැක ගනියි.
) ප්‍රියශීලීබවට යොමුවෙයි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 5.2.1

පහත සඳහන් වගුවෙහි ඇති පුද්ගල නාම වලට ගැලපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.

| ස්වාමීන් වහන්සේ | ගුරුතුමා |
|---|---|
| | |

(දේශනා කරති, යයි, නිදයි, සැතපෙයි, වඩියි)

ඇමුණුම 5.2.2

## කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- පහත සඳහන් උපදෙස් වලට ඔබේ අවධානය යොමු කරන්න.
- විහාරස්ථානය ආශ්‍රිතව කථාබහේ දී යෙදෙන විශේෂ යෙදුම් ලේඛනගත කරන්න.
- විහාරස්ථානයක හැසිරීමේදී විශේෂයෙන් අවධානයට ගත යුතු කරුණු ලැයිස්තු ගත කරන්න.
- පාසල් ප්‍රජාව අතර අන්‍යෝන්‍ය ගෞරවය රැකෙන පරිදි හැසිරිය යුතු ආකාරය අංක පිළිවෙළින් ලියන්න.
- සමස්ත කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**නිපුණතාව 05** : ජීවී අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 5.3** : පරිසර අලංකරණයෙහි යෙදෙමින් ස්වභාව සෞන්දර්ය ආශ්වාදනය කරයි.

**ක්‍රියාකාරකම 5.3** : කුසුමක අසිරිය නරඹමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 5.3.1ට අදාළ
  " සමන් වැලේ මල් ජයට පිපීලා " යන ගීත ඛණ්ඩය ලියූ පුවරුව
- ඇමුණුම 5.3.2ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්
- ඕමයි කඩදාසි හා මාකර් පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 5.3.1** :
- ඇමුණුම 5.3.1ට අදාළ ගීත ඛණ්ඩය ලියූ පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම ගීත ඛණ්ඩය මිහිරි ලෙස සිසුන් සමඟ වරක් ගායනා කරන්න.
- එහි අර්ථය සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - මෙම ගීත ඛණ්ඩයෙන් මල් පිපුණු සමන් වැලක් පිළිබඳ කියවෙන බව.
> - සෑම ගෙදරකම මල් පිපෙයි නම් ගමක් සුවඳවත් වන බව.
> - මලින් සුවඳවත් වන පරිසරය සියලු සතුන්ට සුවදායක වන බව.
> - පුද්ගල ජීවිතයට පෝෂණය මෙන් මල් ගසට ද පෝෂණය අවශ්‍ය බව.

**පියවර 5.3.2** :

- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 5.3.2ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා , ඕමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**පියවර 5.3.3** :

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌනපූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා හා අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- විවිධ මල් වර්ග වැවීමෙන් පරිසරය අලංකාර වන බව.
- විවිධ මලින් බර වූ මල් ගස් තිබීම ගෙමිදුලක අලංකාරය වැඩිකරන බව.
- හිමිදිරි උදැසන සහ සවස මල් සුවඳ පිස හමන සුළඟින් ගත සිත පිනා යන බව.
- මල් පැණි බොන්නට සමනලුන් , මී මැස්සන්, කුරුල්ලන් පැමිණීමෙන් අලංකාරය තවත් වැඩිවන බව.
- මල් ගස් සිටුවීම හා ඒවාට අවශ්‍ය පොහොර, ජලය, නිසි කලට නිසි පරිදි යෙදීමෙන් ඒවා පෝෂණය කළ යුතු බව.
- මලක සුවඳමෙන් ජීවිතයද යහ ගුණයෙන් සුවඳින් සුවඳවත් කරගත යුතු බව.
- බුදුරදුන්ට මල් පූජා කිරීමෙන් ආනිශංස ලැබෙන අතර එය ජීවිතයේ අස්ථිර භාවය සිහි කරන භාවනාවක් ද වන බව.
- මල් වැවීමත් පිංකමක් වන බව.
- මල් වැවීම හා ඒවා ආරක්ෂා කර ගැනීම යුතුකමක් බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- මල් වැවීමේ ප්‍රයෝජන පැහැදිලි කරයි.
- පරිසර අලංකරණයට දායක විය හැකි බව පිළිගනියි.
- මල උපමාවට ගෙන ජීවිතයේ ස්වභාවය මෙනෙහි කරයි.
- සෞන්දර්ය රසාස්වාදනයේ යෙදෙයි.
- පරිසරය පිරිසිදුව තබා ගනියි.

ඇමුණුම 5.3.1

## සමන් වැලේ මල්

සමන්වැලේ මල් ජයට පිපීලා - මුළු මිදුල ම සුවඳයි
මගේ මේ මුළු මිදුලම සුවඳයි
හැම ගෙදරම මල් ජයට පිපේනම් - ගම්මානෙම සුවඳයි
දුවේ මේ ගම්මානෙම සුවඳයි

පද රචනය : අරිසෙන් අහුබුදු ගුරුන්

ඇමුණුම 5.3.2

## කණ්ඩායම් ගවේෂණ සඳහා  උපදෙස්

) ඔබේ පරිසරයේ ඇති මල් වත්තක් නරඹන්න.

) එහිදී ඔබ දුටු මල් වර්ග මල් වල වර්ණ සහ සමනලුන් ආදී සතුන් පිළිබ ද වගුවක් සකසන්න.

) එහි විවිධ මල් වර්ග දැකීමෙන් ඔබේ සිතට දැනුණු හැඟීම් කණ්ඩායම තුළ සාකච ්ඡා කරන්න.

) මල් වගාව ආරක්ෂාකාරී ගැනීමට යොදා තිබූ ක්‍රියාමාර්ග සහ ගත හැකි වෙනත් ක්‍රියාමාර්ග සාකච ්ඡා කරන්න.

) ඔබේ අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 06** : බෞද්ධ ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික උරුමය හැඳිනගෙන එය රැකගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.1** : ශාසනය සුරක්ෂිත කිරීම සඳහා පළමු සංගායනාවෙන් ගැනුණු පියවර අධ්‍යයනය කර අගය කරයි.

**ක්‍රියාකාරකම 6.1** : සසුන සුරැකීමට සමගි වෙමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 6.1.1ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් හතරක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

**පියවර 6.1.1** :
- බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ දි කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ වැඩ විසූ ශ්‍රාවකයින් අතර ඇති වූ ආරවුල පිළිබඳ සිසුන්ගෙන් පෙර දැනුම විමසන්න.
- එම පුවත පිළිබඳ ඉතා කෙටියෙන් සිසුන් දැනුවත් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේදීම ශ්‍රාවක පිරිස් අතර යම් යම් මතවාද ඇති වූ බව.
> - එම අවස්ථාවල දී බුදුරදුන් ඉදිරිපත් වී විවිධ පිළියම් යෙදූ බව.
> - බුදුරජාණන් වහන්සේ පිරිනිවීමෙන් පසුවද මතවාද ඇති වූ බව.
> - සම්බුද්ධ පරිනිර්වාණය සිදුවූ මොහොතේ සුභද්‍ර භික්ෂුව විසින් කරන ලද ප්‍රකාශයෙන් ද අර්බුදකාරී තත්ත්වයක් මතුවූ බව.
> - ඒ වනවිට වැඩ සිටි මහා තෙරවරුන් එම ප්‍රකාශය පිළිබඳ අවධානය යොමුකළ බව.
> - ඒ අනුව ප්‍රථම සංගායනාව පිළිබඳ අදහස මතු වූ බව.

**පියවර 6.1.2** :
- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් තුනකට බෙදන්න.
- ඇමුණුම 6.1.1ට අදාළ ගවේෂණ උපදෙස් පිටපත් , ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

පියවර 6.1.3 :

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- උගත පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර ප්‍රකාශය මත ප්‍රථම ධර්ම සංගායනාව සිදු වූ බව.
- එහි ප්‍රධානත්වය මහා කාශ්‍යප මහරහතන් වහන්සේ දැරූ බව.
- සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව මෙම සංගායනාව පැවැත්වූ බව.
- පන්සියයක් රහතන් වහන්සේලා සහභාගි වූ බව.
- මෙය පවත්වනු ලැබුවේ රජගහ නුවර වේභාර පර්වත ප්‍රාන්තයේ සප්තපර්ණි ගල්ගුහාද්වාරයේ බව.
- සංගායනාව පැවැත්වීමට සත් මසක් ගතවූ බව.
- සංගායනාවේ දායකත්වය අජාසත් මහරජ විසින් දැරූ බව.
- රහතන් වහන්සේලා පන්සියයක් සහභාගි වූ හෙයින් පංචසතික නමින් හැඳින්වූ බව.
- ධර්ම විනය කටපාඩමින් පවත්වාගෙන යෑමට පහත සඳහන් පරිදි ශිෂ්‍ය පරම්පරාවලට පැවරුණු බව.
  - දීඝ නිකාය - ආනන්ද හිමි ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට
  - මජ් ධිම නිකාය - සැරියුත් හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවට
  - සංයුක්ත නිකාය - මහා කාශ්‍යප හිමියන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට
  - අංගුත්තර නිකාය- අනුරුද්ධ හිමියන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට
  - ඛුද්දක නිකාය - සියලුම භික්ෂු පරම්පරාවලට
- මෙම පරම්පරා, භාණක පරම්පරා නමින් හඳුන්වා ඇති බව.
- මේ අනුව ශාසනයෙහි අර්බුදකාරී අවස්ථාවලදී සාමූහිකව වගකීමෙන් සමගි වී ශාසනය ආරක්ෂා කළ බව.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- පළමු සංගායනාව පිළිබඳ ව මූලික කරුණු විස්තර කරයි.
- ගැටලුකාරී අවස්ථාවලදී සමගියෙන් නිවැරදි තීරණවල පිහිටා කටයුතු කළ යුතු බව පිළිගනී.
- පංති කාමරයේදී සාමූහිකව ක්‍රියා කළයුතු අවස්ථා ලැයිස්තු ගත කරයි.
- තමාට මතුවන ගැටලුවට පිළිතුරු සෙවීමේදී සාමූහිකව අදහස් ලබාගැනීමට පෙළඹෙයි.
- අන්‍ය මතවලට සවන් දෙයි.

ඇමුණුම 6.1.1

## කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්

- කණ්ඩායම් තුන සඳහා පහත සඳහන් එක් එක් කරුණු බෙදා දෙන්න.
- හේතුව, ප්‍රධානත්වය , අනුග්‍රහය , කාලය , සහභාගි වූ පිරිස පැවැත්වූ ස්ථානය, සංගායනාවේ ප්‍රතිඵල යන ශීර්ෂ මත ප්‍රථම ධර්මසංගායනාව පිළිබඳ වගුවක් සකස් කරන්න.
- යහළුවන් දෙදෙනකු අතර ඇතිවන ගැටලුවකදී විසඳුම් සොයා ගත හැකි ආකාරය සංගායනාවේ ක්‍රමවේදය තුළින් විස්තර කරන්න.
- පාසලේ දී ඇතිවිය හැකි ගැටලුවක් නම් කොට එයට විසඳුම් සොයන ආකාරය පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**නිපුණතාව 06** : බෞද්ධ ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික උරුමය හැඳිනගෙන එය රැකගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.2** : මහින්දාගමනයේ ශ්‍රී ලාංකික දායාද හැඳිනගෙන ඒවා ශාසනික හා සංස්කෘතික වශයෙන් ඇගයීමට ලක් කරමින් සංරක්ෂණයෙහි යෙදෙයි.

**ක්‍රියාකාරකම 6.2** : මහින්දාගමනයේ ශ්‍රී ලාංකික දායාද අගය කරමු. සුරකිමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 6.2.1ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්.
- බෞද්ධ කලාශිල්ප නිරූපණය වන පින්තූරයක් (මුරගල, ශ්‍රී මහා බෝධිය, සඳකඩ පහණ)
- බෞද්ධ සාහිත්‍යයට අයත් කෘති කිහිපයක නම් සහ පහත සඳහන් ඒවායින් එක් කෘතියක් (බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව, බුත්සරණ)
- ඩිමයි කඩදාසි සහ මාකර් පෑන්.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

**පියවර 6.2.1**

- තෝරාගත් බෞද්ධ සාහිත්‍ය කෘතිය හෝ කලාශිල්ප නිරූපිත පින්තූරය පන්තියේ සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ඒවා පිළිබඳ සිසුන්ගේ පූර්ව දැනුම විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - මෙම කෘතීන්හි දක්නට ඇත්තේ බෞද්ධ ආභාශය බව.
> - එම ආභාශය ලැබුනේ මහින්දාගමනයෙන් බව.
> - මහින්දාගමනයෙන් අපට ලැබුණු දායාද රාශියක් ඇති බව.

**පියවර 6.2.2** :

- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 6.2.1 ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබාදෙන්න.
- අදාළ පින්තූරය සහ බෞද්ධ සාහිත්‍ය පොත්, ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම්වලට ලබාදෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 6.2.3** :

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායමට ඌන පූරණය සඳහා පළමු අවස්ථාව ලබාදෙන්න.
- අනෙක් කණ්ඩායමේ සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- මහින්දාගමනයෙන් බුදු දහම ඇතුළු දායාද රාශියක් ලැබුණු බව.
- ඒවා අතරින් කිහිපයක් පහත සඳහන් බව.
- අරිට්ඨ කුමරුගේ පැවිදි වීමත් සමඟ ලාංකේය භික්ෂු සමාජය ඇතිවීම.
- අනුලා දේවිය ප්‍රධාන කාන්තාවන් පන්සියයක් පැවිදි වීමත් සමඟ ලාංකේය භික්ෂුණී සමාජය ඇති වීම.
- සංඝමිත්තා තෙරණිය සමඟ පැමිණි විවිධ ශිල්පීන් නිසා කලා ශිල්ප හා සාහිත්‍යය ඇති වීම.
- කලා ශිල්ප ලෙස චිත්‍ර, මූර්ති, කැටයම් හා වාස්තු විද්‍යාත්මක දෑ ඇතිවීම.
- ගද්‍ය පද්‍ය බෞද්ධ සාහිත්‍යයක් නිර්මාණය වීම.
- බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, සද්ධර්මරත්නාවලිය, අමාවතුර, බුත්සරණ, දහම්සොඬදාකව, ඉන් කිහිපයක් බව.
- ඉහත සියලුම සංස්කෘතික දායාද ආරක්ෂා කළ යුතු බව.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- මහින්දාගමනයෙන් පසු ඇති වූ සංස්කෘතික දායාද පැහැදිළි කරයි.
- මහින්දාගමනයෙන් ලැබුණු දායාද ආරක්ෂා කළ යුතු බව පිළිගනියි.
- මහින්දාගමනයෙන් ලැබුණු සංස්කෘතික දායාද වගුගත කරයි.
- ඓතිහාසික වස්තු ආරක්ෂා කිරීමට සැළසුම් සකස් කරයි.
- පොදු දේපල සුරකියි.

ඇමුණුම 6.2.1

**කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්**

- එක් කණ්ඩායමක් කලා ශිල්ප නිරූපිත පින්තූරය ලබා ගන්න.
- අනෙක් කණ්ඩායම බෞද්ධ සාහිත්‍යය නියෝජනය වන තෝරාගත් කෘතිය ලබා ගන්න.
- ඒවායේ ඇතුළත් බෞද්ධ ලක්ෂණ සොයන්න.
- මහින්දාගමනය නිසා අපට ලැබුණු වෙනත් දායාද පිළිබඳ සටහනක් කණ්ඩායම් දෙකම වෙන වෙනම සකස් කරන්න.
- අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**නිපුණතාව 07** : ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.1** : බුදු දහම ඇසුරින් පෝෂණය වූ ශ්‍රී ලාංකික සමාජ ධර්ම රැක ගැනීමට ක්‍රියා කරයි.

**ක්‍රියාකාරකම 7.1** : සංස්කෘතිය අගයමින් සමාජ ධර්ම සුරකිමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 7.1.1ට අදාළ ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාවේ පිටපත් හතරක්
- ඩිමයි කඩදාසි, මාකර් පෑන්.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 7.1.1** :
- බුදුරජාණන් වහන්සේ කළ අනිමිස ලෝචන පූජාව පිළිබඳ සිසුන්ගෙන් පෙර දැනුම විමසන්න.
- සිසුන් ලබාදෙන පිළිතුරුවලට අනුව පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - අනිමිස ලෝචන පූජාව තුළින් බුදුරදුන් බෝධීන් වහන්සේට කෘතගුණ සැලකූ බව.
> - අපේ ජන සංස්කෘතිය බුදු දහම ඇසුරින් පෝෂණය වී ඇති බව.
> - අපේ ජන සංස්කෘතියෙහි සුවිශේෂී ලක්ෂණ ගණනාවක් ඇති බව.

**පියවර 7.1.2** :
- සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- ඇමුණුම 7.1.1ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබාදෙන්න.
- ඩිමයි කඩදාසි, හා මාකර් පෑන් ලබාදෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

**පියවර 7.1.3** :
- කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අවස්ථාව ලබාදෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයෙහි යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- කෘතගුණ සැලකීම හෙවත් කළගුණ සැලකීම බෞද්ධ සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණයක් බව.
- බුදු දහමින් පෝෂණය වූ ලාංකික ජන සමාජයේ ආගන්තුක සත්කාරය ඉතා ඉහළ ස්ථානයක තිබූ බව.
- වැඩිහිටියන්ට සැලකීම ශ්‍රී ලාංකික ජන සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණයක් බව.
- අස්වැන්න නෙලා ගැනීමෙන් පසු එහි පළමු කොටස බුදුරදුන් උදෙසා පූජා කරන අතර එය අග්‍රශෂ්‍යා දානය නමින් හැඳින්වෙන බව.
- බුදු දහමින් පෝෂණය ලද හෙයින් ශ්‍රී ලාංකික ජන සංස්කෘතිය තුළ ඉහත යහ ගුණ මෙන්ම තවත් බොහෝ ගුණ ධර්මද පවත්නා බව.
- එම යහගුණ ධර්ම අප විසින් ආරක්ෂා කළයුතු බව

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- බුදු දහමින් පෝෂණය වූ ලාංකික සමාජ ධර්ම තුනක් නම් කරයි.
- අපේ සමාජ ධර්ම අප විසින් අගය කළ යුතු බව පිළිගනියි.
- අපේ සමාජ ධර්ම අගය කරමින් කතාවකට සැකිල්ලක් පිළියෙල කරයි.
- සහානුභූතියෙන් යුතුව වැඩ කරයි.
- තම සංස්කෘතිය සුරකිමින් අන්‍ය සංස්කෘතීන්ට ගරු කරයි.

ඇමුණුම 7.1.1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

### පළමු කණ්ඩායම

- ශ්‍රී ලාංකික ජන සංස්කෘතියේ කෘතගුණ දැක්වෙන අවස්ථා පිළිබඳ සාකච්ඡා කර ලැයිස්තු ගත කරන්න.

### දෙවන කණ්ඩායම

- ආගන්තුක සත්කාරය ජන සමාජයේ ක්‍රියාත්මකවන අයුරු සාකච්ඡා කරන්න.

### තෙවන කණ්ඩායම

- ශ්‍රී ලාංකික ජන සමාජය වැඩිහිටියන්ට සලකන අයුරු විස්තර කරන්න.

### සිව්වන කණ්ඩායම

- අග්‍ර ශෂ්‍යා දානය යනු කුමක්දැයි විස්තර කරන්න.
- ඔබේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**නිපුණතාව 07** : ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.2** : බෞද්ධ ඉගැන්වීම් ශ්‍රී ලාංකික ජන සමාජයේ සහජීවනයට පදනම් වූ බවට කරුණු දක්වයි.

**ක්‍රියාකාරකම 7.2** : සහජීවනයට හුරුවෙමු.

**කාලය** : මිනිත්තු 80යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 7.2.1ට අදාළ ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාවේ පිටපත් තුනක් .
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 7.2.1** :
- අන්‍ය ආගමික ආරාමවලට බුදුරදුන් වැඩමකළ අවස්ථා ගැන සිසුන්ගේ පෙර දැනුම විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - සහජීවනය යනු විවිධ පුද්ගලයන් හා ජන කොටස් අතර අන්‍යෝන්‍ය බැඳීම විශ්වාසය හා සමගියෙන් යුතුව කටයුතු කිරීම බව.
> - බුදු දහම තුළ සහජීවනය ඉතා උසස් ලෙස අගය කරන බව.

**පියවර 7.2.2** :
- සිසුන් කුඩා කණ්ඩායම් තුනකට බෙදන්න.
- පෙළ පොතේ අදාළ පාඩමට අවධානය යොමු කරවන්න.
- ඇමුණුම 7.2.1ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 7.2.3** :
- කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- බුදු දහමින් පෝෂණය වූ ශ්‍රී ලාංකික ජන සමාජය පඤ්චශීල ප්‍රතිපදාව අනුව සහජීවනය ඉතා ඉහළින් අගයමින් ක්‍රියා කළ බව.

- පැරණි බෞද්ධ විහාර ආරාමවල ධර්ම ශාලාවෙහි සතර දිශාවේ දොරටු සතරක් නිර්මාණය කිරීම තුළින් අදහස් වන්නේ සතර දිශාවෙන් පැමිණෙන ඕනෑම අයකු සමානව පිළිගත් බව.

- සිව් බඹ විහරණ, වැනි බෞද්ධ ඉගැන්වීම් අනුව හැඩ ගැසුණු මෙරට බෞද්ධ ජනතාව ආගමික කටයුතු , කෘෂි කටයුතු හා සමාජ කටයුතු වලදී අන්‍යෝන්‍ය උපකාරීත්වයෙන් හා සහජීවනයෙන් කටයුතු කළ බව.

- මහසෙන් රජු විසින් වරෙක මහා විහාරය විනාශ කළ පසු ජනතාව ඊට විරුද්ධව නැගී සිටි අවස්ථාවේ ජනතාවට ඇහුම්කන් දීමක් වශයෙන් මහාවිහාරය නැවත ගොඩ නැගීමෙන් අන්‍ය මත වලට ඇහුම්කන් දීමේ සහජීවන සාධකය සනාථ කළ බව.

- තට්ටුමාරු ක්‍රමයට කුඹුරු ගොවිතැන් කිරීම, අත්තම් ක්‍රමය, විශේෂ ආහාරයක් පිළියෙල කළ විට අසල්වාසීන් සමඟ බෙදාහදා ගැනීම, පොදු කටයුතුවලදී සාමූහිකව ශ්‍රමදාන කිරීම, නෑදෑකම් කියා ඇමතීම, පන්සලට දේවාලයට එකතු වීම, පෙරහරට විවිධ සංස්කෘතික අංග එකතුවීම ආදිය තුළද දක්නට ලැබෙන්නේ සහජීවන ප්‍රතිපදාවයි.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- සහජීවනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම අතීතයේදී ශ්‍රී ලාංකික ජන සමාජය තුළ ක්‍රියාත්මක වූ බවට නිදසුන් දක්වයි.
- අවිහිංසාව සහජීවනය සඳහා පාදක වන බව පිළිගනියි.
- පාසලේදී සහජීවනයෙන් ක්‍රියා කළ යුතු අවස්ථා ලැයිස්තුගත කරයි.
- සහකම්පනයෙන් යුතුව කටයුතු කරයි.
- සමගියෙන් එකමුතු වෙයි.

ඇමුණුම 7.2.1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- පහත සඳහන් මාතෘකා අතරින් ඔබේ කණ්ඩායමට ලැබෙන මාතෘකාව අනුව කරුණු සොයන්න.
- අවිහිංසාව සහජීවනයට හේතුවන ආකාරය සහ අතීත ශ්‍රී ලාංකික ජන සමාජයෙන් ඒ සඳහා නිදසුන් .
- සහජීවනය උදෙසා සමානාත්මතාව බලපාන අයුරු සහ අතීත ශ්‍රී ලාංකික ජන සමාජයෙන් ඒ සඳහා නිදසුන් .
- අන්‍යාමත ඉවසීම තුළින් සහජීවනය ඇතිවන අයුරු සහ අතීත ශ්‍රී ලාංකික ජන සමාජයෙන් ඒ සඳහා නිදසුන් . .
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

**නිපුණතාව 08** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 8.1** : ධන පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරයි.

**ක්‍රියාකාරකම 8.1** : දැහැමිව හා විධිමත්ව ධනය පරිහරණය කරමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- " ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය " ... යන ගාථාව ලියූ පුවරුව
- ඇමුණුම 8.1.1ට අදාළ ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකා හතරක්.
- ඇමුණුම 8.1.2ට අදාළ පත්‍රිකාව
- ඇමුණුම 8.1.3ට අදාළ පත්‍රිකාව
- ඇමුණුම 8.1.4ට අදාළ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

- " ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය " ... යන ගාථාව ලියූ පුවරුව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එම ගාථාව පිළිබඳව සිසුන්ගෙන් පෙර දැනුම විමසන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - මෙම ගාථාව සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන්නක් බව.
> - එහි ධන පරිහරණය පිළිබඳ කරුණු දැක්වෙන බව.
> - එහිදී තමා උපයන ලද ධනයෙන් එක් කොටසක් පරිහරණයටද කොටස් දෙකක් කර්මාන්ත සඳහා යෙදවීමට ද ඉතිරි කොටස ආපදාවක් පැමිණුනු විට ගැනීම සඳහා තැන්පත් කිරීමට ද උපදෙස් දෙන බව.
> - නිවැරදි ධන පරිහරණයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු රාශියක් බෞද්ධ ඉගැන්වීම් තුළ අන්තර්ගතවන බව.

**පියවර 8.1.2** :

- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් හතරකට බෙදන්න.
- කණ්ඩායම් වලට ගවේෂණ මාතෘකා බෙදා දෙන්න.
- ඇමුණුම 8.1.2, ඇමුණුම 8.1.3 සහ ඇමුණුම 8.1.4 අදාළ පත්‍රිකා අවශ්‍ය පරිදි ලබා දෙන්න
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

**පියවර 8.1.3** :

- කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා, ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ධන පරිහරණයේදී සමජීවිකතාව අවශ්‍ය බව.
- සමජීවිකතාව නම් අය වැය සමව පවත්වාගෙන යාම බව.
- ස්වාමීන් වහන්සේලාට පූජා කරන සෑම දෙයක්ම වාගේ පරිහරණය කරනු ලබන්නේ පොදු දේපලක් ලෙස බව.
- චීවර පරිහරණයේදී උපරිම ප්‍රයෝජන ගන්නා ආකාරය ආනන්ද හිමියන් විසින් කොසොල් රජුට දේශනා කරන ලද බව.
- දිරාගිය දේවල් නැවත අලුත්වැඩියා කර පරිහරණය කළ යුතු යැයි බුද්ධ දේශනාවේ සඳහන් බව.
- මනා කළමණාකරණයකින් යුක්තව ධනය පරිහරණය කළ යුත බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- ධන පරිහරණයේ දී සැලකිල්ලට ගතයුතු කරුණු පැහැදිලි කරයි.
- ධන පරිහරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයාගේ ආර්ථික සංවර්ධනයට හේතුවන බව පිළිගනියි.
- ධන පරිහරණයේදී නොකළ යුතු ක්‍රියා ගවේෂණය කරයි.
- භාවිත කරන උපකරණ අලුත්වැඩියා කර පරිහරණය කරයි.
- අරපිරිමැස්මෙන් කටයුතු කරයි.

ඇමුණුම 8.1.1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබට ලැබෙන පහත සඳහන් ක්‍රියාකාරකමක් පිළිබඳ අවධානය යොමු කරන්න.

- සමජීවිකතාව ධන පරිහරණයට බලපාන ආකාරය විස්තර කරන්න.
- පූජාවෙන් ලැබෙන චීවරයෙන් භික්ෂූන් වහන්සේනමක් උපරිම ප්‍රයෝජන ගන්නා ආකාරය ආදර්ශයට ගැනීමෙන් පුද්ගල ධන පරිහරණයට ලැබෙන ආර්ථික වාසි ලැයිස්තු ගත කරන්න.
- දිරාගිය දේ අලුත්වැඩියා කිරීමෙන් තිබෙන සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගතහැකි ආකාරය පැහැදිළි කරන්න.
- සාංඝික දේපළ පරිහරණ රටාවෙන් පොදු දේපළ නිසි ලෙස සුරැකෙන අයුරු පැහැදිළි කරන්න.
- ඔබේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 8.1.2

උපයන ලද ධනය සමජීවිකතාවෙන් යුතුව පවත්වා ගැනීම ලෙස දක්වා ඇත්තේ අයවැය සමබරව පවත්වාගෙන යාමයි. පොකුණක ජලය ඉවත්වන දොරටු විවර කොට ජලය ගලා එන දොරටු වසා තැබූ කල්හි පොකුණේ ජලය සිඳීයන පරිද්දෙන් ධනය විනාශ වන දොරටු නොවසා තැබූ කල්හි ධනය විනාශ වන්නේ යැයි ව්‍යාග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වේ.

ධනය පරිහරණය කිරීමේදී කොටස් කරගත යුතු පිළිවෙළ සිගාලෝවාද සූත්‍රයේ මෙසේ දක්වා ඇත.

ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයෝජයේ
චතුත්ථංච නිධාපෙය්‍යා
ආපදාසු භවිස්සති.

එක් කොටසක් පරිභෝජනය සඳහා ද දෙකොටසක් ප්‍රයෝජනවත් කර්මාන්තයන්හි ආයෝජනය සඳහා ද ඉතිරි කොටස ආපදාවකදි ගැනීමට තැන්පත්කොට තැබීම සඳහා ද වෙන්කර ගතයුතු බව දැක්වෙයි.

"කතමා ච ව්‍යග්ඝපජ්ජ සමජීවිකතා ?

ඉධ ව්‍යග්ඝපජ්ජ කුල පුත්තෝ අයංච භෝගානං විදිත්වා වයංච භෝගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති න අච්චොගාළ්හං අතිහීනං එවම් මෙ අයෝ වයං පරියාදාය ඨස්සති නච මේ අයෝ වයං පරියාදාය ඨස්සතී ති."

ව්‍යාඝ්‍ර පද්‍ය ය, සම ව ජීවත් වීම කවරේ ද?

මේ ලෝකයෙහි කුල පුත්‍ර තෙමේ භෝගයන් ගේ අය ද වැය ද විමසා දැන ඉතා වැඩිත් නො කොට අඩුත් නො කොට මෙසේ කිරීමෙන් මාගේ අය වැය ඉක්මවා සිටින්නේ ය, මාගේ වැය අය ඉක්මවා නො සිටින්නේ ය යි සම ව ජීවිකාව කෙරෙයි.

ඇමුණුම 8.1.3

සෙය්‍යථා ජී ව්‍යාග්ඝපජ්ජ තුලාධාරෝ වා තුලාධාරන්තේවාසී වා තුලං පග්ගහේතවා ජානාති එත්තකේන වා ඕනතං එත්තකේන වා උන්නතන්ති ඒවමේව බෝ ව්‍යාග්ඝපජ්ජ කුල පුත්තෝ අයංච භෝගානං විදිත්වා වයංච භෝගානං විදිත්වා සමං ජීවිකං කප්පේති න අච්චෝගාළ්හං අතිහීනං එවම්මෙ අයෝ වයං පරියා දාය ඨස්සති. න ච මේ වයෝ අයං පරියාදාය ඨස්සතීති. ස්වා යං ව්‍යාග්ඝපජ්ජ කුල පුත්තෝ අප්පායෝ සමානෝ උළාරං ජීවිකං කප්පේති තස්ස භවන්ති වත්තාරෝ උදුම්බරඛාදිකං වායං කුලපුත්තෝ භෝගේ ඛාදතීති. සචේ පනායං ව්‍යාග්ඝපජ්ජ කුලපුත්තෝ මහායෝ සමානෝ කසිරං ජීවිකං කප්පේති. තස්ස භවන්ති වත්තාරෝ අජද්ධුමාරකංවායං කුලපුත්තෝ මරිස්සතීති. යතෝ ච ඛවායං ව්‍යාග්ඝපජ්ජ කුල පුත්තෝ අයංච භෝගානං විදිත්වා වයංච භෝගානංච විදිත්වා සමං ජීවිකං කප්පේති න අච්ජෝගාළ්හං න අතිහීනං ඒවං මේ අයෝ වයං පරියාදාය ඨස්සති න මේ අයෝවයං පරියාදාය ඨස්සතී ති අයං වුච්චති ව්‍යාග්ඝපජ්ජ සමජීවිකතා.

ව්‍යාඝ්‍ර පද්‍ය ය, යම් සේ තරාදියෙන් බඩු කිරන පුරුෂයෙක් හෝ තුලාධාරයා ගේ අතැවැසියෙක් හෝ තරාදිය ගෙන මෙ පමණ බරින පහතට වැටුණේය. මෙ පමණ බරින් උස්වූ යේ යයි දනී ද ඒ පරිද්දෙන් ම කුල පුත්‍ර තෙමේ භෝගයන් ගේ අය ද වැය ද විමසා දැන ඉතා වැඩිත් නොකොට ඉතා අඩුත් නො කොට වස්තුවෙහි පමණ දැන වියදම් කොට, මෙසේ කිරීමෙන් මාගේ අය වැය ඉක්මවා සිටින්නේ ය. වැය අය ඉක්මවා නොම සිටින්නේ යයි වස්තූන්ගේ පමණ දැන වියදම් කිරීමෙන් සමව ජීවිකාව කෙරෙයි.

ව්‍යාඝ්‍ර පද්‍ය ය, ඉදින් මේ කුල පුත්‍ර තෙමේ ස්වල්ප වූ අය ඇතිව බොහෝ වියදම් කිරීමෙන් ජීවිකාව කෙරේ ද ඕ හට අවිචාරයෙන් දිඹුල් එල කැම මෙන් මේ කුල පුත්‍ර තෙමේ සම්පත් කා නසන්නේ ය යි කියන්නාහු වෙති.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ව්‍යාඝ්‍ර පද්‍ය ය, ඉදින් මේ කුල පුත්‍ර තෙමේ මහත් වූ අය ඇති යේ දුකසේ ජීවිකාව කෙරේ ද ඕහට මේ කුලපුත්‍ර තෙමේ භෝගය අනුභව නොකොට අනාථ මරණයෙන් මියයන්නේ ය යි කියන්නාහු වෙති.

යම් හෙයකින් ව්‍යාඝ්‍ර පද්‍ය ය මේ කුල පුත්‍ර තෙමේ භෝගයන් ගේ අය ද වැය ද විමසා දැන ඉතා වැඩි නො කොට ඉතා අඩු නො කොට මෙසේ මා ගේ අය වැය ඉක්මවා සිටිනේ ය, මා ගේ අය වැය ඉක්මවා නො සිටිනේ යයි සමව ජීවිකාව කෙරේ ද යන මෙය සම ජීවිකතා යයි කියනු ලැබේ.

ඇමුණුම 8.1.4

තව ද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආනන්ද සාමීන් විසින් එක් දවසක් ලබන ලද පිළි සහල දහසක් නිසා මේ ජාතකය දක්වන ලද.

හේ කෙසේ ද යත්:

ආනන්ද සාමීන් කෝසල රජ්ජුරුවන්ගේ අන්තඃපුර ස්ත්‍රීන්ට බණ කියන සමයෙහි එක් දවසක් කෝසල රජ්ජුරුවන්ට දාස් දාස් මිල වටිනා පිළි සගළ දාසක් පාක්කුඩම් පිණිස පැහ. ඉන් රජ්ජුරුවෝ පිළි පන්සියයක් අනඳ සාමීන්ගෙන් බණ අසන බිසෝවරුන්ට දුන්හ. ඒ බිසෝවරු පිළි සගළ පන්සියය නො ඇඳ තිබා ගෙන ඉඳ සාමීන් බණ කියන්ට ආ වේලේ පන්සියක් දෙන ම තම තමන් ලත් පිළි පන්සියය ම පිළිගැන්වූහ.

අනඳ සාමීන් ඒ පිළිගෙන ගණයට වැඩි සේක. පසු ව දවස් මේ නිමවන වේලාවට බිසෝවරු පන්සියයක් දෙන ම පරණ පිළි ඇඳ ගෙන රජ්ජුරුවන් කරා එන්නාහ. එවිට රජ්ජුරුවෝ ඊයේ මා දුන් පිළි කොයි දැ යි විචාරන්නාහ. ස්වාමීනි, ඒ පිළි සගල පන්සියය ම අනඳ සාමීන්ට පිළිගැන්වූම්හ යි කියන්නාහ. එවිට රජ්ජුරුවෝ අනඳ සාමීන් ම පිළිගත් සේක් දැයි විචාරා බිසෝවරුන් විසින් එසේය, පිළිගත් සේකැයි කියන්නා සර්වඥයන් වහන්සේ වදාළේ තුන් සිවුරක් වුව. මෙතෙක් පිළිගත්තේ පිළි වෙළඳාම් කරන සේක් දැ යි සිතා රජ්ජුරුවෝ කිපී අනඳ සාමීන්ගේ ගණයට ගොස් ස්වාමීනී අන්තඃපුරවාසීන්ට බණ කියා වදාරන්නේ ඇද්දැයි විචාරන්නා එසේ ය මහරජ, කියම් හ යි වදාරන්නා කියන පමණක් ද? උයිත් බණ අසා උගනිද්දැයි විචාරන්නා එසේ ය මහරජ, අසති, පිළිවන් පිළිවන් දෙයක් වනපොත් කෙරෙති කියන්නා තුඹ වහන්සේ අතින් අසන පමණක් විනා යම් සත්කාරත් කෙරෙද්දැයි විචාරන්නා එසේ ය මහරජ , ඊයේ බණ අසා පිළි සගළ පන්සියයක් දුන්නහ යි වදාරන්නා ඇසී සර්වඥයන් වහන්සේ තුන් සිවුරක් අනුදත් සේක. මෙතෙක් පිළි ගත්තේ ඇයි දැයි විචාරන්නා මහරජ, සර්වඥයන් වහන්සේ ප්‍රයෝජන විඳීමට තුන් සිවුරක් මිසක් පිළි ගැන්මට මෙතෙක් දෝෂ නැතැ යි වදාළ සේක. එසේ හෙයින් මා ලත් පිළි දුර්වල සිවුරු ඇති තෙනට දෙමි කියන්නා පළමු සගළ සිවුරු කරන්නේ කිම් දැයි කියන්නා ඒ සිවුරු පොරෝනා සිවුරට අර ගන්නා සේ කැ යි වදාළ සේක.

එවිට රජ්ජුරුවෝ පොරෝනා සිවුරු කුමක් කෙරෙද්දැයි විචාරන්නාහු මාලු තැනක් කපා හැර අඳනා සිවුරට අර ගන්නා සේකැ යි වදාළ සේක. පළමු අඳනා සිවුරු කුමක් කෙරේ දැයි විචාරන්නා ඒ සිවුරු සැතපෙන ඇඳ අතුරන ලෙස ඇර ගන්නා සේකැ යි වදාරන්නා පළමු ඇඳ ඇතිරිලි කුමක් කරන සේක් දැයි විචාරන්නා යහපත් ඔප් ලූ බුමුතුරුණු කොට අතුරන සේකැ යි වදාළ සේක. පළමු බුමුතුරුණු කුමක් කරන සේක් දැයි විචාරන්නා බිස්ස කොට අකුළා පය පිසීන්ට ගන්නා සේකැ යි කී සේක. පළමු තිබූ බිසි කුමක් කරන සේක් දැයි රජ්ජුරුවෝ විචාළාහ. මහරජ, සැදැ ඇත්තන් දුන් දෙය අපවත් නො කරන හෙයින් සියුම් මුවහත් ඇති කරයෙන් රල් සීන් කොට කපා මැටි හා අනා බිත්තියෙහි ගානා සේකැ යි එසේ වූ අවස්ථාවේ සැදැහැ ඇත්තන් දුන් දෙය මහරජ අපවත් නො කරන සේකැ යි වදාළ සේක. එබස් ඇසූ රජ්ජුරුවෝ සතුටුව තමන් ළඟ තිබූ පිළි සගළ පන්සියයත් අනඳ සාමීන්ට දී ගියාහ. අනඳ සාමී පළමුත් පන්සියයක් පිළි සගළ දුර්වල සිවුරු ඇති තැනට දී, රජ්ජුරුවන් ලත් පන්සියයක් සගළට සිතන සේක් මාගේ භික්ෂු පන්සියයක් ඇත. ඉන් ඇමට ම බාල භික්ෂු කෙනෙක් මට අත පය මැඩීම්, මලු ඇමදීම්, ගෙවල් ගොම ගෑම් ආදී වූ නා නා වත් පිළිවෙත් සුවච කීකරු ව කෙරෙත්. එසේ හෙයින් මුන්ට සංග්‍රහ කළ මනා වේ දැයි සිතා අනඳ සාමීන් ඒ නම කෙරේ පැහැද පිළි පන්සියයක් දුන් සේක.

**නිපුණතාව 08** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 8.2** : සම්පත් විනාශයට හේතු හැඳිනගෙන ඒවායින් වැළකීමට ක්‍රියා කරයි.

**ක්‍රියාකාරකම 8.2** : අපේ සම්පත් අපිම සුරකිමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 8.2.1 ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

**පියවර 8.2.1**

- ජලය ඇතුලුවන දොරටු සතර හා ජලය පිටවන දොරටු සතරක් ඇති වැවක ජලය ඇතුලුවන දොරටු වසා ජලය පිටවන දොරටු සතර ඇර ජලය පිරවිය හැකි දැයි සිසුන්ගෙන් අදහස් විමසන්න.
- සිසුන් ලබාදෙන පිළිතුරුවලට අනුව පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ජලය පිටවන දොරටු සතරට උපමා කොට සම්පත් විනාශවන මුඛ සතරක් දේශනා කොට ඇති බව.
> - එම සතර නම් ස්ත්‍රීන්ට ලොල් වීම, සුරාවට ලොල් වීම, සූදුවට ලොල් වීම, පාප මිත්‍ර සේවනය බව.
> - එවැනි සම්පත් විනාශ මුඛ පිළිබඳ කරුණු සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් වන බව.

**පියවර 8.2.2** :

- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 8.2.1 ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා දෙක සහ ඩිමයි කඩදාසි , මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

**පියවර 8.2.3** :

- කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා, ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- සම්පත් විනාශවන මුඛ සිඟාලෝවාද හා ව්‍යාග්ඝපජ්ජ යන සූත්‍රවල සඳහන් වන බව.
- පරස්ත්‍රීන් කරා යෑමට උපයන ලද සම්පත් යෙදවීම හේතුවෙන් ධනය විනාශ වන බව.
- සුරාධූර්තවීම නිසා ධනය ක්ෂය වීමත්, සුරාවේ ආදීනව ලෙස ලෙඩවීම, අපරාධ, අපචාරවලට ලක්වන බැවින් අනවශ්‍ය වියදම් වැඩිවීමත් සිදුවන බව.
- සූදුව සඳහා ධනය යෙදවීමෙන් ධනය විනාශ වෙනවා සේම අඬදබර, සොරකම ආදිය ඇතිවන බව.
- පවිටු මිතුරු ඇසුර හේතුවෙන් අයහපත් ක්‍රියාවලට පෙළඹීම, නීතියේ රැහැනට අසුවීම, විවිධ අපරාධ, අපචාර වලට යොමුවීම සහ ඒ නිසාම ධනය ක්ෂයවීම.
- අවේලාවේ වීදි සංචාරය හේතුවෙන් සොර සතුරු කරදර වලට මුහුණ පෑමට සිදුවීම, නීතියේ රැහැනට අසුවීම, මුදල් වියදම් වීම, අනාරක්ෂිත වීම, පවුලෙහි රැකවරණයට බාධා පැමිණීම ආදිය ඇතිවන බව.
- නැටුම් ,ගැයුම්, වැයුම් වලට ලොල්වීම තුළින් ධනය විනාශ වන බව.
- අලසකම නිසා නිරතුරුව විවිධ හේතු ඉදිරිපත් කරමින් වැඩ අතපසු කරන බැවින් තිබෙන සම්පත් විනාශ වීමත් අලුතින් සම්පත් නූපදීමක් සිදුවන බව.
- මෙවැනි සම්පත් විනාශ මුඛ හැඳිනගෙන ඒවායින් වැළකිය යුතු බව.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- සම්පත් විනාශමුඛ විස්තර කරයි.
- ධන විනාශ මුඛයන්ගෙන් වැළකී සිටිය හැකි බව පිළිගනී.
- මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව දැක්වෙන කෙටිකතාවක් රචනා කරයි.
- අනවශ්‍ය වියදම්වලින් වළකියි.
- යහපත් මිතුරන් ඇසුරු කරයි.

ඇමුණුම 8.2.1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- පෙළ පොතේ අදාළ පාඩමට අවධානය යොමු කරන්න.
- ව්‍යාග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන භෝගවිනාශ මුඛ සතරේ එක් එක් කරුණක ආදීනව වෙන වෙනම සටහන් කරන්න.
- සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන භෝග විනාශ මුඛ හයේ එක් එක් කරුණක ආදීනව වෙන වෙනම සටහන් කරන්න.
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 09** : සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 9.1** : නායකයකුගේ වගකීම තේරුම් ගෙන ඒ අනුව තම පෞරුෂය ගොඩ නගා ගනියි.

**ක්‍රියාකාරකම 9.1** : වගකීම් හැඳිනගෙන ජීවිතය සරු කරමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 9.1.1ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් දෙකක්
- මෙම ශ්‍රේණියට අදාළ පෙළ පොත
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 9.1.1** :
- පහත දැක්වෙන ප්‍රශ්න සිසුන්ගෙන් අසන්න.
- පන්තියේදී ඔබට ලැබිය හැකි නායකත්වයන් මොනවාද?
- එම නායකත්වයන්ට අනුව ඔබ කටයුතු කරන්නේ කෙසේද?
- පහත දැක්වෙන කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| - වගකීම නායකත්වයේ ඉතා වැදගත් ලක්ෂණයක් බව.<br>- යහපත් අරමුණක් සඳහා තමා වෙත පැවරෙන කාර්යයන් වෙනුවෙන් කැපවී කටයුතු කිරීම වගකීම බව.<br>- නායකත්වයේ වගකීම පිළිබිඹු වන ජාතක කථා රැසක් ඇති බව. |

**පියවර 9.1.2** :

- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 9.1.1ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා , ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 9.1.3** :
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායමෙහි සංවර්ධනාත්මක යෝජනා හා අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- නායකත්වයේ ලක්ෂණ වූ අවස්ථාවෝචිතව කටයුතු කිරීම, උපායශීලී බව, අධිෂ්ඨානශීලී බව, ප්‍රතිපත්තිගරුක බව, නිර්භීත බව, විමසිලිමත්වීම යන ගුණාංග නලපාන ජාතක කථාවෙන් ඉස්මතුව පෙනෙන බව.
- නායකත්වයට එකඟව කටයුතු කිරීම අනුගාමිකයන්ගේද වගකීමක් වන බව.
- වගකීම් සහගත ව කටයුතු කිරීම කණ්ඩායම් අභිලාශවල සාර්ථකත්වයට ඉවහල් වන බව.
- වගකීම් සහගතව ක්‍රියාකරන නිවැරදි , ප්‍රතිපත්තිගරුක අයගේ අධිෂ්ඨාන මුදුන්පත් වන බව.
- පාසලේදී දැරීමට සිදුවන පන්ති නායක, ශිෂ්‍ය නායක , ක්‍රීඩා නායක, විෂය නායක යන තනතුරුවල දී වගකීම් සහගතව කටයුතු කළ යුතු බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- නලපාන ජාතකයේ අන්තර්ගතය පැහැදිලි කරයි.
- නලපාන ජාතකයේ නායක වඳුරාගේ හා අනුගාමික වඳුරන්ගේ ක්‍රියා කලාපය අගය කරයි.
- නලපාන ජාතක පුවත රඟ දක්වයි.
- විමසිලිමත් ව කටයුතු කරයි.
- පැවරෙන වගකීම් නිසි ලෙස ඉටු කරයි.

ඇමුණුම 9.1.1

## කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්

- පහත දැක්වෙන ක්‍රියාකාරකම්වලින් ඔබේ කණ්ඩායමට ලැබෙන ක්‍රියාකාරකම් දෙක කෙරෙහි අවධානය යොමු කරන්න.

    - නලපාන ජාතකයෙහි නායක වඳුරා වගකීම් සහගතව කටයුතු කළ අවස්ථා පෙළ පොතේ පාඩම ඇසුරින් ඉස්මතු කොට දක්වන්න.

    - නායක වඳුරා සතුව පැවති විශේෂ ගුණාංග ලියා දක්වන්න.

    - පාසලේ දී ඔබට වගකීම් සහගතව කටයුතු කිරීමට සිදුවන අවස්ථා නම් කරන්න.

    - එම එක් එක් අවස්ථාවන්හිදී ඔබ වගකීමෙන් යුතුව කටයුතු කරන ආකාරය පෙන්වා දෙන්න.

    - කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 09** : සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 9.2** : ඉවසා දරා ගැනීමේ ශක්තියෙන් යුතුව ලෝක ස්වභාවයට මුහුණ දෙයි.

**ක්‍රියාකාරකම 9.2** : ඉවසීම ප්‍රගුණ කර ජීවිතයට මුහුණ දෙමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 9.2.1ට අදාළ ගාථාව ලියන ලද පුවරුව.
- ඇමුණුම 9.2.2ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් තුනක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

**පියවර 9.2.1** :

- ඇමුණුම 9.2.1ට අදාළ ගාථාව ලියන ලද පුවරුව පන්තියට ඉදිරිපත් කරන්න.
- එම ගාථාව සිසුන් ලවා තාලයට, නිවැරදිව වරක් ගායනා කරවන්න.
- පහත දැක්වෙන කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| - මෙම ගාථාව ජයමංගල ගාථා වලට අයත් වන බව.<br>- දුර්ගුණවලින් හෙබි ආලවක යක්ෂයා බුදුරදුන් විසින් දමනය කරනු ලැබූයේ බුදුරදුන්ගේ ඉවසීමේ ගුණය මගින් බව.<br>- ජීවිතයේ මුහුණ පෑමට සිදුවන විවිධ කටුක අත්දැකීම් විඳදරා ගැනීම, ඉවසීම බව.<br>- බුදු සිරිතෙහි හා බෝසත් සිරිතෙහි ඉවසීමේ ගුණයට උදාහරණ රැසක් ඇති බව. |

**පියවර 9.2.2** :

- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් තුනකට බෙදන්න.
- ඇමුණුම 9.2.2ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා , ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 9.2.3** :

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌනපූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- බුදු සිරිතෙහි ඉවසීමේ ගුණය නිරූපණය වන අවස්ථා රැසක් ඇති බව.
- ඉන් කිහිපයක් පහත සඳහන් බව.
  දේවදත්ත භික්ෂුවගේ ක්‍රියා කලාපය, චිංචාමානවිකාවගේ අපහාසය, මාගන්ධියා බැමිණියගේ අපහාස කිරීම්, වේරංජාපුර දොළොස් වන වස, සුප්පිය, අක්කෝසභාරද්වාජ යන අයගේ අපහාස.
- බෝසත් සිරිතෙහි ඉවසීම ප්‍රගුණ කළ අවස්ථා රාශියක් ඇති බව.
- පහත සඳහන් වන්නේ ඒවායින් කිහිපයක් බව.
  චුල්ලබෝධි ජාතකය, ක්ෂාන්තිවාදී ජාතකය,සිදුහත් බෝසත් තුමාගේ දුෂ්කර ක්‍රියා සමය.
- එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවල දී ඉවසීලිමත්ව ක්‍රියා කිරීමෙන් හොඳ ප්‍රතිඵල අත්පත් වන බව.
- " ඛන්ති පරමං තපො තිතික්ඛා " ඉවසීම උතුම්ම තපස යි යනුවෙන් බුදුරදුන් වදාළ බව.

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ඉවසීමේ ගුණයෙහි වටිනාකම නිදසුන් මගින් පැහැදිලි කරයි.
- ඉවසීම ප්‍රගුණ කළ යුතු ගුණයක් බව පිළිගනියි.
- ඉවසීමේ අගය නිරූපණය වන ආකාරයේ නාට්‍යයක අත්පිටපත් සකස් කරයි.
- අන් අය සමඟ සුහදශීලී ව කටයුතු කරයි.
- ජීවිත අභියෝගවලට නොසැලී මුහුණ දෙයි.

ඇමුණුම 9.2.2

## කණ්ඩායම් ගවේෂණ උපදෙස්

) පහත දැක්වෙන ක්‍රියාකාරකම් වලින් ඔබේ කණ්ඩායමට ලැබෙන කාර්යය කෙරෙහි අවධානය යොමු කරන්න.

) පහත සඳහන් ස්ථානවල දී ඉවසීම ප්‍රගුණ කිරීමට සිදු වන අවස්ථා හඳුනා ගන්න.
පාසල , නිවස

) බුදු රදුන් විවිධ අවස්ථාවන්හිදී ඉවසීමෙන් ක්‍රියාකළ ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

) බෝසතුන් විවිධ අවස්ථාවන්හිදී ඉවසීමෙන් ක්‍රියාකළ ආකාරය ජාතක කථා කිහිපයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

) සමස්ත කණ්ඩායම් අනාවරණ , පන්තියට ඉදිරිපත් කරන්න.

ඇමුණුම 9.2.1

මාරාතිරේක මභියුජ් ඨිත සබ්බ රත්තිං
ඝෝරං පනා ලවක මක්ඛ මථද්ධ යක්ඛං
ඛන්තී සුදන්ත විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

දෙවෙනි මාරයකු මෙන් මුලු රැයෙහි
යුද කළ ඝෝර වූ සැඩපරුෂවූ
ගුණමකු වූ ආලවක යක්ෂයා බුදු රදුන්
ඉවසීමේ ගුණයෙන් දිනූ සේක. ඒ
තේජසින් ඔබට ජය මඟුලක් වේවා

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව 10** : නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

**නිපුණතා මට්ටම 10.1** : නිවැරදි දැක්මකින් හා මනා හැඟීමකින් යුතුව පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම 10.1** : අවබෝධයෙන් පිං කරමු.

**කාලය** : මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 10.1.1ට අදාළ පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමියන් විසින් රචිත " බුදුහාමුදුරුවො අපිත් දකින්නැති " .... යන ගීතයෙහි මුල් කොටස ලියූ පුවරුවක්
- ඇමුණුම 10.1.2ට අදාළ කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකා
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

**පියවර 10.1.1** :
- ඇමුණුම 10.1.1ට අදාළ ගීත කණ්ඩය ලියූ පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම ගීත ඛණ්ඩය සිසුන් සමඟ මිහිරි ලෙස ගායනා කරන්න.
- එම ගීත ඛණ්ඩයෙන් පැවසෙන කරුණු පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- පහත දැක්වෙන කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - එම ගීතය රඹුකන සිද්ධාර්ථ හිමියන්ගේ නිර්මාණයක් බව.
> - බුදුරජාණන් වහන්සේ දැක දහම් අසා තිබුණත් නිවන් දැකීමට නම් පිං කළ යුතු යයි එයින් කියැවෙන බව.
> - යහපත් ක්‍රියාවක් සිදුකොට ලබන සතුට පින බව.
> - පින් ලබා ගැනීමට අදාළ ක්‍රියා පුණ්‍ය ක්‍රියා හෙවත් පිංකම් ලෙස හැඳින්වෙන බව.
> - එබඳු පුණ්‍ය ක්‍රියා පිළිබඳ කාව්‍යශේඛරය නම් මහාකාව්‍යයෙහිද සඳහන් බව.

**පියවර 10.1.2 :**

- පන්තියේ සිසුන් සීල, සමාධි , ප්‍රඥා යනුවෙන් කුඩා කණ්ඩායම් තුනකට බෙදන්න.
- ඇමුණුම 10.1.2ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකා , ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- ඇමුණුම 10.1.3ට අදාළ කාව්‍යශේඛරයේ පද්‍ය දෙක ලියූ පත්‍රිකා පිටපත් තුනක්
- කුඩා කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

**පියවර 10.1.3 :**

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඌන පූරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා හා අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

---

- කාව්‍යශේඛරයෙහි අදාළ පද්‍ය මගින් පින්කිරියවත් දොළහක් කියැවෙන බව.
- ඒවා පහත සඳහන් බව.
  - දන්දීම, සිල් රැකීම, භාවනා කිරීම, පින්දීම, පින් අනුමෝදන් වීම, දහම් ඇසීම, ධර්ම දේශනා කිරීම, පිදිය යුතු අය පිදීම, වත් පිළිවෙත් කිරීම, පින්කම් වර්ණනා කිරීම, තෙරුවන් සරණයාම, බුද්ධාදී උතුමන්ගේ ගුණ සිහි කිරීම.
- බෞද්ධ ධර්ම ග්‍රන්ථවල නිතර සඳහන් වන දස පින් කිරියවතක් ඇති බව.එහි ඉහත කී පින්කම් දොළසෙහි ඇතුළත් පින්කරු ගුණ වැනීම,තෙරුවන් සරණයාම,බුද්ධාදී උතුමන්ගේ ගුණ සිහි කිරීම යන පින්කම් ඇතුලත් නොවන අතර දැක්ම නිවැරදි කර ගැනීම ( දිට්ඨිජු ) ඇතුළත් වන බව.
- ඉහත සංඛ්‍යාත්මක පින්කිරියවත් හැර තමන්ටත් , අනුන්ටත් දෙපිරිසටමත් යහපත සැලසෙන ක්‍රියා පුණ්‍ය ක්‍රියා ලෙස බුදු දහමෙහි සැලකෙන බව.
- එබඳු පුණ්‍ය ක්‍රියා නිවැරදිව, සැලසුම් සහිතව සිදු කිරීමට ප්‍රඥා සම්පන්න විය යුතු බව.
- තම ජීවිතයෙහි සෑම අවස්ථාවකදීම පිංකළ යුතු බව.

---

## තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- කාව්‍යශේඛරමහාකාව්‍යයට අනුව පින්කිරියවත් විස්තර කරයි.
- පිංකම්වල යෙදීම නිවැරදි පිළිවෙත් අනුව අවබෝධයෙන් කළ යුතු බව පිළිගනියි.
- පිංකම් කරයි.
- කරන සෑම ක්‍රියාවකම නිවැරදිව යෙදෙයි.
- සමාජයට හිතකර කටයුතු සැලසුම් කරයි.

ඇමුණුම 10.1.1

### උපුටාගත් ගීත ඛණ්ඩය

බුදු හාමුදුරුවො අපිත් දකින්නැති
බණත් අහන්නැති ඒ කාලේ
නිවන් දකින්නට පිං මදිවෙන්නැති
ඒකයි තවමත් සංසාරේ



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 10.1.2

## කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්

) ඇමුණුම 10.1.3ට අදාළ "පින් කිරියවත් " ඇතුළත් කවි දෙක පිළිබඳ අවධානය යොමු කරන්න.

) එම කවිවලින් කියැවෙන පින් කිරියවත් කණ්ඩායම් අතර සමව බෙදාගෙන ඔබ කණ්ඩායමට ලැබෙන පින් කිරියවත් හතරට අදාළ පිංකම් සිදු කිරීමේදී වර්තමානයෙහි අනුගමනය කැරෙන ඔබ දන්නා පිළිවෙත් සටහන් කරන්න.

) වර්තමානයෙහි පින්කම් කිරීමේදී පවත්නා අඩුපාඩු පෙන්වා දෙමින් ඒවා මගහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න.

) පාසලෙහි ධර්ම දේශනා පිංකමක් සිදුකිරීම සඳහා සැලැස්මක් සකස් කරන්න.

) කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 10.1.3

## පින් කිරියවත්

1. දන්සිල් භාව නා
   පින්දෙනු අනුමෝද නා
   බණසනු දේස නා
   පිදිය යුත්තන් පුදනු සමනා

2. කරනු ද වතාවත්
   පින්කරු ගුණ වැනී මත්
   සරණ සිහිවී මත්
   දොළොස් පින් දැන කරනු යාපත්

(කාව්‍යශේඛරය)

# 7 . 3 තක්සේරුව හා ඇගයීම

## 7.3.1 හැඳින්වීම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මඟින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩසටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම හඳුන්වා දිය හැකිය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සියලු ම සිසුනට අදාළ නිපුණතා සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාව වත් ලබා ගැනීම අපහසු නොවේ. අනෙක් අතට ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමය.

තක්සේරුකිරීමේ යෙදී සිටින ගුරුවරුනට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය හා ඉදිරිපෝෂණය යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ නිපුණතා අතරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක ක්‍රියාකාරකම් දිශාභිමුඛ කර ගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථවත් කරගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම, ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාව ඉගෙනුම හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දී සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරුකරණයටත් ක්‍රියාකාරකම්වල තුන් වැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණපා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශි වී තිබෙන දැනුම, ආකල්ප හා කුසලතා මූලික කොට සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුනට අත දේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්තිකාමරය තුළ සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ගොඩ නැගීම තහවුරු කිරීමටත් ඇගයීම යටතේ එසේ ගොඩ නගා ගත් චර්යා ප්‍රමාණ කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙළ වැඩිදියුණු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. මෙසේ ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා මුලින්ම කළ යුත්තේ ක්‍රියාකාරකම් සන්තතියට ඇතුළත් ක්‍රියාකාරකම්, කාණ්ඩ කිහිපයකට වෙන්කර ගැනීමයි. සිසු ඉගෙනුම විකසිත කළ හැකි ප්‍රභේද කිහිපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කර ගනිමින් දෙවනුව හඳුනා ගත යුතුයි. තෝරාගත් ප්‍රභේද පදනම් කර ගෙන ගුරුවරයාට හා සිසුන්ට උපදෙස් ඇතුළත් වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කෙරෙන උපකරණ සකසා ගැනීම ඊළඟ පියවර වන අතර සෑම ක්‍රියාකාරකම් කාණ්ඩයක් ආරම්භයේ දී ම මෙම උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්ය යි. මේ අනුව ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරුවරයෙකුට යොදා ගත හැකි ප්‍රභේද කිහිපයක් මතු දැක් වේ.

- සංකල්ප සිතියම්
- බිත්ති පුවත්පත්
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
- ප්‍රශ්න සහ පිළිතුරු පොත්
- ශිෂ්‍යය කාර්ය සාධන ගොනු
- සිසු නිර්මාණ ප්‍රදර්ශන
- විවාද
- සාකච්ඡා මණ්ඩල
- සම්මන්ත්‍රණ
- ක්ෂණික කථා
- භූමිකා රංගන
- සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම
- ක්ෂේත්‍ර පොත් / ස්වභාව අධ්‍යයන දින පොත් / සාධු චර්යා පුස්තක.
- ප්‍රායෝගික පරීක්ෂණ

පාඨමාර්ගයේ තුන්වන කොටස යෝජිත ඉගෙනුම හා ඉගැන්විම දීර්ඝ කිරීමේ අවස්ථා හා ඒ සඳහා තෝරා ගෙන ඇති උපකරණ හඳුන්වා දීමට සැලසුම්කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් තක්සේරුව හා ඇගයීම දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පුළුල් වන අතර අභිරුචියෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමේ නියැලීමට සිසුනට හැකි වේ.

## 7.3.2 ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ

පාසලේ පන්ති කාමරයෙහි කැරෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙන් ඔබ්බට ඉගෙනුම් ලාභියා රැගෙන යාම මෙහි අදහසයි. ගෙදර වැඩ, පැවරුම් යන නම් වලින් මෙතෙක් සිදු කෙරුණු මේ ක්‍රියාවලිය ඊට වඩා සැලසුම් සහගත ගවේෂණාත්මක කාර්යයකි. ගුරුභවතා විසින් විෂය නිර්දේශය මැනවින් අධ්‍යයනය කර වාරයකට එකක් වන සේ සැලසුම් කළ යුතුය. බුද්ධ ධර්ම විෂයයට සතියකට කාලච්ඡේද දෙකක් පමණක් ලැබී ඇති නිසා වාරයට එක් ඉගෙනුම් උපකරණයක් ප්‍රමාණවත්ය. ඉගෙනුම්ලාභීන් තුළ ඇති කිරීමට අපේක්ෂිත දැනුම, ආකල්ප, කුශලතා පැහැදිලි ව හඳුනාගත යුතු ය. ලිඛිත පරීක්ෂණයක නීරසභාවයට වඩා ප්‍රබෝධාත්මක උපකරණ ලෙස බිත්ති පුවත් පත්, ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ ආදිය යොදා ගැනීමට උනන්දු විය යුතුය.

ඉගැන්වීම දීර්ඝ කිරීමේ උපකරණයක් සකස් කර ගැනීමට නිපුණතා, නිපුණතා මට්ටම් කිහිපයක් එක්කර ගත යුතුය.

ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ

1. පාසල් වාරය හා උපකරණ අංකය : පළමු වාරය 01

2. ආවරණය කැරෙන නිපුණතා මට්ටම් : 2.1, 2.2, 3.1

3. ආවරණය කැරෙන විෂය සන්ධාරය :
   - බුදු සිරිතෙන් මූර්තිමත් වන කළ ගුණ සැලකීම
   - අසරණ සරණ වීම.
   - බෞද්ධ සිරිත් විරිත්
   - ආචාර ධර්ම

4. උපකරණයේ ස්වභාවය :
   - බිත්ති පුවත් පතක්

5. උපකරණයේ අරමුණු :
   - බෞද්ධ ආචාර ධර්ම බුදු සිරිත ඇසුරින් සොයා බලයි.
   - ආචාර ධර්ම ජීවිතයට අත්‍යවශ්‍ය බව පිළිගනියි.
   - ආචාර ධර්ම මූර්තිමත්වන අවස්ථා ගද්‍යයට පද්‍යයට ,සිතුවමට නඟයි.
   - ආදර්ශවත් ජීවිතයක් ගත කරයි.
   - යහගුණ පිරි සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :
   - උපකරණය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න
   - ක්‍රියාකාරකම තනිව හෝ සාමූහිකව හෝ සිදුකරන්නේදැයි දැනුවත් කරන්න.
   - අවශ්‍ය නම් කණ්ඩායම් කරන්න. බිත්ති පුවත්පතෙහි සැලැස්ම ලබා දෙන්න.
   - ගවේෂණ සම්පත් නම් කරන්න. නිමැවුම භාරදිය යුතු අවසාන දිනය නියමකර වරින් වර අධීක්ෂණය කරමින් සටහන් තබන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**සිසුන්ට උපදෙස්** :

- නිර්මාණය කිරීමට අදාළ බිත්ති පුවත්පතේ ආකෘතිය ගුරුතුමා හෝ ගුරුතුමිය වෙතින් ලබාගන්න.
- නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනයෙහි යෙදෙන්න.
- අදාළ කරුණු සටහන් කර ගන්න.
- කණ්ඩායම් සමඟ එක්ව කරුණු ගොනු කරන්න.
- තම ජීවිතයේ දි හා සමාජයේ දී ක්‍රියාත්මක කළ හැකි තොරතුරු ඇතුළත් බිත්ති පුවත් පතක් සකස් කරන්න.

**ගවේෂණය සඳහා උපකාරී නිර්දිෂ්ට ග්‍රන්ථ :**

බුද්ධ චරිතය - බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි

බුදුහාමුදුරුවෝ - ගනේගම සරණංකර නාහිමි

සම්බුදු සිරිත - කෝ.ඩී. පී. වික්‍රමසිංහ

ඇගයීම් ක්‍රමය.

| නිර්ණායක / කණ්ඩායම් අංකය. | උපදෙස් පිළිපැදීම. | කරුණු රැස් කිරීමේ උපක්‍රම. | තොරතුරු වල නිරවද්‍යතාව. | කණ්ඩායම් සහයෝගය. | නිමැවුම නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම. | වෙනත් සටහන්. | අධීක්ෂක අදහස. |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| තත්ත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | හතරයි |
| මධ්‍යස්ථයි | දෙකයි |
| සංවර්ධනය විය යුතුයි | එකයි. |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.